# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

01

## ව්‍යාපාර පදනම හා ව්‍යාපාර පරිසරය

1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

01. මිනිස් අවශ්‍යතා හා වුවමනාවලට අදාළව පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කවරක්ද ?

(1) අවශ්‍යතා අසීමිතයි - වුවමනා සීමිතයි.
(2) අවශ්‍යතා පුද්ගල බද්ධ වේ. - වුවමනා පුද්ගල බද්ධ නොවේ.
(3) අවශ්‍යතා ව්‍යාපාරිකයාට නිර්මාණය කළ නොහැක - වුවමනා නිර්මාණය කළ හැකියි.
(4) අවශ්‍යතා සඳහා විකල්ප ඇත.- වුවමනා සඳහා විකල්ප නැත.
(5) අවශ්‍යතා ප්‍රාථමිකයි - වුවමනා තෘතියිකයි.

02. ව්‍යාපාර වල විකාශනයේ විවිධ අදියර හා එම එක් එක් අදියරයට අදාළ සුවිශේෂී සිදුවීම් පහත දැක්වේ.

| **අදියර** | **සිදුවීම්** |
|---|---|
| 1. භාණ්ඩ හුවමාරුව | A අවකාශ වෙළෙඳපොළ |
| 2. කාර්මික විප්ලවය | B වෙළෙඳාමේ ආරම්භය |
| 3. මුදල් භාවිතය | C උපකාරක සේවාවල ආරම්භය |
| 4. තොරතුරු ආර්ථිකය | D මහා පරිමාණ නිෂ්පාදනය |

ඒ ඒ අදියරට අදාළ සුවිශේෂී සිදුවීම් නිවැරදිව දක්වන වරණය වනුයේ කුමක්ද ?

(1) 1A 2C 3D 4B
(2) 1C 2A 3D 4B
(3) 1C 2D 3A 4B
(4) 1C 2D 3B 4A
(5) 1B 2C 3D 4A

03. පහත වගුවේ X හා Y වලින් පිළිවෙලින් නිෂ්පාදන අංශ හා ඒවායේ උප අංශ දැක්වේ.

| X | Y |
|---|---|
| A කෘෂි කර්මාන්තය | 1. ධීවර කර්මාන්තය<br>2. වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන |
| B කර්මාන්ත | 3. පතල් හා කැනීම්<br>4. නවාතැන් හා ආහාරපාන සැපයීම |
| C සේවා | 5. විදුලිය,ගෑස් හා වායු සමීකරණ<br>6. තැපැල් හා කුරියර් සේවා |

X හා Y නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුරු වනුයේ,

(1) A 1,3 B 2,6 C 4,5
(2) A 1,3 B 2,4 C 5,6
(3) A 1,3 B 2,6 C 4,5
(4) A 1,2 B 3,5 C 4,6
(5) A 1,4 B 2,3 C 5,6

04. පහත දැක්වෙන්නේ ඍජු හා වක්‍ර නිෂ්පාදන අවස්ථා සඳහා උදාහරණ කිහිපයකි.

A. ගෘහණියක් තම ගෙවත්තේ වගාකරන පලාවර්ග දිනපතා නිවසේ පාරිභෝජනයට යොදාගනී.
B. කුඩා ගොවිපලක් පවත්වාගෙන යන නිමල් ඉන් ලැබෙන බිත්තර අසල පිහිටි සිල්ලර කඩයට ලබා දේ.
C. රස කැවිලි නිෂ්පාදනයේ යෙදෙන මිහිරි උත්සව සඳහා රසකැවිලි සැපයීමට ඇණවුම් භාරගනී.

D. හේන් ගොවිතැනෙහි යෙදෙන සරණපාලගේ බිරිඳ බඩ ඉරිඟු කරල් තම්බා නිවස ඉදිරිපිට තබා අලෙවි කරයි.
E. කමලා තම දියණිය වෙනුවෙන් නිවසේ ඇඳුම් මසයි.

ඉහත අවශ්‍යතාවලියේ වක්‍ර නිෂ්පාදනවලට පමණක් අදාල උදාහරණ ඇතුළත් පිළිතුර කුමක්ද ?

(1) A , B ,C
(2) B, D, E
(3) A, C, D
(4) B, C, E
(5) B, C, D

05. පහත දැක්වෙනුයේ මිනිස් අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ කිහිපයකි.

| | |
|---|---|
| A අසීමිත වීම | D විවිධ වීම |
| B සැමට ම පොදු වීම | E අත්‍යවශ්‍ය වීම |
| C නිර්මාණය කළ හැකි වීම | F සීමිත වීම |

ඉහත දෑ අතුරින් මිනිස් වුවමනා වලට පමණක් අදාළ ලක්ෂණ අඩංගු කාණ්ඩය වන්නේ.

(1) A B C (2) A C D (3) A E F (4) A C E (5) B C D

06. පහත දැක්වෙන අවශ්‍යතා හා වුවමනා අතුරින් වුවමනා පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) විදුලිය, මුව ආවරණ, ප්‍රවාහනය, රක්ෂණය
(2) අන්තර්ජාල පහසුකම්, සෞඛ්‍යය, ප්‍රවාහනය, විදුලිය
(3) රක්ෂණය, අන්තර්ජාල පහසුකම්, මුව ආවරණ, ගුවන් විදුලිය
(4) රක්ෂණය, විදුලිය, අන්තර්ජාල පහසුකම්, වින්දනය
(5) විදුලිය, සෞඛ්‍යය, ප්‍රවාහනය, රක්ෂණය

07. ආර්ථිකයේ විවිධ අංශ වලට අයත් ව්‍යාපාර කටයුතු කිහිපයක් පහත දැක්වේ.ඒවා අතුරින් සේවා අංශයට පමණක් අයත් ව්‍යාපාර කටයුතු දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) රාජ්‍ය පරිපාලනය හා ජාතික ආරක්ෂාව
(2) ගෘහ කර්මාන්ත හා ප්‍රතිචක්‍රීයකරණය
(3) කසළ කලමණාකරණය හා සමාජ ආරක්ෂාව
(4) තේ ආශ්‍රිත නිමවුම් හා මූල්‍ය රක්ෂණය
(5) ඉදිකිරීම් කර්මාන්ත හා සමාජ ආරක්ෂිත සේවා

08. පහත සඳහන් දෑ අතුරෙන් ව්‍යාපාර ගති ලක්ෂණ පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

A. ගනුදෙනු අඛණ්ඩව සිදුවීම
B. මිල දී ගැනීමේ කටයුතු
C. පර්යේෂණ හා සංවර්ධන කටයුතු
D. භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම
E. වුවමනා නිර්මාණය කිරීම
F. වෙළඳපොළ කොටස වැඩිකර ගැනීම
G. අවදානමක් පැවතීම

(1) ABDE (2) BDEG (3) ADEG (4) ACDG (5) DEFG

09. පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරය හා සම්බන්ධ වගන්ති කිහිපයක් වේ.

A. බාහිර පරිසර බලවේගයන් තුළ සේවකයන් ප්‍රධාන වේ.
B. ව්‍යාපාරයට බලපෑම් කරන පීඩන කණ්ඩායම් අභ්‍යන්තර පරිසරයට අයත් නොවේ.
C. අභ්‍යන්තර පරිසරය තුළින් තර්ජන ද,බාහිර පරිසරය තුළින් ශක්තීන් ද හඳුනාගත හැක.
D. සාර්ව පරිසර බලවේගයක් ලෙස රජයට මුල් තැනක් හිමි වේ.
E. ව්‍යාපාර බාහිර පරිසරයේ කොටසක් ලෙස සාර්ව පරිසරය හැඳින්විය හැකිය.

ඉහත වගන්ති අතුරින් නිවැරදි වගන්ති ඇතුලත් පිළිතුර වන්නේ,

(1) A, C, හා E
(2) A ,B හා D
(3) B , C හා E
(4) B , D හා E
(5) C , D හා E

10. ව්‍යාපාරයක යෙදවුම් ,නිමවුම් ක්‍රියාවලිය නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
(1) යෙදවුම් → ව්‍යාපාර කාර්යයන් → නිමවුම
(2) යෙදවුම් → කළමනාකරණ ක්‍රියාවලිය → නිමවුම
(3) යෙදවුම් → පරිවර්තන ක්‍රියාවලිය → නිමවුම්
(4) යෙදවුම් → මෙහෙයුම් ක්‍රියාවලිය → නිමවුම්
(5) යෙදවුම් → නිෂ්පාදන ක්‍රියාවලිය → නිමවුම්

හිස්තැන් පුරවන්න.

1. මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන වෙළෙඳපොළට ඉදිරිපත් කරන ඕනෑම දෙයක්.................වන අතර ඒවා ප්‍රධාන වශයෙන් ...........................හා සේවා ලෙස වර්ග කළ හැකිය.

2. හිඟ සම්පත් භාවිතයෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු වල නිරත වීම හේතුවෙන් ව්‍යාපාර අත්‍යවශයෙන් ම .......................වේ.

3. භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේ දී යොදාගන්නා සම්පත්වල ස්වරූපය වෙනස් කිරීම මගින් ඇතිවන අගය වැඩිවීම.....................ලෙස හැඳින්වේ.

4. අන්තර්ජාලය හරහා මිල දී ගැනීමේ හා විකිණීමේ කටයුතු කිරීම................................වන අතර ව්‍යාපාරවලට අදාළ සියලුම කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම............................වේ.

5. නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැණීම් කර්මාන්තය........................අයත්වන අතර කර්මාන්ත මූලා අනුව වර්ග කිරීමේ දී පතල් හා කැණීම් කර්මාන්තය......................අයත් වේ.

6. පුද්ගල විශේෂීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ..........................ඇති වූ අතර ඒ නිසාම ..........................සිදු විය.

7. ව්‍යාපාර විකාශනයේ මුල්ම අවස්ථාව..........................ක්‍රමය වූ අතර ඒ සමඟ.......................පැන නැගුණි.

8. ව්‍යාපාර බාහිර පරිසරයට අයත් ව්‍යාපාරයට බලපෑම් ඇති කරන සුවිශේෂී සංවිධාන හෝ කණ්ඩායම්......................ලෙස හැඳින්වෙන අතර ව්‍යාපාරයක පුළුල් වටපිටාව සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම්..............................ලෙස හැඳින්වේ.

9. ව්‍යාපාරික සැලසුම් සකස් කිරීම හා තීරණ ගනු ලබන පාර්ශ්වය..............................වන අතර ඉහළ කලමනාකරුවන් විසින් සකසන සැලසුම් හා ගනු ලබන තීරණ අනුව පහළ මට්ටම්වල අදාළ කාර්යයන්හි නිරත පාර්ශව............................වේ.

## II කොටස

1. පහත සඳහන් වන්නේ ඔබගේ අවශ්‍යතා ඉටුකරනු ලබන ව්‍යාපාර දෙකකි.

   බේකරි නිෂ්පාදන ව්‍යාපාරයක්
   නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයක්

   මෙම ව්‍යාපාර කෙරෙහි ඔබගේ අවධානය යොමු කර පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

   (1) එම ව්‍යාපාර මගින් ඉටු කරනු ලබන මිනිස් අවශ්‍යතා මොනවාද ?

   (2) එම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා එම ව්‍යාපාර මගින් ඔබට සපයනු ලබන දෑ මොනවාද ?

2. ව්‍යාපාරයක් යන්න අර්ථ දක්වන්න.
3. අවශ්‍යතා හා උවමනා අතර වෙනස්කම් දක්වන්න.
4. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දක්වන්න.
5. ව්‍යාපාරයක ගති ලක්ෂණ මොනවාද ?
6. ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු දෙක නම් කරන්න.
7. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබාගනුයේ වෙළෙඳපොලෙන් බව තහවුරු කරන්න.
8. භාණ්ඩ හුවමාරු යුගයේ සිට අද දක්වා මුදල් භාවිතයෙහි ඇති වූ ක්‍රමික විකාශනය නිදසුන් සහිතව පෙළ ගස්වන්න.
9. ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා හතර නම් කරන්න.
10. ව්‍යාපාර වර්ග කළ හැකි නිර්ණායක හතරක් සඳහන් කරන්න.
11. ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් නිමවුම් ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් දක්වන්න.
12. ඔබ ප්‍රදේශයේ පවතින ඇඳුම් මසා අලෙවිකරන ආයතනයක් නිදසුන් ලෙස ගෙන එම ව්‍යාපාර කෙරෙහි උනන්දුවන පාර්ශ්වයන් නම් කරන්න .
13. රජය හා ප්‍රජාව එම ව්‍යාපාර කෙරෙහි උනන්දු වන්නේ ඇයි?

14. ව්‍යාපාර විසින් සම්පූර්ණ කරනු ලබන විවිධ පුද්ගල අවශ්‍යතා මොනවාද?

15. ව්‍යාපාර පරිසර සාධක ගැලීම් සටහනකින් දක්වන්න.

16. ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධකයක් වන සංවිධාන සංස්කෘතිය හඳුන්වා ඒ හා බැඳුණු ශක්තීන් හා දුර්වලතා දෙක බැගින් දක්වන්න.

17. සාර්ව පරිසර බලවේගයන් වන ආර්ථික පරිසරයට අයත්වන ආර්ථික සාධක නම් කරන්න.

18. සාර්ව පරිසර බලවේග වලට අයත් සමාජ හා සංස්කෘතික පරිසරයට අයත් කරුණු දක්වන්න.

19. ස්වභාවික පරිසරයේ ඇතිවන වෙනස්කම් ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන්නේ කෙසේද?

20. බොහෝ විට සාර්ව පරිසර බලවේග ආසන්න පරිසර බලවේග කෙරෙහි අවස්ථා හෝ තර්ජන මතු කරයි. නිදසුන් දක්වන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

02

## ව්‍යාපාර පරිසරය

**I කොටස**

1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

1. සෞඛ්‍ය පහසුකම් සැලසීම තුළින් ව්‍යාපාර විසින් සමාජීය වගකීම් ඉටු කරනු ලබන පාර්ශවය කුමක්ද?

   (1) රජය (2) සමාජය (3) ගනුදෙනුකරුවන්
   (4) සේවකයන් (5) අයිතිකරුවන්

2. "ව්‍යාපාර සමාජයට ආපසු දෙන දෑ" සමාජීය වගකීමකි යනුවෙන් නිර්වචනය ඉදිරිපත් කළ රට කුමක්ද ?

   (1) ඉන්දියාව (2) අමෙරිකා එක්සත් ජනපදය (3) ජපානය
   (4) පිලිපීනය (5) කැනඩාව

3. තිරසර සංවර්ධනය ළඟාකර ගැනීම තුළින් අත්වන හිතකර ප්‍රතිඵල හා සංකල්ප නිවැරදිව දැක්වෙන්නේ,

   (1) දැරිය හැකි බව = සමාජ තිරසාර සංවර්ධනය + ආර්ථික පරිසර සංවර්ධන
   (2) සමානාත්මතාව = සමාජ තිරසාර සංවර්ධනය + පාරිසරික තිරසර ආයෝජනය
   (3) ජීවත්විය හැකි බව = පාරිසරික තිරසර ආයෝජනය + ආර්ථික තිරසර සංවර්ධනය
   (4) තිරසර බව = ආර්ථික තිරසර සංවර්ධනය + සමාජ තිරසාර සංවර්ධනය
   (5) සංවර්ධනය = පාරිසරික තිරසර ආයෝජනය + ආර්ථික තිරසර සංවර්ධනය

4. ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

   (1) අපද්‍රව්‍ය කළමනාකරණය
   (2) මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම
   (3) සාධාරණ තරඟකාරීත්වය
   (4) ජනතාවට සමාන අවස්ථා සැලසීම
   (5) ජෛව විවිධත්වය සුරැකීම.

5. ව්‍යාපාර තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදීම සඳහා පිළිපැදිය යුතු වඩාත් ගැළපෙන ආචාරධර්මය වන්නේ,

(1) ගිණුම්කරණයට අදාළ ආචාරධර්ම
(2) මානව සම්පත් කළමනාකරණ ආචාරධර්ම
(3) අලෙවිකරණයට අදාළ ආචාරධර්ම
(4) පරිසර සුරැකීමේ ආචාරධර්ම
(5) ගනුදෙනුකරුවන්ට අදාළ ආචාරධර්ම

6. හොඳ පුරවැසියන් පිළිපැදිය යුතු ආචාරධර්ම හා ඊට අදාළ පාර්ශ්ව පහත දැක්වේ.

| | ආචාරධර්ම | පාර්ශ්ව |
|---|---|---|
| 1. | උපකාර කිරීම | A පොදු ස්ථාන |
| 2. | අන්‍යයන්ට ගරු කිරීම | B වැඩිහිටියන් |
| 3. | විනීතව හැසිරීම | C පාසල |
| 4. | ගුරුවරුන්ට ආචාර කිරීම | D ආගමික ස්ථාන |

ඉහත දැක්වෙන ආචාරධර්ම භාවිතා කළයුතු වන්නේ කවර පාර්ශ්ව උදෙසාද යන්න නිවැරදිව දැක්වෙන වරණය,

(1) A, B, C, D (2) A, C, B, D (3) B, A, D, C
(4) B, D, A, C (5) C, A, B, C

7. ව්‍යාපාරයක් විසින් සිය ඇල්මැති පාර්ශ්වයන්ට සමාජ වගකීම් ඉටු කරන ආකාරයන් පහත වගුවේ දැක්වේ.

| ඇල්මැති පාර්ශ්වය | සමාජ වගකීම් |
|---|---|
| 1. සමාජය | A. ආර්ථික ප්‍රතිලාභ |
| 2. අයිතිකරුවන් | B. වෙනත් පහසුකම් |
| 3. සේවකයන් | C. ගුණාත්මක නිෂ්පාදිත |
| 4. ගනුදෙනුකරුවන් | D. පරිසර හිතකාමී කටයුතු |

ඉහත ඇල්මැති පාර්ශ්ව සඳහා ඉටුකළ යුතු සමාජ වගකීම් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක්ද ?

(1) A, B, D, C (2) A, D, B, C (3) C, B, D, A
(4) C, D, A, B (5) D, A, B, C

8. තිරසර සංවර්ධන මූලිකාංග හා ඊට අදාළ ක්‍රියාකාරකම් නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

| | තිරසර සංවර්ධන මූලිකාංග | ක්‍රියාකාරකම් |
|---|---|---|
| (1) | ආර්ථික | ද්‍රව්‍ය සුරක්ෂිත භාවිතය |
| (2) | පාරිසරික | නවෝත්පාදන හඳුන්වාදීම |
| (3) | සමාජ | ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම |
| (4) | ආර්ථික | මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම |
| (5) | පාරිසරික | සමාජ ඒකාග්‍රතාව ඇති කිරීම |

9. අපද්‍රව්‍ය එකතුවීම ගෝලීය ප්‍රශ්නයක් බවට පත්වීම නිසා භාවිතය අඩු කිරීම (Reduce) සඳහා සුදුසු නිදසුනක් ඇතුළත් වරණය කුමක්ද?
   (1) මොරටු ලී බඩු ආයතනය ගලේවෙල ප්‍රදේශයේ තේක්ක වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
   (2) භාණ්ඩ ඇසුරුම් සඳහා පොලිතීන් භාවිතයෙන් වැලකීම.
   (3) හම්බන්තොට කාර්මික ජනපදයේ පිදුරුවලින් කඩදාසි නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් චීන - ශ්‍රී ලංකා ආයෝජනයකින් ඇරඹීම.
   (4) පරිසර හිතකාමී කෑම පෙට්ටි නෙළුම් කොළවලින් නිපදවීම.
   (5) අබලි යකඩ මිලට ගෙන එකතු කර ඉන්දියාවට අපනයනය කිරීම.

10. සමාජ වගකීම් ඉටුකිරීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ පිළිබඳව නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය කුමක්ද?
   (1) ආර්ථික තිරසර සංවර්ධනය ළඟා කර ගත හැකිවීම.
   (2) යටිතල පහසුකම් සංවර්ධනයට අවධානය යොමු කිරීම.
   (3) ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකිවීම.
   (4) මානව අයිතිවාසිකම් සුරැකිය හැකිවීම.
   (5) පාරිසරික නීති රීතිවලට අනුගතව කටයුතු කළ හැකිවීම.

## II කොටස

1. (1) අපේ රටේ සෞඛ්‍ය සේවාව සඳහා රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ දායකත්වය ඉතා වැදගත් වේ.

   (අ) පෞද්ගලික රෝහලක් විසින් තම සේවකයින්ට සහ රෝගීන්ට ඉටු කරනු ලබන සමාජ වගකීම් දෙක බැගින් ලියන්න.

   (ආ) එම සමාජ වගකීම් ඉටු කිරීමෙන් රෝහලට අත්වන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

(2) වර්තමාන පරපුර තම අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමේදී අනාගත පරම්පරාවේ අවශ්‍යතා හා වුවමනා කෙරෙහි අවධානය යොමු කළ යුත්තේ ඇයි ? පැහැදිලි කරන්න.

(3) (අ) ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා දායක විය හැකි ආකාර පෙන්වා දෙන්න?
   (ආ) අපද්‍රව්‍ය කළමනාකරණයේදී භාවිතා කරන 4 R සංකල්පය නම් කරන්න.

(4) ව්‍යාපාර කටයුතු වලින් පාරිභෝගිකයන්ට හා පරිසරයට ඇතිවන අහිතකර බලපෑම්වලට නිදසුන් දෙක බැගින් ලියන්න.

(5) පාරිභෝගිකයෙකු විසින් නැවත නැවත භාවිතා කිරීම (Reuse) සිදුකරන භාණ්ඩයකට නිදසුනක් දක්වා එයින් ලැබෙන ප්‍රතිලාභ තුනක් ලියන්න.

2. (1) (අ) පාරිභෝගිකයෙකුට තිරසර සංවර්ධනයට දායකවිය හැකි ආකාර හතරක් ලියන්න.

(ආ) වර්තමානයේ ඇල්මැති පාර්ශ්වයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇති කරන බලවේග සඳහා නිදසුන් හතරක් සඳහන් කරන්න.

(2) ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම් හතරක් නම් කර ඒවා අවම කර ගැනීමට අනුගමනය කළයුතු යෝජනා හතරක් ඉදිරිපත් කරන්න.

(3) (අ) ව්‍යාපාර ආචාර ධර්ම යනු කුමක්ද?
(ආ) ව්‍යාපාරවලින් සිදුවන හොඳ හා නරක දෑ සඳහා නිදසුන් දෙක බැගින් ලියන්න.

(4) (අ) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත්විය යුතු සාධක ලැයිස්තුගත කරන්න.
(ආ) ප්‍රතිචක්‍රීකරණය සිදුකළ හැකි ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

(5) පාසල් ශිෂ්‍යයෙකු / ශිෂ්‍යාවක වන ඔබ විසින් පාසලේදී සිදුකරනු ලබන යහපත් දේවල් හතරක් ලියන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන හා ..

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

③

## රජය හා ව්‍යාපාර

1 සිට 7 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

1. ව්‍යාපාරවලට බලපෑම් කරන රජයේ ආයතන X තීරුවේද රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය Y තීරුවේද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. මධ්‍යම රජය | A. පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම. |
| 2. පළාත් සභාව | B. අපද්‍රව්‍ය ඉවත් කිරීම. |
| 3. පළාත් පාලන ආයතන | C. විදුලි බලය සැපයීම |
| | D. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම |
| | E. තනිපුද්ගල ව්‍යාපාර ලියාපදිංචිය |
| | F. පෞද්ගලික බස්රථ නියාමනය |

X හා Y තීරුවල ඇති කරුණු නිවැරදිව ගැලපූ වරණය කුමක්ද ?

1) 1 - AE, 2 – BC, 3 – DF
2) 1 - AB, 2 – CD, 3 – EF
3) 1 - AC, 2 – EF, 3 – BD
4) 1 - AC, 2 – BD, 3 – EF
5) 1 - AD, 2 – BE, 3 – CF

2. පහත සඳහන් බදු අතුරින් ඍජු බදු පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද ?

A. ආදායම් බදු
B. ප්‍රාග්ධන ලාභ බදු
C. එකතුකළ අගය මත බදු
D. රඳවා ගැනීමේ බදු
E. නිෂ්පාදන බදු
F. රේගු බදු

1) ABC 2) ABD 3) BCD
4) ACE 5) DEF

3. රජයේ අභ්‍යන්තර ස්ථායිතාවය සිදුකෙරෙන පරිදි ස්ථාවරව පවත්වාගෙන යා යුතු වන්නේ කුමක්ද ?
   1) පොළී අනුපාතය
   2) මිල මට්ටම්
   3) රජයේ වියදම්
   4) විනිමය අනුපාත
   5) රජයේ බදු ප්‍රතිපත්තිය

4. රජයක ආර්ථික අරමුණු දැක්වෙන කාණ්ඩය තෝරන්න.
   A. ආර්ථික වර්ධනය හා සංවර්ධනය
   B. පූර්ණ සේවා නියුක්තිය
   C. බදු ගෙවීම
   D. නීතිරීති පිළිපැදීම
   E. යහපත් අන්තර්ජාතික වෙළෙඳාම
   F. සේවා නියුක්තියට දායකවීම.

| | | |
|---|---|---|
| 1) ABC | 2) ABE | 3) ADC |
| 4) ABF | 5) BEF | 6) |

5. රජයේ වර්තන වියදම් පමණක් දැක්වෙන කාණ්ඩය තෝරන්න.
   1) විදුලිය, වැටුප්, ඉන්ධන, දුරකථන
   2) විදුලිය, ගොඩනැගිලි ඉදිකිරීම්, වැටුප් ගෙවීම්, දුරකථන
   3) ගොඩනැගිලි ඉදිකිරීම්, පාලම් ඉදිකිරීම්, වාහන මිලදී ගැනීම්, මහාමාර්ග ඉදිකිරීම්
   4) විදුලිය, වැටුප්, වාහන මිලදී ගැනීම්, ගොඩනැගිලි ඉදිකිරීම්
   5) ගොඩනැගිලි ඉදිකිරීම්, පාලම් ඉදිකිරීම්, වැටුප් ගෙවීම්, දුරකථන

6. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් පාරිභෝගික වගකීම් දැක්වෙන කාණ්ඩය තෝරන්න.
   A. විචාරාත්මක දැනුවත්භාවය
   B. කාර්යක්ෂමතාව
   C. සහයෝගිතාව
   D. සක්‍රීය සහභාගිත්වය
   E. පරිසරය පිළිබඳ සැලකිලිමත්වීම.
   F. සාධාරණ වීම.

| | | |
|---|---|---|
| 1) ABC | 2) BCD | 3) CDE |
| 4) ACE | 5) ADE | 6) |

7. ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන ආයතන දැක්වෙන කාණ්ඩය තෝරන්න.
   A. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
   B. සුරාබදු දෙපාර්තමේන්තුව
   C. විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව
   D. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| 1) AB | 2) BC | 3) CD |
| 4) AD | 5) AC | |

ප්‍රශ්න අංක 8 සිට 160 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න

8. රටක සමස්ත ................ ඒ රටේ වෙසෙන සමස්ත .............. අතර සමානව බෙදා හැරීම සාධාරණ ආදායම් ව්‍යාප්තියයි.

9. අභ්‍යන්තර මිල .............. තුළින් උද්ධමනය පාලනය කර මිල මට්ටම් .............. පවත්වාගෙන යාම අපේක්ෂා කෙරේ.

10. ගෙවන ලද පුද්ගලයා විසින්ම දැරිය යුතු බදු .............. බදු වන අතර ගෙවන ලද බද්ද වෙනත් පාර්ශ්වයකට විතැන්කල හැකි බදු .............. බදු වේ.

11. රටක මුදල් .................පාලනය කිරීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්තිය.................ප්‍රතිපත්තිය වේ.

12. වාණිජ බැංකුවල පවතින .................වලට අදාළව මහ බැංකුවේ පවත්වාගෙන යා යුතු තැම්පතු ප්‍රමාණය ................. සංචිත වේ.

13. මහ බැංකුවේ රජයේ සුරැකුම්පත් නැවත ................. ගැනීමේදී මුදල් .................ප්‍රසාරණය වේ.

14. පාරිභෝගිකයා .................මුදලට සරිලන .................ලබාදීම සහතික කිරීම පිණිස සලසා ඇති ................. ආවරණය පාරිභෝගික ................. වේ.

15. බද්දක් යනු, යම්.................හෝ ආයතනයක් .................ගෙවිය යුතු යැයි ................. හෝ රජයේ .................විසින් නියම කරනු ලබන අනිවාර්ය ගෙවීමකි.

16. ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණ දෙන .................වලට ශ්‍රී ලංකා මහ බැංකුව ................. ණය දෙන්නා ලෙස සපයන ණය සඳහා අයකරන පොලිය බැංකු පොළී අනුපාතයයි.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන අංශය

II කොටස

1. අ) රජය, මධ්‍යම රජය, පළාත් සභාව, පළාත් පාලන ආයතන ලෙස වර්ග තුනකි. එක් එක් ආයතන ව්‍යාපාරවලට සපයන සේවා දෙක බැගින් නම් කරන්න.
   ආ) රජයෙන් ව්‍යාපාරවල ලැබෙන සහාය ව්‍යාපාරවලට වැදගත්වන ආකාර 4 ක් නම් කරන්න.

2. අ) රජයක් විසින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ආර්ථික අරමුණු නම් කරන්න.
   ආ) රොමේෂ් තම තාක්ෂණය උපයෝගි කර ගනිමින් වතුර බෝතල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නෙකි. පරිසරය ආරක්ෂා කිරීම සඳහා සුදුසු ගස් වර්ග වගා කරන අතර නියමිත පරිදි බදු ගෙවයි. රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට රොමේෂ් කටයුතු කරන ආකාර 4 ක් උදාහරණ සහිතව ලියන්න.

3. අ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය කරුණු දෙකකින් පැහැදිලි කරන්න.
   ආ) i) නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR) හඳුන්වන්න.
   ii) අලුතින් පත් වූ මහ බැංකු අධිපතිතුමා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය ඉහළ දැමීමෙන් අපේක්ෂා කළ ආර්ථික අරමුණ කුමක්ද?

4. අ) වර්තමානයේ ව්‍යාපාරිකයින් විසින් සිදුකරනු ලබන වෙළෙඳ විෂමාචාර 4ක් නම් කරන්න.
   ආ) තාර්කික පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

5. අ) පාරිභෝගික ආරක්ෂණය ව්‍යාපාරයකට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.
   ආ) ව්‍යාපාරිකයන්ගේ වෙළෙඳ විෂමාචාර වැළැක්වීමට රජයට ගත හැකි ක්‍රියාමාර්ග නම් කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන අංශය

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

04

## ව්‍යාපාර සංවිධාන

1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. "සිලෝන් බිස්කට් කම්පැනි ලිමිටඩ්" අයත් වන සමාගම් වර්ගය වනුයේ කුමක්ද?

   (1) අක්වෙරළ සමාගම්
   (2) සීමිත පෞද්ගලික සමාගම්
   (3) ලැයිස්තුගත පොදු සමාගම්
   (4) ලැයිස්තුගත නොවූ සමාගම්
   (5) ඇපයෙන් සීමිත සමාගම්

2. පහත දැක්වෙනුයේ විවිධ ව්‍යාපාර සංවිධානවලට අදාළ ලක්ෂණ කිහිපයකි.

   A. රජයේ වාර්ෂික අයවැය ලේඛනයෙන් අරමුදල් වෙන්කිරීම්
   B. පූර්ණ අයිතිය හෝ වැඩි අයිතියක් රජය සතුවීම.
   C. අමාත්‍යාංශයක් යටතේ රජයේ සෘජු පාලනයට යටත්වීම.
   D. විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම
   E. බොහෝ විට සේවා සැපයීමේ නිරත ආයතන වීම.
   F. ආයතන ප්‍රධානියාගේ නිල නාමයෙන් නීතිය ඉදිරියේ පෙනී සිටීම.

   ඉහත දෑ අතුරින් රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.

   (1) A B C D
   (2) A C E F
   (3) A C D E
   (4) B C E F
   (5) C D E F
   (6)

3. පහත වගුවේ X තීරුවේ විවිධ ව්‍යාපාර ආයතන වර්ග සහ Y තීරුවේ ඒවා ලියාපදිංචි කළ යුතු ආයතන ලැයිස්තුවක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. කොටස් නියෝජිත සමාගම් | 1. සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| B. රක්ෂණ සමාගම් | 2. ශ්‍රී ලංකා මහ බැංකුව |
| C. බලපත්‍රලාභී බැංකු | 3. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම |
| D. සමූපාකාර ග්‍රාමීය බැංකු | 4. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය |

ව්‍යාපාර ආයතන වර්ග හා ඒවා ලියාපදිංචි කළයුතු ආයතන නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A 1 B 3 C 2 D 4
(2) A 1 B 2 C 4 D 3
(3) A 3 B 1 C 2 D 4
(4) A 4 B 1 C 3 D 2
(5) A 3 B 4 C 2 D 1

4. සීමාසහිත පොදු සමාගමක ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

(1) උපරිම කොටස්කරුවන් පිළිබඳ සීමාවන් නොමැති වීමයි.
(2) අධ්‍යක්ෂවරුන්ගේ උපරිම සංඛ්‍යාවක් නොමැති වීමයි.
(3) කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම අනිවාර්ය නොවීමයි.
(4) කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට හැකිවීමයි.
(5) ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර ණය ගෙවීමේ හැකියාව පරීක්ෂා කළ යුතුවීමයි.

5. කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක්, එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපොළ ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව දීමට යොදාගන්නා ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ කුමක්ද?

(1) සංස්ථාපිත සමාගම්
(2) විදේශීය සමාගම්
(3) වරලත් ව්‍යාපාර
(4) ඒක පුද්ගල ව්‍යාපාර
(5) හවුල් ව්‍යාපාර

6. මුළු ප්‍රාග්ධනයෙන් 51% හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයේ අනුබද්ධිත ආයතනයකට අයිති සමාගම් පහත අනුව ලියාපදිංචි කර ඇති ව්‍යාපාර වර්ගය වන්නේ,

(1) රාජ්‍ය සංස්ථා
(2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) හවුල් ව්‍යාපාර
(4) රාජ්‍ය සමාගම්
(5) පොදු සමාගම්

7. අදාළ ආයතනයේ නම කඳුරට වානේ සමාගම පී.එල්.සී. ලෙස සඳහන් විය. ඉහත සමාගමේ නම නිරීක්ෂණය කිරීමෙන් ස්ථාවරව එළඹිය හැකි නිගමනය වන්නේ,

(1) කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි නොකළ පොදු සමාගමකි.
(2) මහජනයාට ප්‍රසිද්ධියේ කොටස් අලෙවිකළ නොහැකි සමාගමකි.
(3) වානේ නිපදවන පොදු සමාගමකි.
(4) කොළඹ කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි කළ සමාගමකි.
(5) ණයකර නිකුත්කර මුදල් රැස්කර ගත් පොදු සමාගමකි.

8. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශන තෝරන්න.

(1) වරලත් හිමියාගේ වෙළෙඳ ලකුණු සහිත භාණ්ඩ ඔහුගෙන් මිලට ගෙන නැවත විකිණීමට වරලත් හිමියාට අයිතිය පැවරෙන ව්‍යාපාර නිෂ්පාදිත වරලත් ව්‍යාපාර වේ.
(2) ඒකාබද්ධ වීමකදී වෙන් වෙන්ව පැවති සමාගම් දෙකක් තනි පුද්ගල ව්‍යාපාර බවට පත්වේ.
(3) එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධවීම විෂම සංයෝජනයයි.
(4) එක සමාන නොවන වෙනත් වර්ගවල ව්‍යාපාර සංයෝජනය වීම තිරස් සංයෝජනයයි.
(5) ව්‍යාපාර දාමයේ විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම සිරස් සංයෝජනයයි.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

9. යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර, එම රටින් පිටත ව්‍යාපාර කටයුතු කරන සමාගම් වනුයේ,
   (1) අක් වෙරළ සමාගම්
   (2) විදේශීය සමාගම්
   (3) සීමාරහිත සමාගම්
   (4) ඇපයෙන් සීමිත සමාගම්
   (5) මිල නොකළ සමාගම්

10. හවුල් ඔප්පුවක සඳහන් නොවූ කරුණක් සම්බන්ධයෙන් හවුල් ඔප්පුවක් නොමැති විට කටයුතු කළහැකි පනත වන්නේ,
   (1) සීමිත හවුල් ව්‍යාපාර පනත
   (2) සමාගම් පනත
   (3) හවුල් ව්‍යාපාර ආඥා පනත
   (4) ව්‍යාපාර නාම ආඥා පනත
   (5) වංචා වැළැක්වීමේ ආඥා පනත

11 සිට 15දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

11. (අ) ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව ................ ව්‍යාපාර හා ................ ව්‍යාපාර ලෙස වර්ග කල හැක.
(ආ) විධිමත් සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ ලෙස ................ පුද්ගලයින් සිටීම................ආදිය ගත හැක.

12. (අ) 1995 ................ සමුළු සංවිධානය විසින් ................ප්‍රතිපත්ති ප්‍රකාශ කර තිබේ.
(ආ) ලියාපදිංචිය අනිවාර්ය නොවන ලාභය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන වර්ග 2 ක් ලෙස ................ සහ ................ ව්‍යාපාර හැඳින්විය හැක.

13. (අ) ව්‍යාපාර සංයෝජනය වීම ................ හා ................ලෙස දෙයාකාර වේ.
(ආ) සීමිත පොදු සමාගම් ................ හා ................ සමාගම් ලෙස වර්ග කළ හැක.

14. (අ) හවුල් ව්‍යාපාරයක ලිඛිත ගිවිසුමක් නොමැති විටක හෝ ගිවිසුමේ සඳහන් නොවූ කරුණක් සම්බන්ධ ගැටළුවකදී ................හවුල් ව්‍යාපාර ආඥා පනතේ ................ වගන්තියට අනුව කටයුතු කරයි.
(ආ) ණය ගෙවීමේ හැකියාව පිළිබඳ ................තොරව කොටස්කරුවන්ගේ කැමැත්ත මත පෞද්ගලික සමාගම්වලට ................ බෙදාහැරිය හැක.

15. (අ)ශ්‍රී ලංකාවේ සමාගමක් සංස්ථාපනය කිරීම................ සමාගම් පනතට අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් ................වෙත සිදුකළ යුතුය.
(ආ) KFC, Pizza Hut ................ වරලත් ව්‍යාපාර වන අතර IOC ඉන්ධන පිරවුම්හල්................වරලත් ව්‍යාපාර වේ.

නිශ්චිත පිළිතුරු සපයන්න.

16. සමූපකාර ප්‍රතිපත්ති 4 ක් නම් කරන්න.
17. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන නම් කරන්න.
18. සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ 4 ක් නම් කරන්න.
19. රාජ්‍ය සංස්ථා හඳුන්වන වෙනත් නම් 4 ක් නම් කරන්න.
20. පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල ලක්ෂණ 4 ක් ලියන්න.

## II - කොටස

(1) I. සංවිධානයක් යන්න අර්ථකථනය කරන්න.
II.විධිමත් සංවිධානයක පොදු ලක්ෂණ නම් කරන්න.

(2) හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය ගැලීම් සටහනක් මගින් ලියා දක්වන්න.

(3) නිමල් පෙරේරා ජපානයේ රැකියාවක් කර පැමිණි අතර ඔහු මිලියන 25 ක මුදලක් රැගෙන පැමිණි අතර ඔහු තනිවම ව්‍යාපාරයක් ඇරඹීමට අපේක්ෂා කළ අතර, එහෙත් ඔහුගේ යහළුවන් දෙදෙනෙකු පැවසුවේ ඔවුන් සමඟ එක්ව ව්‍යාපාරයක් අරඹන ලෙසය.
I. ඉහත සිද්ධියට අනුව මීට අදාළ ව්‍යාපාර සංවිධාන වර්ග 2 නම් කරන්න.
II. එම සංවිධානවල වාසි අවාසි 2 බැගින් ලියා දක්වන්න.

(4) I. කේවල ස්වාමී ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය ලියා දක්වන්න.
II. කේවල ස්වාමී ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් ඊට අදාළ පනත නම් කරන්න.

(5) පහත වගුව සම්පූර්ණ කරන්න

| නිර්ණායක | කේවල ස්වාමී ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
|---|---|---|
| 1. සාමාජික සංඛ්‍යාව | | |
| 2. ප්‍රාග්ධනය යෙදවීම | | |
| 3. පරිපාලනය | | |
| 4. වගකීම | | |
| 5. ලාභපාඩු භුක්ති විඳීම | | |
| 6. තීරණ ගැනීම | | |
| 7. විසුරුවා හැරීම | | |

(6) සමාගමක් සංස්ථාපනය කිරීමේ අදාළ ලියවිලි නම් කරන්න.
(7) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගම් වර්ගීකරණය කර දක්වන්න.
(8) ලැයිස්තුගත සමාගම් හා ලැයිස්තුගත නොවූ සමාගම් අතර වෙනස ලියා දක්වන්න.
(9) විදේශීය සමාගම් හා අක්වෙරළ සමාගම් අතර වෙනස ලියා දක්වන්න.
(10)

| නිර්ණායක | සීමිත පෞද්ගලික සමාගම් | සීමිත පොදු සමාගම් |
|---|---|---|
| 1. සාමාජික සංඛ්‍යාව | | |
| 2. වගකීම | | |
| 3. ප්‍රාග්ධන සම්පාදනය | | |
| 4. පරිපාලනය හා කළමනාකරණය | | |

(11) I. සමුපකාර ව්‍යාපාරයේ ලියාපදිංචියට අදාළ ලියකියවිලි ලියා දක්වන්න.
II. සමුපකාර ව්‍යාපාරයේ උන්නතියට ගතහැකි යෝජනා 4 ක් පැහැදිලි කරන්න.

(12) " මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතන 2 ක් වන සීමාසහිත සියපත ෆිනෑන්ස් සමාගම සහ ස්මාර්ට් ෆිනෑන්ස් සමාගම එක්ව සීමාසහිත සිංහ ෆිනෑන්ස් නමින් නව සමාගමක් ඇරඹීමට සැලසුම් කර ඇත.

ඉහත සිද්ධියට අදාළ ව්‍යාපාර සංයෝජනය නම් කර හඳුන්වන්න.

(13) I. වරලත් ගිවිසුම අනුව වරලත් හිමියා විසින් වරලත් ලාභියාට ඇතිවන පහසුකම් ලියා දක්වන්න.

II. MC Donalds, KFC වැනි නිෂ්පාදිත ආහාර සපයන වෙළෙඳ ආයතන අයත් වරලත් ව්‍යාපාර වර්ගය නම් කර එය හඳුන්වන්න.

(14) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග නම් කරන්න.

(15) රාජ්‍ය සංස්ථා පිහිටුවන ආකාර 2 නම් කරන්න.

(16) රාජ්‍ය දෙපාර්තමේන්තු වර්තමානයේ ලාභ ලබන ආයතන බවට පත් කිරීමට ගතහැකි යෝජනා 4 ක් කෙටියෙන් විස්තර කරන්න.

(17) I. නිමල් හා සුනිල් එක්වී හවුල් ව්‍යාපාරයක් ඇරඹීය. එහෙත් ටික කලක් යනවිට ලාභ අලාභ බෙදාගැනීමේදී දෙදෙනා අතර ගැටළු ඇතිවිය. මෙම ගැටළුව නිරාකරණය කිරීමට බලපාන ආඥා පනත ලියා දක්වන්න.

II.එහි සඳහන් කරුණු 4 ක් දක්වන්න.

(18) හවුල් ව්‍යාපාරවලට සම්බන්ධ පහත සඳහන් පනත් අදාල වන ආකාරය පෙන්වන්න.

I. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත 24 වගන්තිය
II. 1840 වංචා වළක්වා ගැනීමේ ආඥා පනත
III. 2007 සමාගම් පනත
IV. 1918 අංක 6 ව්‍යාපාර ආඥා පනත

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ

## පුනරීක්ෂණ සංචිතය

⑤

# ව්‍යවසායකත්වය

1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

1. ව්‍යවසායකත්වය වඩාත් හොඳින් අර්ථ දක්වන්නේ පහත පිළිතුරු අතරින් කවරක් මගින්ද ?
   (1) අවධානම් දැරීම
   (2) ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙක් ලෙස කටයුතු කිරීම
   (3) පවත්නා තත්ත්වය වෙනස් කරමින් නව නිර්මාණ බිහි කිරීම
   (4) ව්‍යාපාරය සම්පත් භාවිතයට ගැනීම
   (5) පවතින දෙයක් එම ආකාරයෙන්ම සිදු කර ගෙන යාම

2. ව්‍යවසායකත්වයේ පුද්ගල ප්‍රතිලාභයක් වන්නේ,
   (1) නිර්මාණශීලීත්වය ප්‍රදර්ශනය කිරීම
   (2) නිෂ්පාදන ගුණත්වය වර්ධනය වීම
   (3) පුද්ගලයාගේ ජීවන තත්ත්වය උසස් වීම
   (4) කීර්තිනාමය ඉහළ යාම
   (5) ආර්ථික වර්ධනය වැඩි කර ගැනීමට හැකි වීම

3. පහත දැක්වෙනුයේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතාවේ. මේවා අතුරින් ව්‍යවසායකත්ව කුසලතා ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) අන්තර්පුද්ගල හැකියාව සහ පුහුණුව
   (2) නායකත්ව හැකියාව හා ස්වයං ඇගයීම
   (3) අධ්‍යාපනය හා සන්නිවේදන හැකියාව
   (4) අන්තර් පුද්ගල හැකියාව සහ නායකත්ව හැකියාව
   (5) අත්දැකීම් වලින් ඵල ලැබීම හා මූලික කළමණාකරණ හැකියාව

4. ව්‍යවසායකයා කළමනාකරුවකුගෙන් වෙනස් වන අවස්ථාවකි
   (1) කැපවීමෙන් වැඩ කරයි
   (2) ව්‍යාපාරයට නායකත්වයක් දෙයි
   (3) ව්‍යාපාර පිළිබඳ තීරණ ගනී
   (4) දැඩි ව්‍යාපාර අවදානමට මුහුණ දේ
   (5) සේවකයන් පාලනය කරයි

5. ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමේ මාර්ගයක් නොවන්නේ කුමක්ද?
   (1) ස්වයං ඇගයීම
   (2) පුහුණුව ලබා දීම
   (3) අත්දැකීම් ලබාගැනීම
   (4) සම්මාන පිරිනැමීම
   (5) අධ්‍යාපනය ලබාදීම

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

6. මෑතකදී ලෝකයේ ඇති වූ කොවිඩ් 19 වසංගතය වෙනුවෙන් ශ්‍රී ලාංකික වෛද්‍යවරයෙකු විසින් පර්යේෂණ සිදු කර නව එන්නතක් සොයා ගන්නා ලදි. මෙම සිද්ධියට අදාළ ව්‍යවසායකත්ව ප්‍රවණතාව වන්නේ,
   (1) හරිත ව්‍යවසායකත්වය
   (2) සමාජ ව්‍යවසායකත්වය
   (3) ගෝලීය ව්‍යවසායකත්වය
   (4) අභ්‍යන්තර ව්‍යවසායකත්වය
   (5) බාහිර ව්‍යවසායකත්වය

7. ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව දැක්වෙන පිළිතුර වන්නේ,
   (1) නව රැකියා අවස්ථා බිහිවීමෙන් සේවා නියුක්තිය ඉහළ යාම.
   (2) නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථාව උදා වීම.
   (3) ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම.
   (4) පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලැබීම
   (5) කර්මාන්තය තුළ විශිෂ්ඨයින් බවට පත් වීමට හැකි වීම.

8. ව්‍යවසායකත්වයේ වැදගත්කම වඩාත්ම පැහැදිලි වන ප්‍රකාශය වන්නේ,
   (1) අසාර්ථක ව්‍යාපාර ගොඩනැගිය හැකි වන්නේ ව්‍යවසායකයාටය.
   (2) වෙනස්වන ලෝකයට නායකත්වය දිය හැක්කේ ව්‍යවසායකයන්ටය.
   (3) ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය වන්නේ ව්‍යාපාර බිහි වීමය.
   (4) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කළ හැක්කේ ව්‍යවසායකයන්ටය.
   (5) ප්‍රාදේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැක්කේ ව්‍යවසායකයන්ටය.

9. ව්‍යවසායකත්වය තුළින් ලැබිය හැකි පුද්ගල ප්‍රතිලාභ හා ආර්ථික ප්‍රතිලාභ පහත දැක්වේ.
   a. පුද්ගල හැකියාවන් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබීම
   b. ආදායම් අවස්ථා බිහි වීම
   c. ජීවන මට්ටම ඉහල යාම
   d. සමාජ තත්වය හා පිළිගැනීමක් ඇතිවීම
   e. නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථාව ලැබීම
   f. පෞද්ගලික මූල්‍යමය ප්‍රතිලාභ ලැබීම
   g. කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලැබීම
   h. සේවා නියුක්තිය වර්ධනයක් වීම

   මේවා අතුරින් පුද්ගල ප්‍රතිලාභ ලෙස සැලකිය හැක්කේ

   (1) ABCD
   (2) ABCF
   (3) ACDE
   (4) BCFG
   (5) ADFG

10. ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා කිහිපයක් පහත දැක්වේ.
    a. අවදානම් දැරීමට ඇති කැමැත්ත
    b. නායකත්ව හැකියාව
    c. නිර්මාණශීලී බව
    d. සන්නිවේදන හැකියාව
    e. කැපවීම
    f. ආත්ම විශ්වාසය
    g. අන්තර් පුද්ගල හැකියාව
    h. කළමණාකරන කුසලතාවය

ඉහත අතුරෙන් ව්‍යවසායකයකු සතු ගති ලක්ෂණ පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) acef
(2) acfh
(3) bdgh
(4) cefg
(5) degh

ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

11. ව්‍යවසායකයෙකු සාර්ථක වීම සඳහා පැවතිය යුතු සාධක තුනක් නම් කරන්න.
12. ව්‍යවසායකයා සතු ගති ලක්ෂණ හතරක් දක්වන්න.
13. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවරයන් දක්වන්න.
14. ව්‍යවසායකත්ව ප්‍රවනතා මොනවාද?
15. ව්‍යවසායකත්වය ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර මොනවාද?

ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න

හිස්තැන් පුරවන්න

16. ව්‍යවසායකත්වය නිසා............... බිහිවීමෙන් ජාතික නිෂ්පාදනය.................. යන අතර නව රැකියා අවස්ථා බිහිවීමෙන්.....................ඉහළ යයි
17. . ............මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සමාජයීය ගැටළුවට පිළියම් යෙදීමට......................බිහි කිරීම සමාජීය ව්‍යවසායකත්වය වේ.
18. ව්‍යවසායකයාගේ ලක්ෂණයක් ලෙස........................හා............................හැඳින්විය හැකි අතර ව්‍යාපාරිකයාගේ ලක්ෂණයන් ලෙස..................හා.........................හැඳින්විය හැක.
19. නායකත්ව හැකියා අන්තර් පුද්ගල හැකියා...........................ලෙස හඳුන්වන අතර ස්වයං ඇගයීම අධ්‍යාපනය ව්‍යවසායකත්ව............................ ලෙස හඳුන්වයි.
20. මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා .................. කිරීම සඳහා ..............සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

II කොටස

1.ව්‍යවසායකත්වය අර්ථ දක්වා එය ආර්ථිකයට වැදගත් වන්නේ ඇයි ද යන්න පෙන්වන්න.

2. ව්‍යවසායකයාගේ කාර්යභාරය කුමක් ද?

3. "ව්‍යවසායකත්වය තුළින් ව්‍යාපාර බිහි වේ" එකඟද පැහැදිලි කරන්න.

4. ව්‍යවසායකත්වය ආයතනයට පුද්ගලයාට සහ සමාජයට විවිධාකාරයෙන් බලපෑම් ඇති කරයි.වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.

5.ව්‍යවසායකත්වය ආර්ථික සංවර්ධනයට විශාල පිටුවහලක් වෙයි.පැහැදිලි කරන්න.

6.රටක ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා රජයට කළ හැකි දෑ මොනවාද?

7. අධ්‍යාපනය තුළ ව්‍යවසායකත්වය යන විෂය ඉගැන්වීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

8. ව්‍යවසායකත්ව විවිධ ප්‍රවනතා මෑත කාලයේ දක්නට ලැබේ. ඒවා එක් එක් වශයෙන් හඳුන්වන්න.

9. ව්‍යවසායකයා සහ ව්‍යාපාරිකයා දෙදෙනෙකු නොව එක් අයෙකි. පැහැදිලි කරන්න.

10.ව්‍යවසායකත්වය ක්‍රියාවලිය තුළ කාර්යයන් කිහිපයක් දක්නට ලැබේ. එම කාර්යයන් මොනවාද ?

11.ව්‍යවසායකයාට තම ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කරගත හැකි ක්‍රමවේද මොනවාද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන අංශය

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ

## පුනරීක්ෂණ සංචිතය

⑥

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

1 සිට 9 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරාන්න.

1. කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිතා කරයි.

| **ආයතනය** | **නිර්ණායකය** |
|---|---|
| 1.ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | A.ස්ථිර සේවක සංඛ්‍යාව 50 ට අඩු ව්‍යාපාර |
| 2.ශ්‍රී ලංකා මහ බැංකුව | B.යොදවා ඇති ප්‍රාග්ධනය රු.මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 3.කාර්මික සංවර්ධන මණ්ඩලය | C.සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර |
| 4.ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | D.භාවිතා කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ව්‍යාපාර |

ඉහත දී ඇති ආයතන අනුව නිර්ණායක නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

(1) ADCB (2) CDBA (3) DBAC (4) ACBD (5) BCDA

2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණයක් නොවන්නේ,
   (1) වෙළෙඳපොළ කුඩාවීම.
   (2) සේවක සංඛ්‍යාව අඩුවීම.
   (3) ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවමවීම.
   (4) ආයෝජිත ප්‍රාග්ධනය කුඩාවීම.
   (5) පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිතා කිරීම.

3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක නිර්ණායක මත පදනම්ව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ නිර්ණායක ඉදිරිපත් කරයි. ඒ අනුව ප්‍රමාණාත්මක නිර්ණායක පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) ව්‍යාපාර සංවිධාන ක්‍රමය, ආයෝජිත ප්‍රාග්ධනය, භාවිතා කරන තාක්ෂණය, සේවක සංඛ්‍යාව
(2) ආයෝජිත ප්‍රාග්ධනය, වාර්ෂික පිරිවැටුම, ව්‍යාපාර සංවිධාන ක්‍රමය, භාවිතා කරන තාක්ෂණය
(3) වෙළෙඳපොළ ස්වභාවය,වාර්ෂික පිරිවැටුම, යොදාගන්නා සේවක සංඛ්‍යාව, ව්‍යාපාර සංවිධාන ක්‍රමය
(4) යොදා ගන්නා සේවක සංඛ්‍යාව,භාවිතයට ගන්නා බලශක්තිය,වාර්ෂික පිරිවැටුම,ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය
(5) වෙළෙඳපොළ ස්වභාවය,භාවිතා කරන තාක්ෂණය,භාවිතයට ගන්නා බල ශක්තිය,වාර්ෂික පිරිවැටුම

4. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය දිරිගැන්වීම්වලට අදාළ උදාහරණ පමණක් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) කෙටිකාලීන හා දිගුකාලීන ණය, උපදේශන සේවා, බදු සහන,ප්‍රතිමූල්‍ය පහසුකම්
(2) උපදේශන සේවා, යටිතල පහසුකම්, මූල්‍යමය ආධාර, විශිෂ්ඨතා හා සම්මාන දීම.
(3) කෙටිකාලීන හා දිගුකාලීන ණය, මූල්‍යමය ආධාර, බදු සහන, ප්‍රතිමූල්‍යමය පහසුකම්
(4) යටිතල පහසුකම්, මූල්‍යමය ආධාර, බදු සහන, විශිෂ්ඨතා හා සම්මාන දීම
(5) මූල්‍යමය ආධාර, බදුසහන, යටිතල පහසුකම්, උපදේශන සේවා

5. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන ලබන සාධක කිහිපයක් පහත දැක්වේ.

A. දැඩි තරඟකාරිත්වය
B. නිවැරදිව ගිණුම් පවත්වාගෙන නොයෑම.
C. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
D. නිවැරදි සේවකයින් බඳවා නොගැනීම.
E. නව නිෂ්පාදිත කරා යොමු නොවීම.
F. කර්මාන්තයේ නිෂ්පාදන තාක්ෂණය වෙනස් වීම.
G.ව්‍යාපාර කාර්යඵල විශ්ලේෂණය නොකිරීම.
H.රජයේ බදු සහන අඩු කිරීම.

ඉහත දැ අතුරෙන් සුළු පරිමාණ ව්‍යවසායකයෙකුට පාලනය කළ නොහැකි සාධක පමණක් ඇතුලත් පිළිතුර කුමක්ද?

(1) BDEG (2) ACFH (3) ABDH (4) BCFH (5) CDFH

6. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරි ගැන්වීම් ලබාදෙන රාජ්‍ය ආයතන පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) කාර්මික සංවර්ධන මණ්ඩලය ,සර්වෝදය,සකසුරුවම් හා ණය දෙන සමිති,ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

(2) සර්වෝදය ,ජාතික සංවර්ධන බැංකුව,කාර්මික තාක්ෂණික ආයතනය,අපනයන සංවර්ධන මණ්ඩලය

(3) කාර්මික තාක්ෂණික ආයතනය,අපනයන සංවර්ධන මණ්ඩලය,ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,කාර්මික සංවර්ධන මණ්ඩලය.

(4) ජයිකා ආයතනය, සර්වෝදය, සකසුරුම් හා ණය දෙන සමිති, කාර්මික සංවර්ධන මණ්ඩලය

(5) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ජයිකා ආයතනය

7. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට දිරි ගැන්වීම් ලබාදෙන ආයතන හා ඒවායින් ලබාදෙන දිරි ගැන්වීම් කිහිපයක් පහත දැක්වේ.

| ආයතනය | ලබාදෙන දිරිගැන්වීම |
|---|---|
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය<br>2. අපනයන සංවර්ධන මණ්ඩලය<br>3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>4. ජාතික සංවර්ධන බැංකුව | A. උපදේශ සේවා<br>B. මූල්‍ය පහසුකම්<br>C. තාක්ෂණික දැනුම ලබාදීම<br>D. අලෙවි පහසුකම් |

මෙම ආයතන විසින් ලබාදෙන දිරිගැන්වීම් පිළිවෙලින් නිවැරදිව ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) CDAB (2) ADCB (3) BACD (4) DCAB (5) ACBD

8. සුළු ව්‍යාපාරවලට වෙළෙඳපොළේ සාර්ථකව රැඳී සිටිය හැකි වන්නේ,

(1) මහ පරිමාණ ව්‍යාපාර උනන්දු නොවන වෙළෙඳපොළට ප්‍රවිෂ්ඨ වීමෙනි.

(2) මහා පරිමාණ ව්‍යාපාර සතු වෙළෙඳපොළට ප්‍රවිෂ්ඨ වීම තුළිනි.

(3) ප්‍රචාරණය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීමෙනි.

(4) විදේශ වෙළෙඳපොළට ප්‍රවිෂ්ඨවීම තුළිනි.

(5) මහා පරිමාණ ව්‍යාපාරය සමඟ තරඟ කිරීමෙනි.

9. ශ්‍රී ලංකාවේ බොහෝමයක් සුළු ව්‍යාපාර අසාර්ථකවීමට හේතුවී ඇත්තේ,

(1) කළමනාකරණ නිපුණතා අඩුවීමයි.

(2) දුර්වල අලෙවිකරණයයි.

(3) නව තාක්ෂණයේ අභියෝගයයි.

(4) ස්ථාවර වත්කම්වල අධි ආයෝජනයයි.

(5) ඉහත කරුණු සියල්ලම වේ.

**ප්‍රශ්න අංක 10 සිට 22 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න**

10. සුළු කර්මාන්ත ව්‍යවසායකයින් නංවාලීම සඳහා ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමය සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය.............................විසින් හා ..............................ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් ක්‍රියාත්මක වේ.

11. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා ........................හා ................................නිර්ණායක පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත.

12. සේවක සංඛ්‍යාව ...................අඩු ව්‍යාපාර සුළු පරිමාණ ව්‍යාපාර ලෙස .................. දෙපාර්තමේන්තුව හඳුනාගනී.

13. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධකයෝ ව්‍යාපෘති හෙවත් ස්ටෙඩ් සඳහා දේශීය ආයතනයක් ලෙස...................හා විදේශ ආයතනයක් ලෙස ...................දායකත්වය සපයති.

14. දිළිඳු හා අඩු ආදායම්ලාභී කුටුම්භවලට හා කුඩා ව්‍යාපාර ව්‍යවසායකයින්ට ණය ලබාදීම, ඉතුරුම් තැන්පතු ලබාගැනීම, මුදල් ප්‍රේෂණ ගෙවීම් පහසුකම් රක්ෂණ සේවා ආදි පුළුල් පරාසයක මූල්‍ය සේවා සැපයීම ................... යන්නෙන් අදහස් කරන බව ආසියානු සංවර්ධන බැංකුව අර්ථ දක්වයි.

15. භාවිතා කරන විදුලිබල ධාරිතාව අනුව කුඩා ව්‍යාපාර හඳුනාගැනීමේ නිර්ණායකය ඉදිරිපත් කරන ලද්දේ................... විසින්ය.

16. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීම සඳහා රජය ගෙන ඇති පියවර ................... හා ...................ලෙස කොටස් දෙකකට බෙදේ.

17. ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම් සඳහා විවිධ වූ දිරිගැන්වීම්වල යෙදෙන ආයතන අතරින් NEDA යන කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන ආයතනය ................... ය.

18. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර,මහාපරිමාණ ව්‍යාපාර වලින් වෙන් කර හඳුනා ගත හැකි ප්‍රමාණාත්මක නිර්ණායක 4ක් දක්වන්න

19. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උපදේශන පහසුකම් සපයන ආයතන 4ක් දක්වන්න.

20. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා දිරි ගැන්වීම් ලබාදෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 4ක් දක්වන්න.

21. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නොවන දිරිගැන්වීම් 4 ක් දක්වන්න.

22. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට හේතු 4 ක් දක්වන්න.

## II කොටස

1\. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ හා පවත්වාගෙන යෑමේදී බොහෝ ව්‍යවසායකයන් අසාර්ථකත්වයට පත් වේ. එම අවධානම මග හරවා ගැනීම සඳහා ව්‍යවසායකයින් සැලකිලිමත්විය යුතු කරුණු මොනවාද?

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීමේ දී “ ගුණාත්මක සාධක” යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කර ඒ සඳහා උදාහරණ 02 ක් සපයන්න.

2\. (අ) විදේශ ගතව සිට මෙරටට පැමිණි සිරිරත්න තමා උපයාගත් මුදලින් කුඩා ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි ඒ සඳහා සැලකිල්ලට ගතයුතු කරුණු පිළිබඳව ඔබගෙන් උපදෙස් පතයි ඔබ විසින් දෙනු ලබන උපදෙස් මොනවාද?

(ආ) කොතරම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ වුවද බොහෝ ව්‍යාපාර කරගෙන යාමේ දී අසාර්ථකත්වයට පත් වේ. එසේ අසාර්ථකත්වයට පත් වීමට හේතු මොනවාද ?

3\. “ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර අතර සම්බන්ධතාව එහි දියුණුවට හේතු වේ.” පැහැදිලි කරන්න.

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

07

## මුදල් හා මූල්‍ය ආයතන

1 – 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

01. හොඳ මුදලක කාර්යයන් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

A - හුවමාරු මාධ්‍යයක් වීම
B - පොදු පිළිගැනීම
C - සුලබ නොවීම
D - වටිනාකමේ මිම්මක් ලෙස ක්‍රියාකිරීම
E - වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම
F - පහසුවෙන් හඳුනාගත හැකිවීම

(1) A D E (2) A B C (3) A C D (4) A B F (5) A B E

02. "මුදල් යනු කුමක්ද? "යන්න ප්‍රශ්නය සඳහා ලද පිළිතුරු කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ගෙවීම් සඳහා යොදාගන්නා ඕනෑම දෙයක්
(2) ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නෝට්ටු හා කාසි
(3) දේශීය විදේශීය ගනුදෙනු වලදී භාවිත කරන ඕනෑම දෙයක්
(4) භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගන්නා ඕනෑම දෙයක්
(5) වාණිජ බැංකු හරහා ගනුදෙනු වන චෙක්පත්, කාසි හා නෝට්ටු

03. පහත වගුවේ මුදල් වර්ගද එම මුදල් වර්ග වලට නිදසුන් ද ඇතුලත් වේ.

| මුදල් වර්ග | නිදසුන් |
|---|---|
| (i). විද්‍යුත් මුදල් | A - රත්‍රං |
| (ii). බැංකු මුදල් | B - ඉල්ලුම් තැන්පතු |
| (iii). ව්‍යවහාර මුදල් | C - ණය කාඩ්පත් |
| (iv). ද්‍රව්‍ය මුදල් | D - කාසි හා නෝට්ටු |

මුදල් වර්ග අනුව නිදසුන් පිළිවෙලින් නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) B C D A
(2) C B A D
(3) C B D A
(4) A B C D
(5) D C B A

04. පහත දැක්වෙන මූල්‍ය ආයතන අතුරෙන් තැන්පතු භාර ගැනීමට නොහැකි මූල්‍ය ආයතන වන්නේ,

(1) ජාතික ඉතිරි කිරීමේ බැංකුව
(2) හැටන් නැෂනල් බැංකුව
(3) කඳුරට සංවර්ධන බැංකුව
(4) L B ෆිනෑන්ස් ආයතනය
(5) එන්.ඩී.බී වෙනචර් ඉන්වෙස්ට්මන්ට් පුද් සමාගම

05. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල සාමාජිකයින් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

A - ජනාධිපති
B - මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම්
C - මහ බැංකු අධිපති
D - මුදල් ඇමති
E - පත්කල සාමාජිකයින්

(1) A B C (2) B C E (3) D C B (4) C D E (5) A D C

06. බලපත්‍රලාභි වාණිජ බැංකුවලට පමණක් නිරතවීමට අවසර ලබාදී ඇති සේවාව වන්නේ,

(1) ස්ථාවර තැම්පතු පවත්වාගෙන යෑමයි.
(2) ඉතිරි කිරීම් ගිනුම් හා ස්ථාවර තැම්පතු පවත්වාගෙන යෑමයි.
(3) ඉල්ලුම් තැම්පතු පවත්වාගෙන යාමයි.
(4) උකස් සේවා පවත්වාගෙන යෑමයි.
(5) කල්බදු පහසුකම් සැපයීමයි.

07. මූල්‍ය ආයතන හා එහි පාර්ශව පහත දැක්වේ.

A - ඒකක භාරකරු
B - ප්‍රාරක්ෂකයන්
C - අරමුදල් කළමනාකරණ සමාගම
D - වාණිජ බැංකු
E - ආයෝජකයන්
F - තැරැව්කරුවන්

ඉහත පාර්ශව අතුරෙන් ඒකක භාරයකට අයත් පාර්ශවයන් ඇතුලත් වරණය කුමක් ද?

(1) A D E
(2) A B E
(3) A E F
(4) A C E
(5) A C D

08. 2023-01-01 දින සී/ස සූරිය (පොදු) සමාගම මහජනයාට සුරැකුම් නිකුතුවක් 2022.01.01 දින සිදු කරන ලදි. 2022.03.31 දින දක්වා කාලය තිබුනද එම කාලය තුළ අවශ්‍ය අරමුදල් ප්‍රමාණය සපයාගැනීමට නොහැකි විය.එම නිසා ඉතිරි සුරැකුම්පත් ගිවිසගත් පරිදි මිල දී ගැනීම අදාල ආයතනය විසින් සිදු කරන ලදී. මෙම ආයතනය විය හැක්කේ,

(1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්
(2)ආන්තික සැපයුම් ආයතනයන්
(3)ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමක්
(4)රක්ෂණ සමාගමක්
(5)කොටස් තැරැව්කාර සමාගමක්

09. පහත වගුවේ දැක්වෙන්නේ මූල්‍ය ආයතන හා එහි කාර්යයන් වේ.

| මූල්‍ය ආයතන | කාර්යයන් |
|---|---|
| 1. බලපත්‍රලාභී වාණිජ බැංකු | A - ඉතිරිකිරීම් හා කාලීන තැම්පතු පවත්වාගෙන යෑම |
| 2. රක්ෂණ සමාගම් | B - විශ්‍රාම අරමුදල් පවත්වාගෙන යෑම |
| 3. සේවක අර්ථසාධක අරමුදල | C - ඉල්ලුම් තැම්පතු පවත්වාගෙන යෑම |
| 4. බලපත්‍රලාභී විශේෂිත බැංකු | D - විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම |

මූල්‍ය ආයතනයන්ට අදාල කාර්යයන් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ?

(1) A B C D
(2) C D B A
(3) A D B C
(4) B A C D
(5) D C A B

10. බලපත්‍රලාභි මූල්‍ය සමාගම් නියාමන බලධාරියා වන්නේ,

(1) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
(2) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
(3) ශ්‍රී ලංකා මහ බැංකුව
(4) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
(5) ශ්‍රී ලංකා මූල්‍ය වංචා විමර්ශන කොමිෂන් සභාව

11. මූල්‍ය සමාගම්වල කාර්යයක් නොවන්නේ,

(1) කාලීන තැම්පතු භාරගැනීම
(2) කෙටිකාලීන ණය සැපයීම
(3) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
(4) ඉල්ලුම් තැම්පත් පවත්වාගැනීම
(5) කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම.

12. බැංකු ජංගම ගිණුමේ ශේෂය ඉක්මවා කිසියම් මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට (1)...................... මගින් ලබාදෙන අනුමැතිය (2)....................... වේ. එය (3).......................හා (4)................ලෙස වර්ග දෙකකි.

ඉහත හිස්තැන් වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

(1) බලපත්‍රලාභි විශේෂිත බැංකු , ණය, දිගුකාලීන ,කෙටිකාලීන
(2) මහබැංකුව,ණය,දිගුකාලීන ,කෙටි කාලීන
(3) වාණිජ බැංකු,ණය,දිගු කාලීන, කෙටි කාලීන
(4) වාණිජ බැංකු ,අයිරා,තාවකාලික අයිරා,ස්ථාවර අයිරා
(5) වාණිජ බැංකු,ණය,තාවකාලික ණය,ස්ථාවර ණය

13. (1)........................ඉල්ලීම මත (2)...........................බැංකුව විසින් (3)............................වෙනුවෙන් මුදල් ගෙවන බවට එකඟ වෙමින්(4)............................බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල(5).......................වේ.

හිස්තැන් වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ආනයනකරුගේ, අපනයනකරුගේ, අපනයනකරු, ආනයනකරුගේ, බැංකු අණකර
(2) ආනයනකරුගේ, ආනයනකරුගේ, ආනයනකරු, අපනයනකරුගේ, බැංකු අණකර
(3) ආනයනකරුගේ, ආනයනකරුගේ, ආනයනකරු, අපනයනකරුගේ, ණයවරලිපිය.
(4) අපනයනකරුගේ, අපනයනකරුගේ, අපනයනකරු, ආනයනකරුගේ, ණයවරලිපිය
(5) අපනයනකරුගේ, ආනයනකරුගේ, අපනයනකරු, ආනයනකරුගේ, බැංකු අණකර


14. සුරැකුම්පත් මිල දී ගැනීම හා විකිණීම වාණිජ බැංකු වලින් ලබාදෙන,

(1) තැම්පතු ආශ්‍රිත සේවාවකි.
(2) නියෝජිත සේවාවකි.
(3) විද්‍යුත් බැංකු සේවාවකි.
(4) උකස් සේවාවකි.
(5) ණයපත් සේවාවකි.

15. චෙක්පත් වර්ග දෙකකි. ඒවා නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) ධාරක චෙක්පත්, විශේෂ චෙක්පත්
(2) සාමාන්‍ය චෙක්පත්, විශේෂ චෙක්පත්
(3) ධාරක චෙක්පත්, විධාන චෙක්පත්
(4) සාමාන්‍ය චෙක්පත්, විධාන චෙක්පත්
(5) විශේෂ චෙක්පත්, විධාන චෙක්පත්

16.




කිරිබත්ගොඩ රුක්මල් ට්‍රේඩර්ස් අධිපති, රුක්මල් අමරසිංහ මහතාගේ නමට ලියන ලද ඉහත රේඛනය සහිත චෙක්පතක් මුදල් කරගැනීම සඳහා ඔබගේ උපදෙස් අපේක්ෂා කරයි. ඔබ ලබාදෙන උපදෙස වන්නේ,

(1) ඕනෑම බැංකුවක බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැකිබවයි.
(2) කිරිබත්ගොඩ මහජන බැංකුවේ රුක්මල් අමරසිංහගේ ගිණුමේ තැම්පත්කර මුදල් කරගත හැක.
(3) ඕනෑම මහජන බැංකු කවුන්ටරයකින් මුදල් කරගත හැක.
(4) කිරිබත්ගොඩ මහජන බැංකුවේ කවුන්ටරයෙන් මුදල් ලබාගත හැක
(5) කිරිබත්ගොඩ මහජන බැංකුවේ ඔහුගේ මිතුරකුගේ ගිණුමේ තැම්පත්කර මුදල් කරගත හැකිය.

17.




ඉහත පරිදි රේඛනය කරන ලද චෙක්පතක්,

(1) කිසිවෙකුට පැවරිය නොහැක
(2) ගනුදෙනු සඳහා භාවිතා කළ නොහැක
(3) පවරන්නාට හොඳ හිමිකමක් ඇත
(4) පවරන්නාගේ හිමිකමට වඩා හොඳ වඩා හොඳ හිමිකමක් පැවැරුම් ලාභියාට ලැබේ.
(5) පවරන්නාගේ හිමිකමට සමාන හිමිකමක් පැවැරුම් ලාභියාට ලැබේ.

18. චෙක්පතකට උපරිම ආරක්ෂාවක් ලබාදීමට නම්,
(1) චෙක්පත ප්‍රවේශම් කරගත යුතුය.
(2) චෙක්පතට විශේෂ රේඛනය යෙදිය යුතුය.
(3) චෙක්පත රේඛනය කළ යුතුය.
(4) චෙක්පත පිටසන් කළ යුතුය.
(5) චෙක්පත සාමාන්‍ය රේඛනය කළ යුතුය.

19. A ප්‍රකාශය: ණය කාඩ්පතක් ලබාගැනීමට බැංකු ගිණුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ.
B ප්‍රකාශය: හර කාඩ්පතකින් ගිනුමේ ඇති මුදල් ප්‍රමාණය තෙක් ගනුදෙනු කල හැක.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,
(1) A හා B සත්‍ය වේ.
(2) A පමණක් සත්‍ය වේ.
(3) B පමණක් අසත්‍ය වේ.
(4) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(5) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

20. විද්‍යුත් මුදල් සඳහා උදාහරණයක් නොවන්නේ,
(1) ණයපත්
(2) හරපත්
(3) ලෝයල්ටි කාඩ්
(4) ස්මාර්ට් කාඩ්
(5) ක්ෂුද්‍ර පත්

**II - කොටස**

1. I. ශ්‍රී ලංකාවේ භාවිතාවන කාසි හා නෝට්ටු ආශ්‍රයෙන් හොඳ මුදලක ලක්ෂණ පැහැදිලි කරන්න.
II. ගෙවීම් පියවීම සඳහා කාසි හා නෝට්ටු වලට අමතරව භාවිතා කරන අනෙකුත් උපකරණ උදාහරණ සහිතව දක්වන්න.

2. I. වර්තමානයේ ගනුදෙනු සඳහා ණය පත් භාවිතය බහුලව සිදු වේ. ණයපත් භාවිතයේ වාසි අවාසි පැහැදිලි කරන්න.
II. චෙක්පතකට අදාල ප්‍රධාන පාර්ශ්ව නම් කර පැහැදිලි කරන්න.

3. ලංකා සෙටිල් පද්ධතිය හඳුන්වා, එහි අන්තර්ගත කොටස් පැහැදිලි කරන්න.

4. මේ වන විට ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික කඩා වැටීම කෙරෙහි මහ බැංකුවේ වගකීම් විරහිත ක්‍රියාකලාපයද හේතු විය. මහ බැංකුවේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් ඇසුරින් එම ප්‍රකාශය විමර්ශනය කරන්න.

5. I. ජංගම ගිණුමක් පවත්වාගෙන යැමෙන් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි **හතරක්** නම් කරන්න.

II. නදීර සේනානායක වරාය ආශ්‍රිතව බහාලුම් ප්‍රවාහන ව්‍යාපාරයක නිරත ව්‍යාපාරිකයෙක් වන අතර ඉදිරි මාසයේ දී බහාලුම් ප්‍රවාහන 3 ක් මිල දී ගැනීමට සැලසුම් සකස් කරමින් සිටින බැවින් කල්බදු පහසුකම් සම්බන්ධව ඔබෙන් විමසා සිටී. ඔහුට කල්බදු පහසුකම් සම්බන්ධව පැහැදිලි කර ඔහුට ඉන් ලැබිය හැකි වාසි **දෙකක්** නම් කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන සම්පත

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 08

## රක්ෂණය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

(1) අවදානම් වර්ග කළ හැකි ආකාර පහත දැක්වේ.

A - රක්ෂණය කළ හැකි අවදානම්

B - රක්ෂණය කළ නොහැකි අවදානම්

අවදානම්වලට අදාළ නිදසුන් කිහිපයක් මෙහි දැක්වේ.

1. නිවසට සොරු ඇතුළු වී රන්භාණ්ඩ රැගෙන යාම.
2. ඔබ සතු මෝටර් රථය අනතුරකට පත්වීම.
3. මෝටර් රථය ක්ෂය වීම
4. ණයගැතියෙකුගෙන් ලැබිය යුතු ණය මුදල නොලැබී යාම.
5. ඉදිරි වර්ෂයේදී ව්‍යාපාරය අලාභ ලැබීම.
6. ව්‍යාපාරයේ පරිගණකය තාක්ෂණිකව යල් පැනීම.

ඉහත A හා B අවදානම් වර්ගවලට අදාළව ඉහත නිදසුන් නිවැරදිව ගැලපූ පිළිතුරු වරණය කුමක් ද?

(1) A - 3,5,6 B - 1,2,4
(2) A - 1,2,3 B - 4,5,6
(3) A - 1,2,4 B - 3,5,6
(4) A - 4,1,6 B - 2,3,5
(5) A - 3,4,5 B - 1,2,6

(2) රක්ෂණය කළ හැකි අවදානමක තිබිය යුතු ලක්ෂණයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) පුරෝකථනය කළ හැකි බව, මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි බව, නියත නොවීම, සම්බන්ධතාවලින් තොරවීම, සත්‍යාපනය කළ හැකි වීම.
(2) පුරෝකථනය කළ හැකි බව, සම්බන්ධතාවලින් යුක්ත වීම, මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි වීම, නියත නොවීම, සත්‍යාපනය කළ හැකිවීම.
(3) නියතවීම, පුරෝකථනය කළ හැකි බව, සම්බන්ධතාවලින් තොරවීම, මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි බව, සත්‍යාපනය කළ හැකිවීම.
(4) සම්බන්ධතාවලින් තොරවීම, පුරෝකථනය කල නොහැකි බව, මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකිවීම, නියත නොවීම, සත්‍යාපනය කළ නොහැකිවීම.
(5) පුරෝකථනය කළ නොහැකි බව, මූල්‍යමය වශයෙන් තක්සේරු කළ නොහැකි වීම, නියත වීම, සම්බන්ධතාවලින් යුක්ත වීම, සත්‍යාපනය කල නොහැකි වීම.

(3) රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නීතියට එකඟ නොවීම, ප්‍රතික්ෂේප කිරීම, නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස, යෝජනාව, නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ හැකියාව.

(2) නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ නොහැකියාව, යෝජනාව, පිළිගැනීම, නීතියට එකඟ බව, නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස.

(3) නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස, යෝජනාව, පිළිනොගැනීම, නීතියට එකඟ බව, නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ හැකියාව.

(4) නීතියට එකඟ වීම, නෛතික බැඳීමක් ඇති කර ගැනීමට අදහස් නොකිරීම, යෝජනාව, නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ හැකියාව.

(5) නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස, යෝජනාව, පිළිගැනීම, නීතියට එකඟ බව, නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ හැකියාව.

(4) පහත සඳහන් වන්නේ සිද්ධි කිහිපයකි.

A - සහන්ගේ එකම නෑයා වැඩිහිටි සොහොයුරා වුවත්, ඔහුගේ ජීවිතය සහන්ට රක්ෂණය කළ නොහැකිය.

B - රංජනී රක්ෂණ ඔප්පුව ලබාගන්නා විට සිය රෝගී තත්ත්වය වසන් කළ නිසා වන්දි නොලැබේ.

C - දේවක සිය මෝටර් රථය රු. ලක්ෂ 15 කට රක්ෂණය කළත් සිදු වූ හානියට වන්දි වශයෙන් ලබාදිය හැක්කේ රු. ලක්ෂ 2 ක් පමණක් බව රක්ෂණ ආයතනය දැන්වීය.

D - වන්දි ගෙවීමට පෙර අනතුරින් හානි වූ දිනේෂ්ගේ මෝටර් රථයේ සුන්බුන් රක්ෂණ ආයතනයට බාරදිය යුතු විය.

E - ගිනි හානි උපද්‍රවය පමණක් ආවරණය වූ මාලකගේ නිවසට කැරලි කෝලාහල නිසා සිදු වූ හානියට වන්දි ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කළේය.

ඉහත A සිට E දක්වා එක් එක් සිද්ධියට අදාළ රක්ෂණ මූලධර්මය පිළිවෙලින් නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

(1) උපරිම විශ්වාසය/ හානිපූර්ණය/ ආදේශනය/ ආසන්නතම හේතුව/ රක්ෂණ හිමිකම

(2) රක්ෂණ හිමිකම/ හානිපූර්ණය/ ආදේශනය/ ආසන්නතම හේතුව/ දායකත්වය

(3) උපරිම විශ්වාසය/ හානිපූර්ණය/ දායකත්වය/ ආසන්නතම හේතුව/ රක්ෂණ හිමිකම

(4) රක්ෂණ හිමිකම/ උපරිම විශ්වාසය/ හානි පූර්නය/ ආදේශනය/ ආසන්නතම හේතුව

(5) උපරිම විශ්වාසය/ හානිපූර්ණය/ දායකත්වය/ ආසන්නතම හේතුව/ රක්ෂණ හිමිකම

(5) ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් අදාළ වන මූලධර්ම පමණක් සඳහන් පිළිතුරු ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) රක්ෂණ හිමිකම/ උපරිම විශ්වාසය/ දායකත්වය

(2) උපරිම විශ්වාසය/ රක්ෂණ හිමිකම/ හානිපූර්ණය

(3) රක්ෂණ හිමිකම/ උපරිම විශ්වාසය/ ආසන්තම හේතුව

(4) දායකත්වය/ ආදේශනය/ ආසන්නතම හේතුව

(5) උපරිම විශ්වාසය/ ආදේශනය/ ආසන්නතම හේතුව

(6) පහත සඳහන් වන්නේ විවිධාකාර ස්වරූපයේ අවදානම්ය.

1. කමලා වැන්දඹු ලිපිකාරිනියකි. ඇයට දරුවන් දෙදෙනෙකු සිටින අතර ස්වාමියාගේ නිවස සහ වාහනය ඇය සතුය.
2. තේ කර්මාන්ත ශාලාවක් හිමි මහීපාල සිය සේවකයන්ට වැටුප් ගෙවීමට මාසිකව කොළඹ සිට මුදල් රැගෙන නුවරඑළියට යයි.
3. ඇඟළුම් අලෙවි සැලක් පවත්වාගෙන යන සේනාරත්නගේ ඇඟළුම් නිෂ්පාදනාගාරය කළු ගං මිටියාවතේ පිහිටා තිබේ.
4. ප්‍රමිලා නිතර සිය ගනුදෙනුකරුවන්ට ණයට භාණ්ඩ අලෙවි කරයි. ඇතැම් ගනුදෙනුකරුවෝ පවතින ආර්ථිකය තුළ ණය මුදල් පියවීමට මැලිකමක් දක්වයි.
5. ස්වර්ණාභරණ වෙළෙඳ සැලක් පවත්වාගෙන යන නාලකගේ ව්‍යාපාරයට යාබද ව්‍යාපාරයට පසුගිය සතියේ සොරුන් ඇතුළු විය.

1 – 5 දක්වා මෙම එක් එක් අවදානම ආවරණය සඳහා පහත සඳහන් රක්ෂණ ඔප්පු ලබාගත යුතු නම්, එම අවදානම් වලට අනුව රක්ෂණ ඔප්පු පිළිවෙලින් නිවැරදිව ගැලපූ පිළිතුර තෝරන්න.

a. - ණයගැති රක්ෂණ ඔප්පුව
b. - ජීවිත රක්ෂණ ඔප්පුව
c. - මාර්ගස්ථ මුදල් රක්ෂණ ඔප්පුව
d. - සොරබිය රක්ෂණ ඔප්පුව
e. - ගිනි හානි රක්ෂණ ඔප්පුව

(1) a, b, c, d, e
(2) e, d, c, b, a
(3) b, c, e, a, d
(4) a, c, d, b, e
(5) e, d, c, a, b

(7) ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය සහිත පිළිතුර තෝරන්න.

(1) ජීවිත රක්ෂණයේදී අවදානම නියත වේ.
(2) ජීවිත රක්ෂණයට හානිපූර්ණ මූලධර්මය අදාළ නොවේ.
(3) ජීවිත රක්ෂණය ඉතිරි කිරීමකි.
(4) ජීවිත රක්ෂණය ආරක්ෂණයකි.
(5) දරුවාගේ ජීවිතය දෙමාපියන්ට රක්ෂණය කළහැකිය.

(8) පහත සඳහන් වන්නේ සමුද්‍රීය රක්ෂණයේ මූලික කොටස් දෙක සහ එම රක්ෂණාවරණ යටතේ ලබාගත හැකි ඔප්පු වර්ග කිහිපයකි.

| රක්ෂණ වර්ගය | රක්ෂණ ඔප්පු |
|---|---|
| A - නැව්කඳ රක්ෂණය<br><br>B – නැව් බඩු රක්ෂණය | 1 ඇගයූ ඔප්පුව<br>2 සියළු අවදානම් ඔප්පුව<br>3 අනාගත ආවරණ ඔප්පුව<br>4 අලුත්වැඩියා ඔප්පුව<br>5 පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව<br>6 විවෘත ඔප්පුව |

A හා B එම රක්ෂණාවරණ, රක්ෂණ ඔප්පු සමඟ පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) A -1 ,2, 3 / B 4, 5, 6
(2) A- 2, 4 ,5 / B 1, 3, 6
(3) A- 1, 3, 6 / B 2, 4, 5
(4) A -4, 5, 6 / B 1, 2, 3
(5) A - 2, 3, 5/ B 1, 4, 6

(9) පහත සඳහන් වන්නේ මෝටර් රථවාහන රක්ෂණයට අදාළ විස්තර කිහිපයක් සහ ඒවාට අදාළ මෝටර් රථවාහන ඔප්පු වර්ගයි.

| විස්තරය | ඔප්පු වර්ගය |
|---|---|
| A - අදාළ වාහනයට වාහනයේ ගමන් ගත් පුද්ගලයන්ට හා දේපළවලට සිදුවන හානි ආවරණය කරයි. | 1. අවම තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පුව |
| B - අදාළ වාහනයට ගින්නෙන් හා සොරකම් මඟින් සිදුවන හානිවලට අමතරව බාහිර පුද්ගලයන්ට හා දේපළවලට වන හානි ආවරණය කරයි. | 2. විස්තීරණ රක්ෂණ ඔප්පුව |
| C - බාහිර පාර්ශ්වයන්ට හා දේපලවලට පමණක් සිදුවන හානි ආවරණය කරයි. | 3. තෙවන පාර්ශ්ව ගිනි හා සොරකිය රක්ෂණ ඔප්පුව |

ඉහත සඳහන් විස්තර සහ රක්ෂණ ඔප්පු නිවැරදිව ගලපා ඇති පිළිතුර සහිත වරණය තෝරන්න.

(1) A – 1 B – 2 C – 3
(2) A – 3 B – 2 C – 1
(3) A – 1 B – 3 C – 2
(4) A – 2 B – 3 C – 1
(5) A – 2 B – 1 C – 3

(10) වගකීම් රක්ෂණය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සේවා වගකීම් රක්ෂණය සේව්‍යාගේ කාර්යක් ඉටු කිරීමකි.
(2) පොදු වගකීම් රක්ෂණය දේපළ අයිතිකරුවන් හෝ ව්‍යාපාරිකයන් ලබාගන්නා රක්ෂණාවරණයකි.
(3) නිෂ්පාදිත පරිභෝජනයේදී පාරිභෝගිකයාට සිදුවිය හැකි හානි ආවරණයට අලෙවිකරු විසින් නිෂ්පාදන වගකීම් රක්ෂණය ලබාගනියි.
(4) ගොඩබිම භාණ්ඩ ප්‍රවාහනයේදී ඇතිවිය හැකි හානි ආවරණයට මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය ලබාගනී.
(5) මුදල් එක් ස්ථානයකින් තවත් ස්ථානයකට රැගෙනයාමේදී ඇතිවිය හැකි හානි ආවරණයට මාර්ගස්ථ මුදල් රක්ෂණය ලබාගනී.

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචනය/වචන යොදා හිස්තැන් පුරවන්න.**

(11) (a) රක්ෂණයේදී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළහැකි ......................සිදුවීමට ඇති ඉඩකඩ ...................... ලෙස හැඳින්වේ.

(b) රක්ෂණ ආවරණයක් ලබාගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන ......................රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු දෙපාර්ශවය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාවය......................

(12) (a) රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් ......................සහ ...................... විසින් හෙළිදරව් කළ යුතු රක්ෂණ ගිවිසුමට අදාළ සියළු තොරතුරු සද්භාවයෙන් යුක්තව හෙළිදරව් කිරීම උපරිම විශ්වාසයයි.

(b) එක් රක්ෂණ සමාගමක් භාර ගන්නා අවදානම, තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම ......................වන අතර විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාරදීම ...................... ලෙස හැඳින්වේ.

(13) (a) ජීවිත රක්ෂණයේ අරමුණ වන්නේ ......................අකර්මන්‍යතාවය හෝ මහළුවියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදුවිය...................... වෙනුවෙන් ආරක්ෂාව සැලසීමයි.

(b) ජීවිත රක්ෂණ......................ක් වන අතර සෙසු රක්ෂණ සඳහා ......................ලබාගත හැක්කේ හානියක් සිදුවුව හොත් පමණි.

(14) (a) රක්ෂණයේදී යම්කිසි හානියක් සම්බන්ධව ඇති වන අනෙකුත් අලාභ ...................අලාභ නම් වේ.

(b) මුහුදු මාර්ග ප්‍රවාහනයේදී ...................... හා ......................සිදුවිය හැකි හානි වෙනුවෙන් සමුද්‍රිය රක්ෂණය ලබාගත හැකිය.

(15) මෝටර් රථයක් මහා මාර්ගයේ ධාවනය කිරීම සඳහා ...................... රක්ෂණ ඔප්පුව ලබා ගැනීම අනිවාර්ය වන අතර, ......................ඔප්පුව මඟින් අදාළ වාහනයට එහි ගමන් ගන්නා පුද්ගලයන්ට හා දේපළවලට වන හානි ආවරණය කරයි.

❖ **පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න.**

(16) රක්ෂණය කළ නොහැකි අවදානම් සඳහා උදාහරණ 4 ක් ඉදිරිපත් කරන්න.

(17) රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්ව ගණන කීයද? එම පාර්ශ්ව නම් කරන්න.

(18) රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග 4 ක් නම් කරන්න.

(19) රක්ෂණ මූලධර්ම නම් කරන්න.

(20) පහත සඳහන් එක් එක් අවස්ථාව සඳහා ලබාගැනීමට සුදුසු රක්ෂණ ඔප්පු වර්ග නම් කරන්න.

1. නිෂ්පාදිත පරිභෝජනයෙන් පාරිභෝගිකයාට සිදුවිය හැකි හානි ආවරණ සඳහා
2. සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවිය හැකි හානි ආවරණය සඳහා
3. දේපළ හා ව්‍යාපාරවලින් සිදුවිය හැකි අහඹු සිද්ධීන් නිසා තෙවන පාර්ශ්වයන්ට සිදුවිය හැකි හානි ආවරණය සඳහා
4. ගොඩබිමින් භාණ්ඩ ප්‍රවාහනයේදී සිදුවිය හැකි හානි ආවරණය සඳහා

(21) රක්ෂණ ගිවිසුමක් ඇති වන්නේ රක්ෂණය ලබාගැනීමට අපේක්ෂිත පුද්ගලයා විසින් ඉදිරිපත් කරන යෝජනාව රක්ෂණ ආයතනය පිළිගැනීමෙනි.

(1) (a) රක්ෂණ ගිවිසුමක් වලංගුවීම සඳහා පැවතිය යුතු මූලිකාංග නම් කරන්න.

(b) "රක්ෂණය අවදානම් ඒකරාශී කිරීමකි." පැහැදිලි කරන්න.

(2) පහත සඳහන් එක් එක් අවස්ථාවට අදාළවන රක්ෂණ මූලධර්මය සඳහන් කරන්න.

A - රක්ෂණ ආයතන තුනක රු. ලක්ෂ 10 බැගින් රක්ෂණය කරන ලද සහන්ගේ මෝටර් රථය අනතුරකට පත් වූ අතර, වන්දිය රු. ලක්ෂ 6 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර, සියළු රක්ෂණ ආයතන එම වන්දි මුදල සමානුපාතිකව දරාගන්නා ලදී.

B - වන්දි ගෙවීමට පෙර අනතුරෙන් හානියට පත් වූ අකලංකගේ ලොරියේ සුන්බුන්, රක්ෂණ ආයතනයට භාරදිය යුතුවිය.

C- කුමාර සිය එකම පුතුගේ ජීවිතය රක්ෂණය කිරීමට රක්ෂණ ආයතනයකට යෝජනා කළත්, එම ආයතනය එම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

D - රු. මි. 2 ක ගිනි හානි රක්ෂණ ඔප්පුවක් ලබාගෙන තිබූ දේවකගේ නිවස ගිනිගත් අතර, හානිය රු. ලක්ෂ 5 ක් යැයි ඇස්තමේන්තු කර දේවකට වන්දි ගෙවන ලදී.

(22) ජීවිත රක්ෂණය, සාමාන්‍ය රක්ෂණයෙන් වෙනස් වන්නේ කෙසේද?

(23) කිසියම් පුද්ගලයෙකුට හෝ දේපොළකට ගින්නෙන් සිදුවිය හැකි හානි ආවරණයට ගිනිහානි රක්ෂණය ලබාගත හැකිය.

(1) එම ගිනිහානි රක්ෂණය යටතේ ආවරණය කර ගත හැකි වෙනත් අවදානම් 4 ක් නම් කරන්න.

(2) සමුද්‍රීය රක්ෂණය මඟින් ආවරණය වන ප්‍රධාන හානි වර්ග මොනවාද?

(24) රක්ෂණ සේවාව ව්‍යාපාරවල පැවැත්මට දායක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(25). (1) ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලෙන රක්ෂණ සමාගම් සඳහා නිදසුන් හතරක් නම් කරන්න.

(2) රථ වාහන රක්ෂණය සම්බන්ධයෙන් වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවනතා දෙකක් නම් කරන්න.

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

09

## සන්නිවේදනය

**I කොටස**

1 සිට 05 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. සන්නිවේදන මූලිකාංග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) යවන්නා, පණිවුඩය, මාධ්‍ය, වේගවත් බව, ලබන්නා
   (2) අදහස, සංකේතකරණය, පණිවිඩය, විසංකේතකරණය, ප්‍රතිචාරය
   (3) පූර්ණ බව, සංක්ෂිප්ත බව, නිශ්චිත බව, නිවැරදි බව, අවම පිරිවැය
   (4) ලබන්නා, අරමුණු, ප්‍රතිචාරය, ප්‍රතිපෝෂණය, පැහැදිලි බව
   (5) ශබ්ද, වේගවත් බව, මාධ්‍ය, යවන්නා, ලබන්නා

2. සමාජයීය කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන්නේ,
   (1) සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා
   (2) මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීම සඳහා
   (3) ජාත්‍යන්තර වශයෙන් සිදුවන සිදුවීම් පිළිබඳව ක්ෂණික ව දැන ගැනීම සඳහා
   (4) අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා
   (5) රැකියා ඇබෑර්තු දැනගැනීම සඳහා

3. පහත දැක්වෙන්නේ සන්නිවේදන ,මාධ්‍ය හා ඒවා යොදා ගන්නා ආකාර කිහිපයකි.

| සන්නිවේදන බාධා | ආකාර |
|---|---|
| Aවාචික විද්‍යුත් | P ක්‍රිකට් විනිසුරුවෙක් තීරණය ලබා දීම |
| Bලිඛිත විද්‍යුත් | Q ශබ්ද විකාශන යන්ත්‍ර |
| C ලිඛිත විද්‍යුත් නොවන | R විද්‍යුත් තැපැල |
| D සංඥා හා සංකේත විද්‍යුත් | X මෙමෝ පත්‍ර |
| E සංඥා හා සංකේත විද්‍යුත් නොවන | Y විදුලි සංඥා පුවරුව |

සන්නිවේදන බාධා සහ ඒවා ඇතිවන ආකාරය නිවැරදිව ගැලපූ පිළිතුර වන්නේ
   (1) AQ /BR/ CY/ DP/ EX
   (2) AQ /BX /CR /DY /EP
   (3) AQ /BR/ CX/ DY/ EP
   (4) AQ/ BX/ CP/ DY/ ER
   (5) AQ/ BR /CX/ DP/ EY

4. සීබ්‍රා පෞද්ගලික සමාගමේ හතරවන මහලේ ඇති වූ හදිසි ගින්න එහි අනතුරු ඇඟවීමේ විදුලි සීනු නාද වීම සහ ආරක්ෂක නිලධාරීන් යුහුසුළුව 110 ගිනි නිවීමේ රථ ගෙන්වා ගත් නිසා සිදුවීමට ගිය මහත් විනාශයක් වළකාගත හැකි විය.
ඉහත සිද්ධියට අදාළව සීබ්‍රා ආයතනය යොදාගත් සන්නිවේදන මාධ්‍ය ඇතුලත් නිවැරදි පිළිතුර වනුයේ,
   (1) විද්‍යුත් අභ්‍යන්තර සංඥා හා සංකේත, වාචික විද්‍යුත් බාහිර
   (2) අභ්‍යන්තර සංඥා හා සංකේත, වාචික විද්‍යුත් නොවන
   (3) සංඥා හා සංකේත, වාචික විද්‍යුත් අභ්‍යන්තර
   (4) අභ්‍යන්තර සංඥා හා සංකේත බාහිර වාචික
   (5) විද්‍යුත් සංඥා හා සංකේත වාචික බාහිර

5. සන්නිවේදන ක්ෂේත්‍රය තුළ මෑත කාලීනව වර්ධනය වූ නව ප්‍රවණතාවක් වන්නේ,
   (1) සංඥා හා සංකේත රූප සටහන් මහා මාර්ග සඳහා යොදාගැනීම.
   (2) ජංගම දුරකථන තාක්ෂණයේ ඇති වූ වර්ධනය.
   (3) සන්නිවේදන කටයුතු සඳහා වැඩි වශයෙන් අන්තර්ජාල තාක්ෂණය යොදා ගැනීම.
   (4) ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් ලිඛිත සන්නිවේදන ක්‍රමයන් සම්පූර්ණයෙන් භාවිතයෙන් ඉවත් වීම.
   (5) ව්‍යාපාරික සන්නිවේදන කටයුතු සම්පූර්ණයෙන්ම ජාලගත ආකාරයට සිදු කිරීම.

සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

6. එක් පාර්ශ්වයක් ,......................... යැවීම ලැබීම හා .......................... සන්නිවේදනයයි.
7. පණිවිඩය ලබන්නා විසින් ඇසුන හෝ කියවූ දෙය පිළිබඳව ප්‍රතික්‍රියා දැක්වීම ............................වන අතර පණිවිඩය යවන්නාට ලබාගත් ලබන්නා ගෙන් ලැබෙන ප්‍රතිචාරය.............................. යි.
8. ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය සිදුවන ආකාරය අනුව........................................... හා.................................. ලෙස වර්ග කළ හැකිය.
9. පණිවිඩය මාධ්‍යයට ඇතුළු කළ හැකි වන පරිදි සැකසීම ...................................වන අතර අදහසක් ගෙන දෙන ආකාරයට පණිවිඩය පරිවර්තනය කර ගැනීම ........................................යි.
10. මාධ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් පරිගණක භාවිතයෙන් ඒකාබද්ධ කිරීමේ පහසුකම් සලසන තාක්ෂණය ................................ වේ. දුරස්ථ ස්ථානවල සිටින දෙදෙනෙක් හෝ වැඩි දෙනෙක් ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට පරිගණක ජාල ඔස්සේ සංවාද පැවැත්වීම ........................................ යි.

පහත ප්‍රශ්න වලට කෙටි හා නිශ්චිත පිළිතුරු සපයන්න.

11. ව්‍යාපාරික කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර හතරක් දක්වන්න.
12. ව්‍යාපාරයක කළමනාකරුවෙකුට ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට සන්නිවේදනය උපකාරී වන ආකාර හතරක් දක්වන්න.
13. සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග හතරක් දක්වන්න.
14. පහත අවස්ථාවන්ට වඩාත් උචිත යැයි ඔබ යෝජනා කරන සන්නිවේදන ක්‍රම කවරේද?
   (a) කර්මාන්තශාලාවක ඇතිවන හදිසි අනතුරු දැන්වීම
   (b) සේවකයෙක් තනතුරෙන් උසස් කළ බව දැන්වීම
   (c) ආයතනයේ අභ්‍යන්තර දෙපාර්තමේන්තු අතර තොරතුරු හුවමාරු කර ගැනීම
   (d) පාසලේ දෛනික පුවත් ඉදිරිපත් කිරීම
   (e) පාසල් දරුවන්ගේ දක්ෂතා හා කුසලතා ඇගයීම හා සහතිකපත් ලබාදීම
15. පණිවිඩයක් සකස් කිරීමේදී සැලකිලිමත් වන කරුණු හතරක් දක්වන්න.
16. ව්‍යාපාරයක් සන්නිවේදන මාධ්‍යයක් හා ක්‍රමයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් දක්වන්න.


17. සන්නිවේදන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.
18. සන්නිවේදනය සන්නිවේදන මාධ්‍ය අනුව වර්ගකල හැකි ආකාර දක්වන්න.
19. පහත දැක්වෙන්නේ එක්තරා ආයතනයක් තම ව්‍යාපාරික කටයුතු සඳහා සන්නිවේදනය යොදාගත් ආකාර කිහිපයකි. එම කාර්යයන්ට ගැලපෙන පරිදි පහත වගුව සම්පූර්ණ කරන්න.

| ව්‍යාපාරික කාර්ය | ව්‍යාපාරික පරිසරය | තාක්ෂණය | මාධ්‍ය |
|---|---|---|---|
| රැකියා අයදුම් කරුවන් දස දෙනකුට සම්මුඛ පරීක්ෂණයට කැඳවීම ට දුරකථන පණිවිඩ ලබා දීම | බාහිර | විද්‍යුත් | වාචික |
| විදුලි ඉංජිනේරුවරයා ලෙස තෝරාගත් යමෙක්ට පත්වීම් ලිපිය භාර දීම | | | |
| පවතින covid වසංගතය නිසා කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම මාර්ගගත ආකාරයට පැවැත්වීම | | | |
| ආයතනයේ නිෂ්පාදිත කෘතිම බීම බෝතල්වල අසුරන වල සීනි මට්ටම පෙන්වන ලාංඡන ඇතුලත් කිරීම | | | |
| ව්‍යාපාරික ස්ථානයේ වර්ෂා අවසාන සුභද හමුව පවත්වන දිනය පිළිබඳ දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම | | | |

20. පහත දැක්වෙන්නේ සන්නිවේදනයේ දී යොදා ගන්නා සංකේත කිහිපයකි. එම සංකේතයන්හි අදහස ලියා දක්වන්න.







වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

## II කොටස

1. ව්‍යාපාරයකට අභ්‍යන්තර සන්නිවේදනය වැදගත් වන ආකාර හතරක් දක්වන්න.
2. ව්‍යාපාර ආයතනයකට බාහිර සන්නිවේදනය වැදගත් වීමට හේතු කවරේද?
3. ශ්‍රී ලංකාවේ බොහෝ ව්‍යාපාරවල සන්නිවේදන කටයුතු දුර්වලව පැවතීමට හේතු හතරක් දක්වන්න.
4. සඵලදායි සන්නිවේදනයකට ඇති බාධා දෙකක් හා ඒවා පිටුදැකීමට යෝජනා දෙකක් සඳහන් කරන්න.
5. වාචික සන්නිවේදන මාධ්‍යයේ වාසි අවාසි කවරේද?
6. ලිඛිත සන්නිවේදනයේ වාසි දෙකක් හා අවාසි දෙකක් දක්වන්න.
7. සංඥා හා සංකේත මාධ්‍යයේ ඇති වාසි අවාසි දෙක බැගින් දක්වන්න.
8. ශ්‍රී ලංකාව තුළ ඉතා සීඝ්‍රයෙන් ජනප්‍රිය වූ සන්නිවේදන උපාංගයක් ලෙස ජංගම දුරකතනය හඳුන්වා දියහැකිය. සන්නිවේදන උපකරණයක් ලෙස ඉහළ ජනප්‍රියත්වයක් ජංගම දුරකථනය අත්කර ගැනීමට හේතු කවරේද?
9. කොවිඩ්19 වසංගත තත්ත්වය තුල ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිතා කරන්නන් කැපී පෙනෙන ලෙස ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය.
   ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද හේතු දක්වන්න.
10. පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් වන ඡන්ද අපේක්ෂකයෙකුට වඩාත් උචිත වන්නේ ලිඛිත සන්නිවේදනයට වඩා වාචික සන්නිවේදනයයි.
    ඉහත ප්‍රකාශය හා එකඟ වන්නේ ද? හේතු දෙකක් ලියා දක්වන්න.
11. මෙවර අපොස උසස් පෙළ සිසුන්ගේ ප්‍රතිඵල ඉහළ නැංවීමට කඳුරට මහා විද්‍යාලය විසින් සංවිධානය කළ සම්මන්ත්‍රණ මාලාවේ ආර්ථික විද්‍යා දේශන සඳහා විද්වත් ආචාර්යවරයෙකුගේ සහාය යටතේ සිදුකළ ද සිසුන් ගේ අදහස වූයේ එම දේශනයේ අපැහැදිලි තැන් කිහිපයක් ඇති බවයි.
    සිසුන්ට දේශනය අපැහැදිලි වීමට හේතු විය හැකි කරුණු කවරේද?
12. දිවයිනේ ප්‍රමුඛ පෙළේ සන්නිවේදන සමාගමක වෙබ් අඩවියේ දැක්වූ රැකියා ඇබෑර්තුවකට සිසිර තම අයදුම්පත ඊමේල් කරන ලදී. ඊට සතියකට පසු අදාල සමාගමෙන් සිසිරට දුරකථන ඇමතුමක් ලබාදී බදාදා දින මාර්ගගත ක්‍රමයට සම්මුඛ පරීක්ෂණය පවත්වන බවත් පෙරවරු 10:30 ට ඊට සම්බන්ධ වන ලෙසත් දැනුවත් කරන ලදී. ඊට අදාළ පිවිසුම විද්‍යුත් තැපැල් ගිණුමට ලබා දෙන බව සඳහන් කළේය.
    a) මෙම සිද්ධියේ සඳහන් වන සන්නිවේදන මාධ්‍යය හා ක්‍රම කවරේද?
    b) සන්නිවේදන ක්‍රමයක් ලෙස විද්‍යුත් තැපැල යොදාගැනීමේ වාසි දෙකක් හා සීමා දෙකක් දක්වන්න.
    c) මාර්ගගත ක්‍රමයට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම නිසා ආයතනයට හා අයදුම්කරුට ලබාගත හැකි වාසි කවරේද?
13. සන්නිවේදනයේ දියුණුව වෙළෙඳපොළ ව්‍යාප්තියට හේතුවී ඇත. ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද?

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

10

## ප්‍රවාහන හා සැපයුම් සේවා

**I කොටස**

1සිට 19 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. ප්‍රවාහන මූලිකාංග හා උදාහරණ නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.
   (1) මාධ්‍ය - දුම්රිය/ මාර්ගය - මහාමාර්ග/ බලය - සූර්යබලය/ ධාරිතාව - ටොන් 1
   (2) මාධ්‍ය - බසය/ පර්යන්තය - බස් නැවතුම/ පිරිවැය - රු. 50.00/ මාර්ගය - මහාමාර්ගය
   (3) මාර්ගය - ගුවන්මාර්ග/ මාධ්‍ය - ගුවන්යානා/ බලය - පෙට්‍රල්/ පර්යන්තය - ගුවන් තොටුපල
   (4) මාධ්‍යය - ලොරිරථ/ මාර්ගය - මහා මාර්ගය/ බලය - ඉන්ධන/ වේගය - පැයට කි.මී. 35
   (5) මාධ්‍යය - රුවල් නැව/ බලය - සුළඟ/ පිරිවැය - රු. 1000.00/ වේගය - පැයට නාවික සැතපුම් 25

2. මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයේ අවාසියක් වන්නේ,
   (1) රට පුරා ව්‍යාප්තව පැවතීම.
   (2) විශාල තොග එකවර ප්‍රවාහනය අපහසු වීම.
   (3) අවශ්‍ය ඕනෑම විටක භාවිතා කල හැකිවීම.
   (4) ගමනාන්තයට ළඟාවීමට නොහැකි වීම.
   (5) ප්‍රවාහන පිරිවැය අධික වීම.

3. දුම්රිය ප්‍රවාහන ක්‍රමයට පමණක් අදාළ අවාසියක් වන්නේ,
   (1) ගමනාන්තයට ළඟාවිය නොහැකිවීම.
   (2) වැඩි කාලයක් ගතවීම.
   (3) අවශ්‍ය ඕනෑම විටක භාවිතා කල හැකිවීම.
   (4) ගාස්තු අඩුවීම.
   (5) මහාමාර්ග ප්‍රවාහනයට වඩා ආරක්ෂාකාරී වීම.

4. ගුවන් ප්‍රවාහන ක්‍රමයේ වාසියක් වන්නේ,
   (1) මාර්ග නඩත්තු පිරිවැයක් නොමැතිවීම.
   (2) ගමනාන්තය දක්වා යොදාගත හැකිවීම.
   (3) ඕනෑම වෙලාවක භාවිතා කල හැකිවීම.
   (4) ප්‍රවාහන පිරිවැය අවම වීම.
   (5) ආරක්ෂාකාරී නොවීම.

5. බණ්ඩාරවෙල සිට කොළඹ මල් සැකසුම් ආයතනයකට නැවුම් මල් ප්‍රවාහනය සඳහා වඩා සුදුසු ප්‍රවාහන මාධ්‍ය වන්නේ,
   (1) දුම්රිය
   (2) බස් රථය
   (3) නැව
   (4) හෙලිකොප්ටරය
   (5) කරත්ත

6. පළතුරු අපනයන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානම් වන ඔබේ මිතුරෙකුට සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීම සඳහා ඔබේ උපදෙස් අවශ්‍යව ඇත. ඔහුට උපදෙස් දීමේදී එම ප්‍රවාහන මාධ්‍ය තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු සාධක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
   (1) පිරිවැය/ වේගය/ ධාරිතාව/ සුරක්ෂිත බව/ දුර ප්‍රමාණය
   (2) භාණ්ඩයේ ස්වභාවය/ දේශපාලන වාතාවරණය/ ධාරිතාව/ දුර ප්‍රමාණය
   (3) මාධ්‍ය/ මාර්ගය/ බලය/ පර්යේෂණය
   (4) පිරිවැය/ දේශගුණය/ ආර්ථිකය/ වේගය/ බලය
   (5) කාලගුණය/ දේශගුණය/ ආර්ථිකය/ වේගය/ බලය

7. කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක වාසි පහතින් දැක්වේ. ඒවා **ව්‍යාපාරිකයාට, පුද්ගලයන්ට, ආර්ථිකයට** ලැබෙන ආකාරය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   A. රැකී රක්ෂා සංවරණය සඳහා.
   B. විදේශ වෙළෙඳාම වර්ධනය වීම.
   C. අමුද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීමට.
   D. සේවා නියුක්තිය වර්ධනය.
   E. නිමි ද්‍රව්‍ය කලට වේලාවට වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට.
   F. සමාජ සම්බන්ධතා ඇති කර ගැනීමට හා පවත්වාගෙනයාමට.

   (1) AB - CD - EF
   (2) AC -BD - EF
   (3) CE -AF - BD
   (4) CE -AB - FD
   (5) CB -DF - AE

8. ගබඩාවක් ස්ථානගත කිරීමේදී සලකා බැලිය යුතු කරුණක් නොවේ.
   (1) ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම චලනය කිරීමේ ඉඩකඩ
   (2) ප්‍රධාන සම්බන්ධතාවලට ආසන්න බව
   (3) ගබඩාකරණ ද්‍රව්‍යයේ ස්වභාවය
   (4) පිරිවැය
   (5) සේවකයින් බහුලව යොදාගැනීම.

9. විධිමත් ගබඩාකරණයක් තුළින් ලබාගත හැකි වාසියක් නොවන්නේ,
   (1) නඩත්තුව හා කළමනාකරණය පහසු වේ.
   (2) ආරක්ෂාකාරී වීම.
   (3) කාලය ඉතිරිවීම.
   (4) පාරිභෝගික ආකර්ෂණය
   (5) ඉඩකඩ ඉතිරිවීම.

10. ගබඩාවකට තොගයක් ලැබීමේ සිට තොග නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
   A. තොග ලැබීම.
   B. පරීක්ෂා කිරීම.
   C. නිවැරදි බව තහවුරු කර ගැනීම.
   D. හඳුනා ගැනීම.
   E. ඉවතින් තැබීම/ පසෙකින් තැබීම.
   F. ගුණත්වය තහවුරු කර ගැනීම.
   G. නිකුත් කිරීම.

   (1) A B D C E F G
   (2) A D B C F E G
   (3) A D B C E F G
   (4) A B D C E F G
   (5) A B C D E F G

11. ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීමේදී භාවිතා කරන උපකරණයක් නොවේ.
   (1) ෆෝක්ලිෆ්ට්
   (2) එක්ස්කැවේටර්
   (3) පැලට් ජැක්ස්
   (4) භාණ්ඩ එහා මෙහා කිරීමේ පටි
   (5) ෆෝක්ලිෆ්ට් ට්‍රක්

12. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහනය සංකීර්ණ වූ පද්ධතියකට නිදසුනක් වන්නේ,
   (1) යුනිලිවර් පාරිභෝගික භාණ්ඩ සපයන ආයතනය
   (2) යුනියන් කෙමිකල්ස් රසායනික ද්‍රව්‍ය බෙදාහරින සමාගම
   (3) ලිට්රෝ ගෑස් සමාගම
   (4) එම්. ඩී. ජෑම් නිෂ්පාදන ආයතන
   (5) බ්‍රිටැනිකා ගුවන් යානා නිෂ්පාදන ආයතනය

13. ප්‍රවාහන හා සැපයුම් සේවා නිසි පරිදි පවත්වාගෙන යාමෙන් අත්වන ප්‍රයෝජනයක් නොවන්නේ,
   (1) නිෂ්පාදිත අඛණ්ඩව වෙළෙඳපොලට සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනාගත හැකිවීම.
   (2) නාස්තිය හා අපතය අවම වීම තුළින් පිරිවැය අවම කරගත හැකිවීම.
   (3) යන්ත්‍ර සූත්‍ර සේවකයන් වෙනුවෙන් දැරීමට සිදුවන අක්‍රීය පිරිවැය අවම වීම.
   (4) තරඟකාරිත්වයට ශක්තිමත්ව මුහුණ දිය හැකිවීම.
   (5) කර්මාන්තය තුළ නායකයා බවට පත්වී, මිල පාලක බවට පත්විය හැකිවීම.

14. ගබඩාවක් ස්ථානගත කිරීමේදී පිරිවැය යන සාධකය සලකා බැලීමේදී පිරිවැය යටතට අයත් නොවන නිර්ණායකය වන්නේ,
    (1) ගබඩා කුලිය
    (2) වාහන නවතා තැබීමේ ඉඩකඩ හා සම්බන්ධ වියදම්
    (3) තොග පිරිවැය
    (4) රක්ෂණ ගාස්තු
    (5) ඇප තැන්පතු

15. ඉතා කුඩා අයිතම පහසුවෙන් ලබාගැනීම සඳහා ඉතා යෝග්‍ය ඇසිරීමේ ක්‍රමය වන්නේ,
    (1) ස්වයංක්‍රීය ඇසුරුම් ක්‍රමය
    (2) තට්ටු දෙකක් අතර අමතර තට්ටු ක්‍රමය
    (3) පසු පසට තල්ලු කරන රාක්ක
    (4) භාණ්ඩ ගොඩවල් වශයෙන් ඇසිරීම
    (5) තට්ටු ඇසුරුම් ක්‍රමය

16. Vender → Manufacture → Wholesale → Retailer → Customer

විකුණුම්කරු → නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

⟵ A ⟶ ⟵ B ⟶

මෙහි දැක්වෙන්නේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක මූලික ක්‍රියාවලි 2 වන අතර ඉන් A අකුරෙන් දැක්වෙන්නේ,

    (1) නිෂ්පාදන ක්‍රියාවලිය අවසාන වූ අවස්ථාවේ සිට නිෂ්පාදිත හෝ අදාළ තොරතුරු අවසාන පාරිභෝගිකයා තෙක් සැපයීම දක්වා වූ චලනයක් (Out bound logistics)
    (2) නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති
    (3) නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත චලනයන්
    (4) අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා වූ චලනයන්
    (5) සමබර වූ ප්‍රවාහන සැපයුම් චලනයන්

17. පහත දැක්වෙන්නේ නිෂ්පාදිත හා ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති කිහිපයකි.

| නිෂ්පාදිත | ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති |
|---|---|
| A. නිව්ඩේල් යෝගට් | 1. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති |
| B. ලාෆ් ගෑස් | 2. සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති |
| C. යුනියන් කෙමිකල් | 3. නිෂ්පාදන අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති |
| D. ටොයෝටා මෝටර් රථ | 4. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති |

නිෂ්පාදිත, ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති නිවැරදිව ගැලපූ විට අදාළ පිළිතුර වන්නේ,

(1) A 2 B 1 C 4 D 3
(2) A 3 B 2 C 1 D 4
(3) A 2 B 1 C 3 D 4
(4) A 2 B 3 C 4 D 1
(5) A 1 B 2 C 3 D 4

18. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් භාණ්ඩ හා සේවා වලට අදාළ තොරතුරු ඉදිරියට හා පසු පසට ගලායාම ඒවායේ ___A___ සිට ___B___ දක්වා කාර්යක්ෂමව හා සඵලදායිව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ___C___ ලෙස හැඳින් වේ. ඉහත හිස්තැන් සඳහා නිවැරදි පිළිවෙළින් පිළිතුරු සපයා ඇති වරණය තෝරන්න.

(1) A පරිභෝජන අවස්ථාව, B ආරම්භක අවස්ථාව, C ප්‍රවාහන හා සැපයුම් සේවා
(2) A ප්‍රවාහන හා සැපයුම් සේවා, B ආරම්භක අවස්ථාව, C පරිභෝජන අවස්ථාව
(3) A ආරම්භක අවස්ථාව, B පරිභෝජන අවස්ථාව, C ප්‍රවාහන හා සැපයුම් සේවා
(4) A ප්‍රවාහන හා සැපයුම් සේවා, B පරිභෝජන අවස්ථාව, C ආරම්භක අවස්ථාව

19. හයිපර් ලූප් සංකල්පය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාගත පුරෝකථනයකි.
(2) වර්තමානයේ ලෝකයේ දියුණු රටවල භාවිතා වන ප්‍රවාහන ක්‍රමයකි.
(3) ඉලොන් මයික්ගේ සංකල්පයකට අනුව අත්හදා බලන ලද්දකි.
(4) බටයක් දිගේ ඇති කරන රික්තකයක් ඔස්සේ ප්‍රවාහනය කරයි.
(5) මෙය හඳුන්වා දෙනු ලැබුවේ බ්‍රිතාන්‍ය ජාතිකයෙකි.

## II කොටස

01. I. "ආර්ථික හා සමාජ සංවර්ධනයේ සහ ගෝලීයකරණයේ ප්‍රධානම උපාංගය ප්‍රවාහනය වේ". ප්‍රවාහනය ව්‍යාපාරවලට හා පුද්ගලයින්ට වැදගත්වන ආකාරය පිළිබඳව කරුණු 2 බැගින් ලියා දක්වන්න.

    II. බහුලව භාවිතාවන ප්‍රවාහන ක්‍රමයක් වන්නේ මහා මාර්ග ප්‍රවාහන ක්‍රමයයි. අනෙකුත් ප්‍රවාහන මාර්ග වලට වලට සාපේක්ෂව මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි අවාසි **දෙකක්** දක්වන්න.

02. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම වෙනුවට එහි අංග කිහිපයක් පමණක් දියුණු කිරීම හේතුවෙන් මේ වන විට බරපතල ප්‍රවාහන ගැටළු වලට මුහුණ දීමට සිදු වී ඇත.ප්‍රවාහණයේ නව ප්‍රවනතා හා අනාගත පුරෝකථන කවරේද?

03. I. සඳු ෆ්ලෝරා ආයතනයට දෛනිකව බණ්ඩාරවෙළ සිට කොළඹට නැවුම් මල් ප්‍රවාහනය

    II. කන්තලේ සිට ගම්පහට මී කිරි ප්‍රවාහනය

    III. ශ්‍රී ලංකාවේ සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ගස්ලබු ප්‍රවාහනය

    iv. මීගමුවේ සිට මහනුවර දක්වා නැවුම් මාළු ප්‍රවාහනය

    පහත අවස්ථා හතරට අදාලව උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

04. කුරුණෑගල පදිංචි සපුමල් බණ්ඩාර තැඹිලි අපනයන කරුවෙකි.ඔහු විසින් ප්‍රදේශය පුරා ගොස් එකතු කර ගන්නා තැඹිලි දිනපතා එක් ස්ථානයකට රැස් කර තැඹිලි ගෙඩි වෙන් වෙන් වශයෙන් ඉටි ආවරණයකින් ආවරණය කර එක් පෙට්ටියකට 6 බැගින් අසුරා අධිශීත බහාලුම් රථයකින් (Freezer Container) කොළඹ වරායට ගෙන ගොස් එහි දී නැව්ගත කරයි.

    I. ඉහත සිදුවීම ඇසුරින් යෝග්‍යා ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේ දී සලකා බලන කරුණු දක්වන්න

    II. ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බලන කරුණු 4 ක් ලියන්න.

05. ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති වර්ග නම් කර පැහැදිලි කරන්න.

06. i. ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු මූලිකාංග නම් කරන්න.

    ii.මහාමාර්ග ප්‍රවාහනය කෙරෙහි බලපාන නෛතික කරුණු 4 ක් නම් කරන්න.

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

11

## වෙළෙඳාම

1 – 15 තෙක් ඇති ප්‍රශ්නවලට සුදුසුම පිළිතුර තෝරන්න.

(1) වෙළෙඳාම පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ම ප්‍රකාශය කුමක්ද?

(1) පුද්ගලයින් දෙදෙනෙක් හෝ වැඩි පිරිසක් අතර සිදුවන භාණ්ඩ හුවමාරුවයි.
(2) යම්කිසි නිෂ්පාදිත භාණ්ඩයක හෝ සේවාවක අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලියයි.
(3) ගැණුම්කරුවෙකු හා විකුණුම්කරුවෙකු අතර කිසියම් ප්‍රතිෂ්ඨාවකට නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවල අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලියයි.
(4) නැවත විකිණීමේ පරමාර්ථයෙන් සිදුකරන වෙළෙඳාම සිල්ලර වෙළෙඳාමයි.
(5) නියෝජිතයින් යොදාගෙන සිදුකරන්නේ තොග වෙළෙඳාමයි.

(2) ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමකදී හෝ විකිණීමකදී තම පෞද්ගලික නමින් එම ගනුදෙනුවල නිරත වන නියෝජිතයා හැඳින්වෙන්නේ මින් කවරෙකු ලෙසද ?

(1) සාධ්‍යකයා
(2) විකුණුම් නියෝජිතයා
(3) කොමිස් නියෝජිතයා
(4) කැපකරු නියෝජිතයා
(5) බ්‍රෝකර්වරු

(3) පහත දැක්වෙන්නේ සිල්ලර වෙළෙන්දා ඉටු කරනු ලබන සේවාවන් තුනකි.

A. ප්‍රදර්ශන පුවරු පෝස්ටර් හා සම්පත් බෙදා දීමෙන් ප්‍රවර්ධනයට සහාය වීම.
B. නව භාණ්ඩ හඳුන්වාදීම සහ අවශ්‍ය අවස්ථාවලදී උපදෙස් ලබාදීම.
C. පාරිභෝගික රුචි අරුචිකම් හා වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු සැපයීම.

ඉහත ABC පිළිවෙළින් කවර පාර්ශව සඳහා ලබාදෙන සේවාවන්ද?

(1) නිෂ්පාදකයා, තොග වෙළෙන්දා, පාරිභෝගිකයා
(2) තොග වෙළෙන්දා, පාරිභෝගිකයා, නිෂ්පාදකයා
(3) නිෂ්පාදකයා , නියෝජිත වෙළෙන්දා, තොග වෙළෙන්දා
(4) තොග වෙළෙන්දා, පාරිභෝගිකයා, පාරිභෝගිකයා
(5) නිෂ්පාදකයා, පාරිභෝගිකයා, තොග වෙළෙන්දා

(4) පහතින් දැක්වෙන්නේ විදේශ වෙළෙඳාමට අදාළ න්‍යාය හා ප්‍රභේද මෙන්ම ඒවාට අදාළ විස්තර කිරීම් වේ.

| විස්තරය | න්‍යාය හා ප්‍රභේද |
|---|---|
| A. විදේශ රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නොගෙන වරාය තුළදී නැවත සැකසීමකින් තොරව අපනයනය කිරීම. | 1. නිරපේක්ෂ න්‍යාය |
| B. රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනවිත් වෙනසකට භාජනය කර හෝ නොකර වෙනත් රටවලට අපනයනය කිරීම. | 2. ප්‍රති අපනයනය |
| C. සාපේක්ෂ අඩු පිරිවැයකින් නිපදවිය හැකි භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බවත් රට තුළ නිපදවීමට වඩා සාපේක්ෂව අඩු පිරිවැයකින් නිපදවිය හැකි භාණ්ඩ ආනයනය කළ යුතු බවත් දැක්වෙන්නේ | 3. අන්තරාල වෙළෙඳාම |
| D. සමාන යෙදවුම් ප්‍රමාණයකින් එක් රටකට වෙනත් රටකට වඩා කාර්යක්ෂම ලෙස නිපදවිය හැකි භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බව දැක්වෙන්නේ | 4. සාපේක්ෂ වාසි න්‍යාය |

A – D දක්වා අදාළ විස්තර පිළිවෙලින් න්‍යාය හා ප්‍රභේද සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ ?

(1) A 3 B 2 C 1 D 4
(2) A 2 B 3 C 1 D 4
(3) A 3 B 2 C 4 D 1
(4) A 4 B 3 C 1 D 2
(5) A 2 B 3 C 4 D 1

(5) ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් හිමි වන්නේ,
(1) ප්‍රති අපනයනයටය.
(2) අන්තරාල වෙළෙඳාමටය.
(3) සෘජු අපනයන වෙළෙඳාමටය
(4) සේවා අපනයනයටය
(5) තානාපති සේවාවන්ටය.

(6) නිදහස් වෙළෙඳාමට සහාය නොදක්වන ආයතනයක් වන්නේ,
(1) ලෝක වෙළෙඳ සංවිධානය WTO
(2) ලෝක සෞඛ්‍ය සංවිධානය WHO
(3) යුරෝපා සංගමය EU
(4) අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය ASEAN
(5) G8 කණ්ඩායම

(7) වර්තමානයේ වඩාත් ජනප්‍රිය වූ සිල්ලර වෙළෙඳ ක්‍රමයකි,
(1) කැටලොග් මඟින් වෙළෙඳාම් කිරීම.
(2) සංචාරක වෙළෙඳුන් වෙළෙඳාම් කිරීම.
(3) විද්‍යුත් සිල්ලර වෙළෙඳාම
(4) සුපිරි වෙළෙඳසැල් මඟින් වෙළෙඳාම
(5) නියෝජිත වෙළෙඳසැල් මඟින් අලෙවිය

(8) විද්‍යුත් වෙළෙඳාමෙහි ඇති වාසි අතරින් ව්‍යාපාරිකයාට පමණක් අදාළ වන වාසිය වන්නේ,

(1) වෙළෙඳපොළ තොරතුරු බහුලවීම
(2) ගනුදෙනුව වේගවත් වීම.
(3) තේරීමට වැඩි භාණ්ඩ ප්‍රමාණයක් ලැබීම.
(4) සාපේක්ෂව භාණ්ඩවල මිල අඩුවීම.
(5) වෙළෙඳපොළකොටස පුළුල් වීම.

පහත සිද්ධිය කියවා 9, 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(9)අපනයනකරුවෙකු වූ ඉන්ද්‍රපාල ට ලැබුණු නෞභාර පත්‍රයෙහි නැව්පති සඳහන් කර තිබුණේ අපනයන භාණ්ඩ තොගය නැවට පටවන අවස්ථාවේදී කැඩීබිඳී පළුදු වී තිබූ බවයි.
නැව්පති විසින් ඉන්ද්‍රපාලට නිකුත් කර ඇත්තේ,

(1) නෞභාරපතකි.
(2) පාරිශුද්ධ නෞභාරපතකි.
(3) තානාපති ඉන්වොයිසියකි.
(4) දූෂ්‍ය නෞභාරපතකි.
(5) ඉන්ඩෙන්ටුවකි.

(10) නැව්පති විසින් ඉන්ද්‍රපාලට ලබාදුන් නෞභාර පත්‍රයේ සඳහන් සටහන ඉවත් කර නව නෞභාර පත්‍රයක් ලබාගැනීම සඳහා ඉන්ද්‍රපාල කළ යුතු වන්නේ,

(1) හානි රක්ෂණ සහතිකයක් ලබාදීමයි.
(2) හානි රක්ෂණ ලිපියක් ලබාදීමයි.
(3) ප්‍රභවස්ථාන සහතිකයක් ඉදිරිපත් කිරීමයි.
(4) ඉන්ඩෙන්ටුව නැව්පතිට ඉදිරිපත් කිරීමයි.
(5) සනීපාරක්ෂක සහතිකය ඉදිරිපත් කිරීමයි.

(11) භාණ්ඩ තොගය නැවට පටවන තෙක් දැරීමට සිදුවන සියළු වියදම් ඇතුළත් කොට සකසා ඇති මිල

(1) CIF මිලයි.
(2) CI මිලයි.
(3) FRF මිලයි.
(4) FOB මිලයි.
(5) TC මිලයි.

(12) මෑත කාලයේ ආනයන භාණ්ඩ කිහිපයක් ආනයනය කිරීම තහනම් කරමින් ගැසට් පත්‍ර නිකුත් කරන ලදී. එසේ ආනයනය තහනම් කරමින් ගැසට් පත්‍ර නිකුත් කිරීමට බලය ඇත්තේ,

(1) ආනයන අපනයන පාලක ජනරාල්වරයාටය.
(2) ජනාධිපතිවරයාටය
(3) නීතිපතිටය
(4) වෙළෙඳ හා විදේශ අමාත්‍ය ලේකම්ටය
(5) අගමැතිටය

(13) ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුමක මූලික අරමුණු වශයෙන් පහත ප්‍රකාශ දී ඇත.

A. ස්ථාවර වෙළෙඳපොළක් හිමි කර ගැනීම.

B. ජාත්‍යන්තර සහයෝගිතාවය වර්ධනය කර ගැනීම.

C. ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීම.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා Bපමණි.
(5) A B C සියල්ලම.

(14) සුරනිමල කිරි කොටුවක් පවත්වාගෙන යන අතර, ඔහුගේ කිරි කොටුවට පැමිණ පලා ලබාගැනීමට පුරුදු වූ ප්‍රදේශයේ ගැණුම්කරුවන් පිරිසක් සිටී. සුරනිමලගේ පාසැල් මිතුරෙකු වූ පියසිරි මුදලාලි සුරනිමලගෙන් පලා ලබාගෙන බයිසිකලයෙන් ගමේ ගෙවල්වලට ගොස් විකුණා ආදායමක් ලබාගනී. එසේම ඔහු ඉරිදා දින පොළට ගෙන ගොස් වෙළෙන්දියන් දෙදෙනෙකුටද පලා විකුණයි.

ඉහත සිද්ධියෙහි පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග කීයක් තිබේද?

(1) එකකි.
(2) දෙකකි.
(3) තුනකි.
(4) හතරකි.
(5) පහකි.

(15) ශ්‍රී ලංකාවේ අපනයන ආදායම් තුළ ඉහළ අගයක් දක්වන ඇඟළුම් කර්මාන්තය අයත් වන්නේ,

(1) අපනයන වෙළෙඳාමටය.
(2) ප්‍රති අපනයන වෙළෙඳාමටය.
(3) ආනයන වෙළෙඳාමටය.
(4) අන්තරාල වෙළෙඳාමටය.
(5) තොග වෙළෙඳාමටය.

16 සිට 25 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(16) රටක දේශසීමාව තුළ සිදුවන වෙළෙඳාම.......................වන අතර, මෙය ප්‍රභේද .......................යුක්ත වේ.

(17) ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී හෝ විකිණීමේදී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් සිදුකරන්නා .......................වන අතර, ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකුණා එම ණය මුදල් එකතු කර දීමට කැපවෙමින් කටයුතු කරන්නා ......................................................... වේ.

(18) අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ අලෙවි කිරීම .......................වන අතර, අන්තර්ජාල වෙබ් අඩවි හරහා අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ අලෙවි කිරීම ....................................................... වේ.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

(19) නිදහස් වෙළෙඳාමට ඇති බාධක ....................... හා.............................................වන ලෙස වර්ග කර දැක්විය හැකිය.

(20) බෙදාහැරීමේ මාර්ගයක් තීරණය කිරීමේදී නිෂ්පාදකයා ....................... හා ....................... පිළිබඳව සලකා බැලිය යුතුය.

(21) බදු නිදහස් වෙළෙඳසැල් (Duty free shop) වල ගනුදෙනු කිරීමට අවසර ඇති පාර්ශ්ව වන්නේ ................................................................ හා ...........................................................................ය.

(22) ආනයනය කරන ලද භාණ්ඩ වරාය තුළදීම වෙනස්වීම්වලට භාජනය කර හෝ නොකර අපනයනය කිරීම .......................වන අතර, මෙහිදී ....................... අය නොකරයි.

(23) ආනයනකරුට භාණ්ඩ තොගය විකිණීම පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම සඳහා අපනයනකරු පිළියෙල කරන ලියවිල්ල .................................................... වෙන අතර, ගැණුම්කරුට මෙහි සඳහන් මිල ගණන් වෙනස් කිරීමට හැකියාව පවතින විට එය ................................................................... ලෙස හඳුන්වයි.

(24) අපනයනය කරනු ලබන භාණ්ඩයන් අදාළ රටේම නිපදවූ බව සහතික කරමින් පිළිගත් වාණිජ මණ්ඩලයක් හෝ අධිකාරියක් නිකුත් කරන ලියවිල්ල............................................ වන අතර අපනයනය කරන භාණ්ඩ නැවට භාරගත් බවත් අදාළ වරායට ගෙන ගොස් භාරදෙන බවත් සටහන් කරමින් නැව්පති නිකුත් කරන ලියවිල්ල................................. යයි.

(25) සංවර්ධනය වෙමින් පවතින රටවලට යුරෝපා වෙළෙඳපොළට පිවිසීම සඳහා .................................. විසින් ලබාදෙන තීරුබදු සහන වැඩපිළිවෙළ ...................................... නමින් හඳුන්වයි.

26 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

(26) දේශීය වෙළෙඳපොළ තුළ නිෂ්පාදකයා තම භාණ්ඩ බෙදාහැරීම් සිදුකරන මාර්ග **හතරක්** දක්වන්න.
(27) දේශීය වෙළෙඳපොළ තුළ භාණ්ඩ සේවා සඳහා ගෙවීම් සිදුකරන ක්‍රම **හතරක්** දක්වන්න.
(28) සිල්ලර වෙළෙඳාම සිදුකරන වෙළෙඳසැල් වර්ග **හතරක්** දක්වන්න.
(29) තොග වෙළෙඳුන් වර්ග **හතරක්** දක්වන්න.
(30) සිල්ලර වෙළෙන්දාගෙන් නිෂ්පාදකයාට ඉටුවන සේවා **හතරක්** දක්වන්න.
(31) තීරුබදු නොවන සම්බාධක **හතරක්** දක්වන්න.
(32) වෙළෙඳසැල් රහිත සිල්ලර වෙළෙඳාම සිදුවන ආකාර **දෙක** දක්වන්න.
(33) ජාත්‍යන්තර වෙළෙඳාමේ දී මිල කියුම්වල මිල ප්‍රකාශ කරන ජනප්‍රිය ක්‍රම **හතරක්** දක්වන්න.
(34) දේශීය වෙළෙඳාමේදී අතරමැදියන් ලෙස ක්‍රියාකරන පාර්ශ්ව කවරේද?
(35) ශ්‍රී ලංකාව අත්සන් කල ද්විපාර්ශ්වීය හෝ බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් **හතරක්** දක්වන්න.
(36) ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව සපයන සේවා **හතරක්** සඳහන් කරන්න.
(37) විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක **හතරක්** දක්වන්න.
(38) අන්තර්ජාලයෙන් භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී මුදල් ගෙවියහැකි ක්‍රම **හතරක්** දක්වන්න.
(39) විද්‍යුත් වෙළෙඳාම ක්‍රියාපටිපාටියට අදාළ පියවර **හතරක්** දක්වන්න.
(40) විද්‍යුත් වෙළෙඳාම සිදුවන ආකාර **හතරක්** දක්වන්න.

(41) පහත දැක්වෙන්නේ e-trade(විද්‍යුත් වෙළෙඳාමේදී) භාවිතාවන සංකේත කිහිපයකි. ඒවායින් අදහස් වන්නේ කුමක්දැයි ඉදිරියෙන් ලියන්න.

I. 

II. 

III. 

IV. 

V. 


VI. 

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

## II කොටස

1. කාබනික පොහොර නිෂ්පාදකයෙකු වන සිසිර එම පොහොර දේශිය වෙළෙඳපොළට මෙන්ම විදේශිය වෙළෙඳපොළටද අපනයනය කරයි.
    a. කාබනික පොහොර දේශීය පාරිභොගිකයා වෙත ලබාදිය හැකි මාර්ග දක්වන්න.
    b. සිසිරගේ අදහස වන්නේ අතරමැදියන් මෙම කාර්යයයෙන් ඉවත් කර නවීන තාක්ෂණික ක්‍රම ඔස්සේ පාරිභෝගිකයන්ට ඍජුව භාණ්ඩ සැපයීමය. එහි වාසි අවාසි සාකච්ඡා කරන්න.
    c. සිසිරට තම විදේශිය ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලබාගැනීමට භාවිතා කළ හැකි ගෙවීම් ක්‍රම කවරේද?
    d. රටක් විදේශ වෙළෙඳාමේ නිරත වීමෙන් ලැබෙන ප්‍රතිලාභ 4 ක් දක්වන්න.

2. සිල්ලර වෙළෙඳාමේ නව ප්‍රවණතාවයකි. විද්‍යුත් සිල්ලර වෙළෙඳාම පාරිභෝගිකයින් අතර විද්‍යුත් සිල්ලර වෙළෙඳාම ජනප්‍රියවීමට බලපා ඇති හේතු සාකච්ඡා කරන්න.

3. වෙළෙඳපොළ තුළ සිදුවන සමහර විෂමාචාර ක්‍රියා රාශියක් සිදුවන්නේ වෙළෙඳපොළ අතරමැදියන් ගෙනි. නමුත් මොවුන් බෙදාහැරීමේ ජාලයෙන් ඉවත් කිරීමට අපහසුය. එසේ වීමට හේතු කවරේදැයි සාකච්ඡා කරන්න.

4. “මෑත කාලයේදී ශ්‍රී ලංකාව විදේශ වෙළෙඳාම තුළින් අත්කර ගත් වාසිවලට වඩා අවාසිදායක තත්ත්වයන් වැඩිය.” මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

5. a. අන්තරාල වෙළෙඳාම හා ප්‍රතිඅපනයන වෙළෙඳාම හඳුන්වන්න.
   b. අන්තර්ජාල වෙළෙඳාමට වඩා ප්‍රති අපනයන වෙළෙඳාමෙහි ඇති වාසි කවරේද ?

6. නිර්මලා වසර කිහිපයක සිට දේශිය වෙළෙඳපොළට ඕකිඩ් මල් සපයයි. මෑතකදී සහභාගි වූ වෙළෙඳ ප්‍රදර්ශනයකදී සිංගප්පූරුවට මල් සැපයීමට ඇණවුමක් ලැබී තිබේ. ඇය සිංගප්පූරුවට මල් අපනයනය කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරන්න.

7. ආනයන පාලනය කිරීමට හේතු දෙකක් හා ආනයන පාලනය කිරීමට රජය ගන්නා ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

8. විදේශ වෙළෙඳාමේ දී භාවිතාකරන ප්‍රභවස්ථාන සහතිකයක ඇති වැදගත්කම හා ප්‍රභවස්ථාන සහතිකය නිකුත් කරන ආයතනය ලියා දක්වන්න.

9. අන්තර්ජාලයේ ව්‍යාප්තිය සන්නිවේදන සංවර්ධනයට පමණක් නොව වෙළෙඳපොළ ප්‍රසාරණයට හේතු විය.
   ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද පිළිතුරට හේතු දක්වන්න.

10. වර්තමාන කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැල් ක්‍රමය අභියෝගයකට ලක්විය. මෙය ජයගැනීමට සිල්ලර වෙළෙන්දා ගත් උපාය මාර්ග කවරේද?

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

12

## කළමනාකරණය

**I කොටස**

1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. හෙන්රි මින්ට්ස්බර්ග්ට අනුව කළමනාකරණ භූමිකා, උප භූමිකා හා ඒවාට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

| භූමිකාව | උප භූමිකා | නිදසුන් |
|---|---|---|
| A. අන්තර් පුද්ගල භූමිකාව<br>B. තොරතුරු භූමිකාව<br>C. තීරණ භූමිකාව | E නියාමන<br>F නායකයා<br>G ව්‍යවසායකයා | H අනුගාමිකයන්ගේ කටයුතු ඇගයීම<br>I නව ව්‍යාපෘති හදුන්වාදීම<br>J තොරතුරු රැස් කිරීම |

කළමනාකරණ භූමිකා, උප භූමිකා සහ ඒවාට නිදසුන් නිවැරදිව දැක්වෙන වරණය වනුයේ,

(1) ABC, EFG, HIJ
(2) AFH , BEJ, CGI
(3) BCA, GFE, JIH
(4) AFH, BGJ, CEI
(5) AEH, BFI, CGJ

2. සීමාසහිත ප්‍රසාද් ඇපරල්ස් සමාගමේ කළමනාකරණ තනතුරු කිහිපයක් පහත දැක්වේ.

A) ප්‍රධාන විධායක | B) අලෙවි කළමනාකරු
C) මූල්‍ය කළමනාකරු | D) උප සභාපති
E) මෙහෙයුම් කළමනාකරු | F) කාර්යාල කළමනාකරු

ඉහත තනතුරු අතුරින් මධ්‍ය කළමනාකරණ මට්ටමක් දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A,B,C (2) B,C,D (3) C,D,E (4) B,C,E (5) C,D,F

3. කළමනාකරණ මට්ටම් හා ඒ ඒ මට්ටමේ කළමනාකරුවෙකු සතු විය යුතු කුසලතා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

   A) අග්‍ර කළමනාකරුවන්ට සංකල්පනාත්මක කුසලතා හා තාක්ෂණ කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.

   B) පළමු පෙළ කළමනාකරුවන්ට තාක්ෂණික කුසලතා වැඩි වශයෙන් පැවැතිය යුතුය.

   C) මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්ට වැඩි වශයෙන් අවශ්‍ය වනුයේ මානව කුසලතාය.

   D) සෑම මට්ටමේ කළමනාකරුවන්ටම මානව කුසලතා එක සේ අවශ්‍ය වේ.

   E) සෑම මට්ටමේ කළමනාකරුවන්ටම සංකල්පනාත්මක කුසලතා එක සේ අවශ්‍ය වේ.

   ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ දැක්වෙන පිළිතුර තෝරන්න.

   1. A හා C  2. B හා C  3. A හා D  4. B හා D  5. B හා E

4. විවිධ කාර්යයන් කිරීම සඳහා හෝ අණ කිරීම සඳහා හෝ සම්පත් බෙදා දීම සඳහා ඇති අයිතිය හඳුන්වන්නේ,

   (1) සමායෝජනය ලෙසය.
   (2) වගකීම ලෙසය.
   (3) දෙපාර්තමේන්තුකරණය ලෙසය.
   (4) කාර්යය පැවැරීම ලෙසය.
   (5) අධිකාරිය ලෙසය.

5. කළමනාකරුවෙකුට බලය ලැබෙන මූලාශ්‍ර කිහිපයක් පහත දැක්වේ.

   A. අධිකාරි බලය
   B. විශේෂඥ බලය
   C. ත්‍යාග දීමේ බලය
   D. දඬුවම් දීමට ඇති බලය
   E. බලපෑම් කිරීමට ඇති බලය

   මේවා අතුරින් පුද්ගලයා මත පමණක් බලය ලැබෙන කාණ්ඩය තෝරන්න.

   (1) A හා B
   (2) B හා D
   (3) A හා D
   (4) B හා E
   (5) D හා E

6. රෝහණ අධිකාරි මහතා පවසන්නේ තම අනුගාමිකයන්ට තීරණ ගැනීමට ඉහළ නිදහසක් ලබාදී ඇති බවයි. මෙහි දැක්වෙන නායකත්ව ශෛලිය වනුයේ,

   (1) ඒකාධිපති
   (2) අවස්ථානුකූල
   (3) නිර්බාධවාදී
   (4) සේවක අභිමුඛ
   (5) කාර්ය අභිමුඛ

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

7. WESTERN BAKERS ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි මහතා පවසන්නේ තම සේවකයින් දිරි ගැන්වීමට පහත සඳහන් අභිප්‍රේරණ ක්‍රම භාවිතා කරන බවයි.

A. ප්‍රසාද දීමනා
B. ආයතනය තුළ නොමිලේ වෛද්‍ය පහසුකම් ලබාදීම
C. සෞඛ්‍ය හා ආරක්ෂණය
D. ණය පහසුකම් ලබාදීම
E. විනෝද චාරිකා සංවිධානය
F. ආයතනයේ භාණ්ඩ සහන මිලට ලබාදීම.

ඒවා අතුරින් මූල්‍යාමය අභිප්‍රේරණ ක්‍රම දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A B F
(2) A D E
(3) A C E
(4) A D F
(5) C D E

8. ඇගළුම් කර්මාන්ත ශාලාවක අලුතෙන් පත්ව ආ මානව සම්පත් කළමනාකරු සිය සේවකයන් අමතා මෙසේ පැවසීය.
"ඔබ සැමගේ වගකීම විය යුත්තේ අප ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට උපරිම කැපවීමෙන් සහය දීමයි. මේ සඳහා දායකවන ඔබගේ සුභ සාධනය වෙනුවෙන් ක්‍රියා කිරීමට ආයතනය බැඳී සිටී." මෙහිදී ඔහු භාවිතා කළ සන්නිවේදනය,

(1) අවිධිමත් සහ තිරස් සන්නිවේදනයයි
(2) විධිමත් සහ තිරස් සන්නිවේදනයයි
(3) අවිධිමත් සහ සිරස් සන්නිවේදනයයි
(4) විධිමත් සහ සිරස් සන්නිවේදනයයි
(5) තිරස් හා සිරස් සන්නිවේදනයයයි

9. පහත සඳහන් වන්නේ ආයතනයක භාවිතා වන විවිධ පාලන ශිල්ප සහ ඒවාට නිදසුන් ය.

| පාලන ශිල්ප ක්‍රම | නිදසුන් |
|---|---|
| 1- වැලැක්වීමේ පාලනය | A - සේවකයන් පුහුණුකර ප්‍රවීනයන් බවට පත් කිරීම |
| 2- ක්‍රියාවලි පාලනය | B - යන්ත්‍ර ක්‍රියා විරහිත වූ පසු අලුත් වැඩියා කිරීම |
| 3- නිවැරදි කිරීමේ පාලනය | C - නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදුවන තත්ත්ව පාලනය |

ඉහත පාලන ක්‍රම හා නිදසුන් නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

(1) 1C 2B 3A
(2) 1A 2B 3C
(3) 1 A 2C 3B
(4) 1B 2A 3C
(5) 1C 2A 3 B

10. පාලන ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලට සඳහන් පිළිතුර තෝරන්න.
    (1) ප්‍රමිත ස්ථාපිත කිරීම/විචලතා හඳුනා ගැනීම/නිවැරදි කිරීම/ක්‍රියාමාර්ග ගැනීම/කාර්යඵල මැනීම
    (2) කාර්යඵල මැනීම/ප්‍රමිති ස්ථාපිත කිරීම/නිවැරදි කිරීම/ක්‍රියාමාර්ග ගැනීම/විචලතා හඳුනා ගැනීම
    (3) ප්‍රමිති ස්ථාපිත කිරීම/කාර්යඵල මැනීම/විචලතා හඳුනාගැනීම/නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම
    (4) නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම/විචලතා හඳුනාගැනීම/කාර්යඵල මැනීම/ප්‍රමිත ස්ථාපනය
    (5) කාර්යඵල මැනීම/ප්‍රමිත ස්ථාපනය කිරීම/නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම/විචලායතා හඳුනාගැනීම

## II කොටස

01. "කළමනාකරණය යනු ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ අරමුණු සඵලදායිව ඉටුකර ගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතුව සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය යන කාර්ය ඇතුලත් ඵලදායි ක්‍රියාවලියකි."
    ඉහත නිර්වචනය තුළ ඇති සංකල්ප නම් කරන්න.
02. පුද්ගලයන්ගේ පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා කළමනාකරණය බලපාන ආකාරය දක්වන්න.
03. හෙන්රි මින්ට්ස්බර්ග් දක්වන පරිදි තීරණ භූමිකාවට අයත් උප භූමිකා නම් කරන්න.
04. සංවිධානයක් තුළ අග්‍ර කළමනාකරුවන් හඳුන්වා ඔවුන්ට අයත් කාර්යයන් දක්වන්න.
05. රොබට් L කර්ට්ස්ට අනුව කළමනාකරුවන් සතුවිය යුතු කුසලතා නම් කරන්න.
06. කළමනාකරුවෙකු සතු වියයුතු සංකල්පනාත්මක කුසලතා හඳුන්වා එයට අයත් කාර්යයන් දක්වන්න.
07. මූලික කළමනාකරණ කාර්යයන් (ශ්‍රිත) නම් කරන්න.
08. "කළමනාකරුවෙකු කරන සියලුම කාර්යයන්හීදී තීරණ ගැනීම ප්‍රධාන වේ." තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළ පියවර දක්වන්න.
09. ව්‍යාපාර අරමුණක තිබිය යුතු ගුණාංග දක්වන්න.
10. සංවිධානකරණයේ පියවර පෙළගස්වන්න.
11. දෙපාර්තමේන්තුකරණය හඳුන්වා දෙපාර්තමේන්තුකරණය කළ හැකි පදනම් දක්වන්න.
12. සංවිධාන ව්‍යුහයක් නිරූපනය වන මූලධර්ම දක්වන්න.
13. බලය ලැබීමේ මූලාශ්‍ර කවරේද?
14. මධ්‍යගතකරණය හඳුන්වා එහි වාසි හා අවාසි වෙන වෙනම දක්වන්න.
15. "සංවිධානයේ සැලසුම් හා සංවිධානයේ යටත් නිළධාරීන්ගේ හැකියාවන් සම්බන්ධකරනු ලබන්නේ නායකත්වය විසින්ය" ඒ අනුව සංවිධානයකට නායකත්වය අවශ්‍ය ඇයිදැයි හේතු දක්වන්න.
16. සාර්ථක නායකයෙකු සතු විය යුතු ගුණාංග දක්වන්න.
17. මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුලත් කාර්යයන් ලෙස අභිප්‍රේරණයේ වැදගත්කම පෙන්වා දෙන්න.
18. "සේවකයන් වැඩට පොළඹවා ගැනීම සඳහා විවිධ අභිප්‍රේරණ ක්‍රම ආයතනය විසින් අනුගමනය කරනු ලැබේ" ඒ අනුව දක්නට ඇති මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම 4 ක් දක්වන්න.
19. ආයතනයකට සන්නිවේදනය වැදගත් වන්නේ කෙසේද ?
20. පාලන ක්‍රියාවලියේ පියවර පෙළගස්වන්න.

නිශ්චිත පිළිතුරු සපයන්න.

01. හෙන්රි මිනිට්ස්බර්ට් අනුව කළමනාකරුවෙකුගේ තීරණ භූමිකාවට අයත් උපභූමිකා නම් කරන්න.
02. සංවිධානයක අග්‍ර කළමනාකරුවන් සතු කාර්යයන් හතරක් සඳහන් කරන්න.
03. මූලික කළමනාකරණ ශ්‍රිතයන් මොනවාද?
04. ව්‍යාපාර අරමුණක තිබිය යුතු ගුණාංග නම් කරන්න.
05. ආයතනයක දෙපාර්තමේන්තුකරණය සිදු කළ හැකි පදනම් 4 ක් දක්වන්න.
06. කළමනාකරුවෙකුට බලය ලැබෙන මූලාශ්‍ර හතරක් ලියන්න.
07. පාලන ක්‍රියාවලියේ පියවර පෙළ ගස්වන්න.
08. අවිධිමත් සන්නිවේදනය තුළින් ව්‍යාපාර සංවිධානයකට ඇති වාසි දක්වන්න.
09. නායකයා කටයුතු කරන ආකාරය අනුව නායකත්ව ශෛලීන් වර්ග කර දක්වන්න.
10. නිෂ්පාදන ආයතනයක පාලනය සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රම නම් කරන්න.

හිස්තැන් පුරවන්න.

01. ආයතනයක් විසින් කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු නිවැරදිව ළඟාකර ගනු ලබන්නේ ද යන්න...............................................ලෙස හැඳින්වෙන අතර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ දී අවම සම්පත් ප්‍රමාණයක් භාවිතා කර උපරිම නිමැවුමක් ළඟා කරගැනීම............................................නම් වේ.

02. සංවිධානයක පරමාර්ථ හා අරමුණු ළඟාකර ගැනීම සඳහා සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා ......................................කරනු ලබන්නා .................................වේ.

03. සංවිධානයක් දිගුකාලයක් තුළ සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂාවන් ......................වන අතර කෙටිකාලයක් තුළදී සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන්නේ......................ය.

04. එක් සේවකයෙකුට එක් සුපරීක්ෂකයෙකුට පමණක් වගකිව යුතුය යන මූලධර්මය................................යන අතර එක් කළමනාකරුවෙකුට සෘජුව වාර්තාකරනු ලබන සහායකයන් සංඛ්‍යාව......................................වේ.

05. සංවිධානයක පුද්ගලයන් අරමුණු කරා යොමු කිරීම සඳහා ..................................අවශ්‍යවේ. කණ්ඩායමක් තුළ සාමාජිකයින් එකමුතුව කටයුතු කිරීම සඳහා ................................ද අත්‍යාවශ්‍ය වේ.

06. අනුගාමිකයන්ගේ අදහස් සැලකිල්ලට ලක්කර කටයුතු කරන නායකයා................................... නායකත්වය වන අතර ඉතා ඉහළ පලපුරුද්දක් හා දැනුමක් ඇති විශේෂඥතා සහිත අනුගාමිකයින් පිරිසක් ඇති අවස්ථාවක.................................................ශෛලිය වැදගත් වේ.

07. නිල සංවිධාන ව්‍යුහය තුළ ගලායන විනිවිදභාවයක් ඇති වාර්තාමය ස්වරූපයෙන් සිදුවන පිළිගත් පැහැදිලි පණිවුඩ හුවමාරු ක්‍රමය ..................................වේ. නිල සංවිධාන ව්‍යුහයට බාහිරින් නිල වශයෙන් නොපිළිගන්නා විනිවිදභාවයක් නොමැතිව තොරතුරු ගලායන්නේ..................නි.

08. ආයතනයක වැඩකටයුතු සිදුවන අතර තුර විචලනයන් වලක්වාගැනීමට ගන්නා ක්‍රියාමාර්ග............................වේ.

ආයතනයක අපේක්ෂිත කාර්යය හා සත්‍ය කාර්ය ඵල අතර ඇති විචලන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.........................................වේ.

09. විවිධ අවස්ථාවන්හි නිරන්තර වෙනස් වීම් වලට භාජනය වෙමින් පවතින අභ්‍යන්තර හා බාහිර පරිසරය......................................... පරිසරයයි.
යම් පරමාර්ථයක් හෝ පරමාර්ථ කිහිපයක් ඉටුකර ගැනීම සඳහා එක්ව වැඩකරන පුද්ගලයන්ගේ එකතුවක්.....................................වේ.

10. අපේක්ෂිත තත්ත්වයන්,පවතින තත්ත්වයන් අතර වෙනසක් පවතින විට එය................................. වන අතර කළමනාකරුවකු කරන සියලුම කාර්යන්හීදි.................ප්‍රධාන වේ.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

13

## මෙහෙයුම් කළමනාකරණය

**I කොටස**

1 සිට 25 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. මෙහෙයුම් කළමනාකරණ කාර්යයන් හා ඒවාට නිදසුන් පහත වගුවේ දැක්වේ.

| කාර්යයන් | නිදසුන් |
|---|---|
| 1. නිෂ්පාදන ඉංජිනේරුකරණය | A - තත්ත්ව පාලනය සිදු කිරීම |
| 2. නිෂ්පාදන සැලසුම්කරණය | B- නිෂ්පාදන කාලසටහන සකස් කිරීම |
| 3. නිෂ්පාදන පාලනය | C-නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු රැස් කිරීම |
| 4. පර්යේෂණ හා සංවර්ධන | D- නිෂ්පාදන කටයුතු ඉදිරි දෙසැම්බර් මස ආරම්භ කිරීම |

1 – 4 දක්වා ඉහත මෙහෙයුම් කළමනාකරණ කාර්යයන් හා අනුපිළිවෙලින් ගැලපෙන නිදසුන් ඇතුලත් පිළිතුර වන්නේ,

(1) A, C, B, D (2) A, D, B, C (3) B, D, A, C (4) B, A, C, D (5)B, C, A, D

2. පරිවර්තන ක්‍රියාවලියට අයත් කාර්යය වන්නේ,
   (1) නව භාණ්ඩ හඳුන්වා දීම
   (2) මෙහෙයුම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම
   (3) නිෂ්පාදන කාලසටහන් සකස් කිරීම
   (4) නිෂ්පාදන ක්‍රම තීරණය කිරීම
   (5) තොග පාලනය සැලසුම් කිරීම

3. ව්‍යාපාර ආයතනයක් විවිධ නිෂ්පාදන ක්‍රම අනුගමනය කිරීමෙන් අත්කරගන්නා වාසි පහත දැක්වේ.
   A. පාරිභෝගික ඉහළ තෘප්තිය
   B. නිෂ්පාදන ක්‍රියාවලිය අනම්‍ය වීම.
   C. අඩු සේවක සංඛ්‍යාවක් යොදාගත හැකිවීම.
   D. වෙළෙඳපොළ අවදානමක් නොමැති වීම.
   E. ගනුදෙනුකරුවන්ගේ වුවමනා ඉලක්ක කර නිපදවීම.

   ඉහත වාසි අතුරෙන් කාර්යය නිෂ්පාදනයේ වාසි ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) A,C,D (2) A, B, E (3) A,D, E (4) B, C, D (5) C, D, E

4. කාර්ය නිෂ්පාදනය හා ප්‍රවාහ නිෂ්පාදනය සැසඳීමේ දී වඩා නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) කාර්ය නිෂ්පාදනය හා ප්‍රවාහ නිෂ්පාදනය ඇණවුමට පමණි.
   (2) නිෂ්පාදන ක්‍රියාවලියේදී කාර්ය නිෂ්පාදනය නම්‍ය වන අතර ප්‍රවාහ නිෂ්පාදනයේදී අනම්‍ය වේ.
   (3) කාර්ය නිෂ්පාදනයේදී නිෂ්පාදන පෙළ විවිධ වන අතර ප්‍රවාහ නිෂ්පාදනයේදී නිෂ්පාදන පෙළ කිහිපයක් පවතී.
   (4) කාර්ය නිෂ්පාදනයේදී නිෂ්පාදන පරිමාණය ඉතා ඉහළ වන අතර ප්‍රවාහ නිෂ්පාදනයේදී එය ඉතා පහළ වේ.
   (5) කාර්ය නිෂ්පාදනයේදී හා ප්‍රවාහ නිෂ්පාදනයේදී ඒකක පිරිවැය පහළ මට්ටමක පවතී.

5. පහත සඳහන් පිරියත සැලැස්ම වර්ග සඳහා ගැලපෙන උදාහරණ සහිත නිවැරදි පිළිතුර තෝරන්න.

| | පිරියත සැලසුම් වර්ග | | උදාහරණ |
|---|---|---|---|
| 1. | ක්‍රියාවලි පිරියත | A. | ගොඩනැගිලි ඉදි කිරීම |
| 2. | නිෂ්පාදිත පිරිවැය | B. | කුඩ නිෂ්පාදනය |
| 3. | කුටි පිරියත | C. | පුවත්පත් මුද්‍රණය |
| 4. | ස්ථාවර ස්ථානීය පිරියත | D. | දියර කිරි බෝතල් නිෂ්පාදනය |

   (1) 1-D, 2-B, 3-C, 4-A
   (2) 1-C, 2-D, 3-A, 4-B
   (3) 1-A, 2-D, 3-B, 4-C
   (4) 1-D, 2-C, 3-B, 4-A
   (5) 1-C, 2-D, 3-B, 4-A

6. ව්‍යාපාරයක ද්‍රව්‍ය මිල දී ගැනීමේ ක්‍රියාවලියේ පියවරයන් පහත දැක්වේ.
   A. ඇණවුම් කිරීම
   B. ද්‍රව්‍ය මිල දී ගැනීමේ දෙපාර්තමේන්තුවට දැනුම් දීම.
   C. සැපයුම්කරුවකු සොයාගැනීම
   D. මුදල් ගෙවීම
   E. භාණ්ඩ ලැබීම

   මිල දී ගැනීම් ක්‍රියාවලියේ පියවර අනුපිළිවලින් නිවැරදිව දැක්වෙන්නේ,
   (1) A,B,C,E,D
   (2) A,D,B,E,C
   (3) B,C,A,E,D
   (4) B,C,E,A,D
   (5) C,A,B,D,E

7. දී ඇති ප්‍රකාශ කියවා නිවැරදි වරණය තෝරන්න.
   ප්‍රකාශය A - කෙටිකාලයකදී නිෂ්පාදන හෝ විකුණුම් හෝ ඒකක ගණන අනුව ස්ථාවර පිරිවැය වෙනස් නොවුනද දිගුකාලයකදී වෙනස් විය හැකිය.
   ප්‍රකාශය B - සමච්ඡේද ලක්ෂ විග්‍රහයේ දී ඇති කරගන්නා උපකල්පන මගින් සීමා ඇති කරයි.
   (1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
   (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
   (3) A හා B දෙකම අසත්‍ය වේ.
   (4) A සහ B සත්‍ය වන අතර B මගින් A තහවුරු කෙරේ.
   (5) A සහ B සත්‍ය වන අතර B මගින් A තහවුරු නොකෙරේ.



වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

8. මල් පෝච්චි නිෂ්පාදකයෙකුගේ මාසයක ධාරිතාව ඒකක 10,000කි. මල් පෝච්චියක විකුණුම් මිල රු.100කි. ඒකකයක විචල්‍ය පිරිවැය රු.50කි. ස්ථාවර පිරිවැය රු.30,000කි. මෙම නිෂ්පාදකයාට එක මසක් තුළ නිෂ්පාදනය කළ හැකි වූයේ මල් පෝච්චි 800ක් පමණක් නම්, ඔහු ලබන ලාභය හෝ අලාභය කොපමණද?
   (1) රු. 80,000 (2) රු. 10,000 (3) රු. 20,000
   (4) රු. 50,000 (5) රු. 40,000

9. කාර්ය නිෂ්පාදනයේ අහිතකර ලක්ෂණයක් නොවන්නේ,
   (1) පිරිවැය ඉහළ වීම.
   (2) විශේෂ මෙවලම් හා උපාංග අවශ්‍ය වීම.
   (3) වෙළෙඳපොළ මුල් කරගෙන නිෂ්පාදන සිදු නොවීම.
   (4) කුසලතා සහිත පුහුණු සේවකයින් අවශ්‍ය වීම.
   (5) වෙළෙඳපොළ අවදානමක් නොමැති වීම.

10. ආයතනයක තත්ත්ව කව ස්ථාපිත කර පවත්වාගෙන යෑම තුළින් වර්ධනය කර ගත හැකි වන්නේ,
   (1) පූර්ණ ඵලදායිතාවයයි.
   (2) යන්ත්‍ර ඵලදායිතාවයයි.
   (3) රැකියාව හා කාර්ය සම්බන්ධ ඵලදායිතාවයයි.
   (4) අමු ද්‍රව්‍ය ඵලදායිතාවයයි.
   (5) සඵලදායකත්වයයි.

11. රජයේ ආයතන සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර විදේශ රටවලින් ගෙන්වා සිදු කර නව තාක්ෂණය භාවිතා කිරීමේ දී මතුවන ගැටලුවක් වන්නේ,
   (1) තාක්ෂණය ශීඝ්‍රයෙන් වෙනස් වීමයි.
   (2) විශාල ආයෝජනයක් අවශ්‍ය වීමයි.
   (3) පුහුණු ශ්‍රමිකයින් නොමැති වීමයි.
   (4) පරිසර දූෂණය මගින් ඇති කරන ගැටලුවයි.
   (5) තාක්ෂණික දෝෂ ඇතිවීම නිසා නිෂ්පාදන ක්‍රියාවලිය අඩාල වීමයි.

12. ආයතනයක මුළු තොග පිරිවැයට අදාල අයිතම කිහිපයක් පහත දැක්වේ.

A - මුරකරු වේතන B - ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ වියදම්
C - තොග ගැනුම් මිල D - තොග වාර්තා තබාගැනීමේ වියදම්
E - තොග හානි වියදම් F - ද්‍රව්‍ය ගෙන ඒමේ වියදම්

ඉහත දෑ අතුරෙන් තොග පවත්වාගෙන යෑමේ වියදම් ඇතුලත් වරණය කුමක් ද?
   (1) A B C (2) A C D (3) A D E (4) B D E (5) C E F

13. ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක පිළියෙළ කළයුතු පිරියත වර්ගය වන්නේ
   (1) නිෂ්පාදන පිරියතයි (2) කුටි පිරියතයි (3) ක්‍රියාවලි පිරියතයි (4) ස්ථාවර ස්ථානීය පිරියතයි (5) කම්හල් පිරියතයි



මාතර ගාලු අධ්‍යාපන කලාපය

14. මොරටු ලී බඩු මාලිගයේ පිරිවැය ලේඛනයක ඇතුලත් වූ අයිතම කිහිපයක් පහත දැක්වේ.

A - ගොඩනැගිලි කුලිය
B - ලී බඩු සඳහා වියදම
C - වඩු කාර්මික වැටුප
D - මුරකරු වැටුප්
E - පොලිෂ් කිරීමේ වියදම්
F - වරිපනම් ගාස්තු

ඉහත දෑ අතුරෙන් ස්ථාවර පිරිවැය වර්ග පමණක් ඇතුලත් වරණය කුමක් ද?

(1) A B D (2) A D F (3) B C E (4) C D E (5) D E F

15. භාණ්ඩ ඇණවුම් කළ අවස්ථාවේ සිට එම භාණ්ඩ ගබඩාවට ලැබීම තෙක් ගතවන කාලයට අදාළ ඒකක ප්‍රමාණය වන්නේ,

(1) යළි ඇණවුම් මට්ටම් ප්‍රමාණය
(2) පොරොත්තු කාල ඉල්ලුම
(3) උපරිම තොග මට්ටම
(4) චක්‍රිය කාලය
(5) අවම තොග මට්ටම

16. නිෂ්පාදන කර්මාන්ත ශාලාවක තොග පාලනය සහ තත්ත්ව පාලනය සඳහා භාවිතා කළ හැකි ශිල්ප ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - ගුණත්ව ප්‍රමිති
B – ABC විශ්ලේෂණය
C - JIT ක්‍රමය
D – ශූන්‍ය දෝෂ
E - සමස්ථ ගුණත්ව කළමනාකරණය
F – සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය

ඉහත දෑ අතුරින් තත්ත්ව පාලන ක්‍රම ඇතුලත් වරණය කුමක් ද?

(1) A B D F
(2) A C D E
(3) A D E F
(4) B D D E
(5) C D E F

17. කාර්ය, කාණ්ඩ හා ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයන්හි පෙළ නිර්ණායකය ලෙස සලකා නිෂ්පාදන ක්‍රම එකිනෙකින් වෙනස්වන ආකාරය නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

| | කාර්ය | කාණ්ඩ | ප්‍රවාහ |
|---|---|---|---|
| (1) | නම්‍යයි | සාමාන්‍යයි | අනම්‍යයි |
| (2) | විවිධයි | කිහිපයකි | එකකි |
| (3) | ඇණවුමට | ඇණවුමට | විශාල තොග |
| (4) | ඉතා පහළ | මධ්‍යම | ඉතා විශාල |
| (5) | අනම්‍යයි | සාමාන්‍යයි | නම්‍යයි |

18. කිසියම් නිෂ්පාදන ආයතනයක නිශ්චිත අනාගත කාලපරිච්ඡේදයක් තුළ කුමන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ යුතුද යන්න තීරණය කරන මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්ය නොවන්නේ,

(1) නිෂ්පාදන ඉංජිනේරුකරණය
(2) ද්‍රව්‍ය බෙදා හැරීම
(3) නිෂ්පාදන පාලනය
(4) නිෂ්පාදන සැලසුම්කරණය
(5) පර්යේෂණ හා සංවර්ධනය

19. පහත වගුවේ විවිධ නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රම කිහිපයක් දැක්වේ.

| නිෂ්පාදිත | නිෂ්පාදන ක්‍රම |
|---|---|
| 1. උපන්දින කේක් | A - කාණ්ඩ නිෂ්පාදනය |
| 2. සිමෙන්ති | B - කාර්ය නිෂ්පාදනය |
| 3. පුවත්පත් | C - ප්‍රවාහ නිෂ්පාදනය |

1-3 දක්වා ඒ ඒ නිෂ්පාදිතය අයත් නිෂ්පාදන ක්‍රමය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) A B C (2) A C B (3) B C A (4) B A C (5) C A B

20. පහත පිළිතුරු අතුරින් උපරිම තොග මට්ටම ගණනය කළ හැකි සමීකරණය කුමක් ද?
(1) යලි ඇණවුම් මට්ටම - (අවම තොග භාවිතය x අවම ඇණවුම් කාලය)+ යලි ඇණවුම් ප්‍රමාණය
(2) උපරිම පරිභෝජන ප්‍රමාණය + අවම පාරිභෝජන ප්‍රමාණය
(3) යලි ඇණවුම් මට්ටම - (උපරිම තොග පාරිභෝජනය x උපරිම පොරොත්තු කාලය) + නැවත ඇණවුම් ප්‍රමාණය
(4) යලි ඇණවුම් මට්ටම - (සාමාන්‍ය තොග භාවිතය x සාමාන්‍ය ඇණවුම් කාලය)
(5) උපරිම තොග සංචිතය x උපරිම ඇණවුම් කාලය


21. නවීන තාක්ෂණය භාවිතා කර ආභරණ නිපදවීම අයත් වන්නේ පහත සඳහන් කුමන නිෂ්පාදන ක්‍රමයටද?
(1) පරිගණක ආධාර නිර්මාණ (CAD)
(2) පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය (CAM)
(3) පරිගණක සමෝධානික නිෂ්පාදන ක්‍රමය (CIM)
(4) පරිගණක අංකිත පාලනය (CMC)
(5) රොබෝ තාක්ෂණය (Robotic Technology)

22. නිෂ්පාදන ක්‍රමයක් තෝරාගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණකි,
(1) පාරිභෝගිකයින් ප්‍රමාණය
(2) වෙළෙඳපොළ වර්ගය
(3) මිල දී ගැනීමේ රටාව
(4) ප්‍රවර්ධන ක්‍රමය
(5) බෙදාහැරීම් මාර්ග

23. සමච්ජේද ලක්ෂ විග්‍රහයේ ප්‍රයෝජනයකි,
(1) යලි ඇණවුම් මට්ටම සොයා ගත හැකි වීම.
(2) යෙදවුම් වල මිල උච්චාවචනය වලක්වා ගත හැකි වීම.
(3) තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම.
(4) ව්‍යාපාරයේ ආදායම වර්ධනය කරගත හැකි වීම.
(5) ආරක්ෂිත ආන්තිකය සොයාගැනීමෙන් පිරිවැය අවම කරගත හැකි වීම.

24. උත්සව සඳහා ආහාරපාන සපයන ආයතනයකට වඩාත් උචිත තොග පාලන ක්‍රමය වන්නේ
(1) අඛණ්ඩව තොග වාර්තා කිරීමේ ක්‍රමය
(2) ABC ක්‍රමය
(3) තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය
(4) JIT ක්‍රමය
(5) පරිගණක වැඩසටහන්

25.




Q1, Q2, Q3 හා T අක්ෂර මගින් නිවැරදිව හා අනුපිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) උපරිම තොග මට්ටම, චක්‍රිය කාලය, පොරොත්තු කාලය, ආරක්ෂිත තොගය
(2) යළි ඇණවුම් ප්‍රමාණය, පොරොත්තු කාල ඉල්ලුම, පොරොත්තු කාලය, ආරක්ෂිත තොගය
(3) අවම තොග මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය, තොග භාවිතා කිරීමේ ශීඝ්‍රතාවය, පොරොත්තු කාලය
(4) යළි ඇණවුම් ප්‍රමාණය, තොග භාවිතා කිරීමේ ශීඝ්‍රතාවය, පොරොත්තු කාල ඉල්ලුම, පොරොත්තු කාලය
(5) යළි ඇණවුම් ප්‍රමාණය, පොරොත්තු කාල ඉල්ලුම, තොග භාවිතා කිරීමේ ශීඝ්‍රතාවය, පොරොත්තු කාලය

## II කොටස

1. I. (අ) මෙහෙයුම් කළමනාකරණය යනු කුමක් ද?
   (ආ) පරිවර්තන ක්‍රියාවලියට අන්තර්ගත ක්‍රියාපටිපාටි හතරක් ලියා දක්වන්න.

   II. (අ) පර්යේෂණ හා සංවර්ධනය යන්න නිර්වචනය කර භාණ්ඩ නිෂ්පාදන ආයතනයකට එය වැදගත්වන ආකාර දෙකක් දක්වන්න.
   (ආ) බිස්කට් නිෂ්පාදන ආයතනයක පිරියත සැලැස්ම සැකසීමේ දී සලකා බලන කරුණු හතරක් ලියන්න.

   III. (අ) බේකරි නිෂ්පාදන සඳහා උචිත නිෂ්පාදන ක්‍රමය නම් කරන්න.
   (ආ) ඉහත (අ) සඳහා ඔබ නම් කළ නිෂ්පාදන ක්‍රමයේ ඇති වාසි 03ක් සඳහන් කරන්න.

   IV. (අ) කම්හල් පිරියත සැලැස්මක අවශ්‍යතාව මගින් සේවකයන් කෙරෙහි ඇතිවන වාසිදායක තත්ත්ව හතරක් සඳහන් කරන්න.
   (ආ) ඇඟළුම් කර්මාන්ත ශාලාවක ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය අයිතම සඳහා නිදසුන් දෙක බැගින් ලියන්න.

   V. (අ) සමච්ඡේද ලක්ෂය යනු කුමක් ද?
   (ආ) සමච්ඡේද ලක්ෂය ඒකක සංඛ්‍යාව සොයාගැනීම සඳහා භාවිතා කරන සමීකරණය ලියා දක්වන්න.

2. ජපානයේ වර්ෂ 10ක් පමණ රැකියාවක නියුතුව සිට ලංකාවට පැමිණි අමිල ගනේමුල්ල ප්‍රදේශයේ නව නිවසක් ඉදිකර පදිංචියට යාමට අදහස් කරයි.

I. (I.I) (අ) මෙහිදී යොදා ගත හැකි නිෂ්පාදන ක්‍රමය නම් කරන්න.
(ආ) එම නිෂ්පාදන ක්‍රමය තෝරා ගැනීමට හේතු මොනවාද?
(I.II) (අ) මෙහිදී යොදා ගත හැකි කම්හල් පිරියත සැලැස්ම කුමක්ද?
(ආ) එම පිරියත තෝරා ගැනීමට හේතුව කුමක්ද?

II. (අ) ඉදිකිරීම් සමාගම නිවස ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගැනීමේ ක්‍රියාවලියේ පියවර නම් කරන්න.
(ආ) ඉදිකිරීම් සමාගම ඉහත මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී සැළකිල්ලක් දැක්විය යුතු කරුණු 04ක් නම් කරන්න.

3. (අ) කර්මාන්ත ශාලාවක තොග පාලනයක් පවත්වාගෙන යාමේ වැදගත්කම පෙන්වා දෙන්න.
(ආ) ගබඩාවේ තිබෙන තොග ශේෂ ඕනෑම අවස්ථාවකදී දැන ගැනීම සඳහා භාවිතා කරන තොග පාලන ක්‍රම හා මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.

4. ජයමල්ගේ ඇගළුම් කර්මාන්ත ශාලාවේ රෙදි තොග ප්‍රමාණවත් නොවීමේ අවස්ථා මාස කිහිපයක සිට ගැටලුවක් බවට පත්ව නිෂ්පාදන කටයුතුවලට බාධාවක්ව පවතී.
(අ) ඇඟලුම් ආයතනයේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පැවතිය යුතු යෝග්‍ය තොග මට්ටම කුමක්ද?
(ආ) රෙදි තොග ප්‍රමාණවත් නොවීමෙන් ඇඟලුම් ආයතනයට ඇති වූ අහිතකර ප්‍රතිඵල හතරක් ලියන්න.

5. (අ) ගැටලු සෙවීමට වඩා ගැටලු සිදුවීම වැළැක්වීම සඳහා අනුගමනය කරන තත්ත්ව පාලන ශිල්පීය ක්‍රමය කුමක්ද?
(ආ) මෙම ක්‍රමය සාර්ථකව පවත්වා ගැනීමට සිදු කරනු ලබන කාර්යයන් දෙකක් නම් කරන්න.

වාණිජ හා ව්‍යවසාය අධ්‍යයන ශාඛාව

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

14

## අලෙවිකරණය

**I කොටස**

1 සිට 9 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

1. ගැණුම්කරුවන් සිය පුද්ගල පරිභෝජනය හෝ කුටුම්භ පරිභෝජන භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම් කරන වෙළෙඳපොළ,
   (1) කාර්මික භාණ්ඩ වෙළෙඳපොළයි
   (2) පාරිභෝගික වෙළෙඳපොළයි
   (3) රජයේ වෙළෙඳපොළයි
   (4) නිෂ්පාදන වෙළෙඳපොළයි
   (5) සම්පත් වෙළෙඳපොළයි

2. පහත සඳහන් වන්නේ අලෙවිකරණය, **ව්‍යාපාරිකයන්ට, පාරිභෝගිකයන්ට හා ආර්ථිකයට** වැදගත් වන ආකාරයන්ය.
   A – නිෂ්පාදන විවිධාංගීකරණය ඇතිවීම
   B – ගනුදෙනුකරුවන් නිර්මාණය කිරීම හා ඔවුන් රඳවා ගැනීම
   C – ආයතනයේ සාර්ථකත්වය අත්කර ගැනීම
   D – වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු ලැබීමෙන් තමා දැනුම්වත් වීම
   E – නිෂ්පාදනය පුළුල්වීම
   F – තමා වියදම් කරන මුදලට සරිලන තෘප්තියක් ලැබීම

ඉහත පාර්ශව තුන සඳහා අනුපිළිවෙළින් මෙම ආකාරයන් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

| | ව්‍යාපාරිකයන්ට | පාරිභෝගිකයන්ට | ආර්ථිකයට |
|---|---|---|---|
| 1 | A,B | C,D | E,F |
| 2 | C,E | A,D | B,F |
| 3 | B,C | D,F | A,E |
| 4 | D,C | B,E | A,F |
| 5 | B,F | D,E | A,C |

3. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්ප හා ඒවාට අදාළ නිර්වචන පහත සඳහන් වේ. එම සංකල්ප නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| අංශය | නිර්වචනය |
|---|---|
| 1. සම්බන්ධතා අලෙවිකරණය | A. ව්‍යාපාර ආයතනයේ නියුක්ත සියලුම සේවකයින් ගනුදෙනුකරුට හොඳ සේවාවක් ලබාදීමට සක්‍රියව එකතුවීම. |
| 2. සමෝධානිත අලෙවිකරණය | B. අලෙවිකරණ මිශ්‍රයේ සියලුම විචල්‍යයන් ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වීම. |
| 3. අභ්‍යන්තර අලෙවිකරණය | C. අලෙවි වැඩසටහන් හා ක්‍රියාමාර්ග සැකසීමේදී සමාජ වගකීම් හා ආචාර ධර්ම පිළිබඳ අවධානය යොමු කිරීම. |
| 4. කාර්යසාධන අලෙවිකරණය | D. ව්‍යාපාරයේ සියලුම ඇල්මැති පාර්ශ්ව දීර්ඝකාලීනව දෙපාර්ශවයටම ඵලදායි සම්බන්ධතා ගොඩනැගීම. |

(1) 1-A, 2-B, 3-C, 4-D
(2) 1-B, 2-A, 3-D, 4-C
(3) 1-B, 2-D, 3-A, 4-C
(1) 1-D, 2-C, 3-A, 4-B
(2) 1-D, 2-B, 3-A, 4-C

4. ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියෙන් සේවා අලෙවිකරණ මිශ්‍රයේ සඳහන් විචල්‍යයන් ගණන වනුයේ,
(1) 4
(2) 3
(3) 5
(4) 6
(5) 7

5. සීමිත තරිඳු ව්‍යාපාරයේ නිෂ්පාදිත මිශ්‍රය පහත පරිදි වේ. එහි දිග හා පළල පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,

| | | | | |
|---|---|---|---|---|
| කිරි පැකට් | වැනිලා | චොකලට් | ස්ට්‍රෝබරි | |
| අයිස්ක්‍රීම් | වැනිලා | චොකලට් | බ්ලූබෙරි | හේසල්නට් |
| බීම | දොඩම් | අඹ | අන්නාසි | මිශ්‍ර පළතුරු |
| වතුර බෝතල් | 750ml | 500ml | 5l | 19l |

(1) 15, 60
(2) 12, 48
(3) 15, 4
(4) 12,4
(5) 4, 4

6. යම් නිෂ්පාදිතයන් සිය නිෂ්පාදිත ස්වකීය සන්නම යටතේ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම,
(1) ජාතික සන්නම වේ.
(2) භාණ්ඩ සන්නම වේ.
(3) නිෂ්පාදන සන්නම වේ.
(4) පෞද්ගලික සන්නම වේ.
(5) පවුල් සන්නම වේ.

7. ඇසුරුමක් සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) නිෂ්පාදිතයේ ස්වාභාවය, තාක්ෂණික යෝග්‍යතාව, ඇසුරුමේ අංග, අනතුරු ඇඟවීමේ සංඥා
   (2) ඇසුරුමෙන් නිෂ්පාදිතයාට ලැබෙන ප්‍රයෝජන, පාරිභෝගිකයාට ඇති පහසුව, මිල, ප්‍රමිති ලාංඡන
   (3) නිෂ්පාදිතයේ ස්වභාවය, තාක්ෂණික යෝග්‍යතාව, ඇසුරුමේ අංග, ඇසුරුමෙන් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රයෝජන
   (4) මිල, අඩංගු ද්‍රව්‍ය, නිෂ්පාදන දිනය, කල් ඉකුත්වීමේ දිනය
   (5) පාරිභෝගිකයාට ඇති පහසුව, මිල, ලේබලය, පිරිවැය

8. චතුර පැවසුවේ තම නිෂ්පාදිත සඳහා ඔහු තරඟකාරී මිලක් නියම කරන බවයි. මෙහි සඳහන් මිල කිරීමේ ක්‍රමයේ පරමාර්ථය වන්නේ පහත පිළිතුරු අතරින් කුමක්ද ?
   (1) වෙළෙඳපොළ තුළ රැඳී සිටීම
   (2) වර්තමාන ලාභ උපරිම කිරීම
   (3) වෙළෙඳපොළ කොටස උපරිම කිරීම
   (4) වෙළෙඳපොළ සාරය උරා ගැනීම
   (5) නිෂ්පාදිත ගුණත්ව නායකත්වය

9. ගනුදෙනුකරුවන් සමඟ මුහුණට මුහුණලා අදහස් හුවමාරු කර ගනිමින් මනා සම්බන්ධයක් ගොඩනගාගෙන භාණ්ඩ හා සේවා අලෙවිකරණ ප්‍රවර්ධන ක්‍රමය කුමක්ද?
   (1) ප්‍රචාරණය
   (2) විකුණුම් ප්‍රවර්ධනය
   (3) පෞද්ගලික විකුණුම්
   (4) මහජන සම්බන්ධතා
   (5) ඍජු අලෙවිකරණය

10. ව්‍යාපාරිකයන් විසින් ගනුදෙනුකරුවෙකුගේ ....................තෘප්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන වටිනාකම් සමූහය....................ලෙස හැඳින්වේ.

11. නිෂ්පාදන සංකල්පයේදී.................... යටතේ නිෂ්පාදකයින් කැමති භාණ්ඩ වෙළෙඳපොළ තුළ.................... කිරීම මඟින් නිෂ්පාදකයින්ට නිෂ්පාදිත සාර්ථකව අලෙවි කරගත හැක.

12. ....................ඉදිරිපත් කරන නිෂ්පාදිත පිළිබඳව නිෂ්පාදකයා තුළ හටගන්නා .................... කළහැකි ආකාරයේ ....................අදහසක් ලෙස දැක්විය හැකිය.

13. නිෂ්පාදිතයක ජීවන චක්‍රයේ පරිණත අදියරෙහි .................... හා .................... ස්ථාවර වේ.

14. ....................දරණ.................... යටතේ වෙළෙඳ ලකුණ ලියාපදිංචි කිරීම .................... දෙපාර්තමේන්තුවේදී කළ යුතුය.

15. .................... පෙළඹවීමකින් තොරව නිෂ්පාදිත අලෙවි කිරීමට නොහැකි බව .................... අලෙවිකරණ සංකල්පයේ මූලික හරය වේ.

16. නිෂ්පාදිතයක සමස්ත ඇගයීම සඳහා එම නිෂ්පාදිතයේ ...................., .................... හා .................... සැලකිල්ලට ගනු ලැබේ.

17. ව්‍යාපාර ආයතනයක් සිය ඉලක්ක වෙළෙඳපොළේ....................අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදාගනු ලබන උපකරණ සමූහය.................... ලෙස හැඳින්වේ.

18. සමස්ත වෙළෙඳපොළ තුල සිටින ................... යුක්ත ගනුදෙනුකරුවන් හඳුනාගෙන ඒ අතරිනුත් ආයතනයකට වඩාත් ................... ලෙස මෙන්ම ................... ව සේවය කළ හැකි වෙළෙඳපොළ කොටස ඉලක්ක වෙළෙඳපොළ ලෙස හැඳින්වේ.

19. නිෂ්පාදිතය ................... අවශ්‍ය තොරතුරු ඇසුරුමේ දැක්වීම හෝ පාරිභෝගිකයා ................... සඳහා ලේබලයක් නිර්මාණය කිරීම හා එයට අදාළ ක්‍රියාවලිය ලේබල්කරණය ලෙස හඳුන්වයි.

## II - කොටස

1. i. අලෙවිකරණය යනු පාරිභෝගිකයන්ගෙන් ආරම්භ වී පාරිභෝගිකයන්ගෙන් අවසන් වන ක්‍රියාවලියකි. පැහැදිලි කරන්න.
   ii. ඇමරිකානු වරලත් අලෙවිකරණ ආයතනයට අනුව අලෙවිකරණය නිර්වචනය කර ඇත්තේ කෙසේද?

2. i. නූතන ආර්ථිකය යටතේ භාවිතා වන මූලික වෙළෙඳපොළ වර්ග දෙකක් නම් කර, ඒවා රජයේ වෙළෙඳපොළ හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න.
   ii. ඉලක්ක වෙළෙඳපොළ හඳුන්වා, වෙළෙඳපොළ ඛණ්ඩනය ඒ සඳහා උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න.

3. i. ගෙවන ලද, අයිති කර ගන්නා ලද, උපයා ගන්නා ලද මාධ්‍ය පැහැදිලි කරන්න.
   ii.හුවමාරුව අර්ථ ගන්වා,හුවමාරුවක් සම්පූර්ණ වීමට අත්‍යාවශ්‍ය කොන්දේසි දෙකක් නම් කරන්න.

4. රොෂාන් උපන්දින කේක් නිර්මාණය කරයි. ඔහු ඉල්ලීම, රුචි අරුචිකම් හා පාරිභෝගිකයන්ගේ වයස අනුව උපන්දින කේක් හැඩ ගන්වයි. එමගින් පාරිභෝගිකයාගේ විශ්වාසය කැමැත්ත ලබා ගැනීමට අපේක්ෂා කරයි.
   i.රොෂාන් තම ව්‍යාපාර සංවර්ධනය සඳහා යොදාගෙන ඇති අලෙවිකරණ සංකල්පය හඳුනාගන්න.
   ii.ඔහු ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු මොනවාද?

5. i.සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ අරමුණ පැහැදිලි කරන්න.
   ii.එහි අංශ දෙකක් හඳුන්වන්න.

6. i. සඵලදායි වෙළෙඳපොළ ඛණ්ඩනයක් සඳහා තිබිය යුතු අවශ්‍යතාවන් හතරක් නම් කරන්න.
   ii. (අ) වෙළෙඳපොළ ස්ථාපිත කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
   (ආ) එමඟින් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
7. i. අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය රූපලාවන්‍ය සේවා සපයන ආයතනයක් සම්බන්ධයෙන් පැහැදිලි කරන්න.
   ii. විශේෂිත භාණ්ඩ හා සාප්පු භාණ්ඩ අතර සමානකම් දෙකක් නම් කරන්න.

8. නිෂ්පාදිත අතීතයේ වර්ග කරනු ලැබුවේ භාණ්ඩ හා සේවා ලෙසය. වර්තමානය ඊට අමතරව නිෂ්පාදිත ලෙස භාවිතා වන අංශ හතරක් විස්තර කරන්න.

9. පුටුවක් උදාහරණයට ගෙන පහත නිෂ්පාදිත මට්ටම් පැහැදිළි කරන්න.
   i.හර ප්‍රතිලාභය
   ii.අපේක්ෂිත නිෂ්පාදනය
   iii.වැඩිදියුණු කළ නිෂ්පාදිතය
   iv.විභව නිෂ්පාදිත

10. i. භාණ්ඩයක ජීවන චක්‍රය නැමැති සංකල්පය ගොඩ නැගීමේදී උපකාර කරගත් උපකල්පන දෙකක් ලියන්න.

   ii.භාණ්ඩයක ජීවන චක්‍රය තුළ පහත අදියරයන්හි දැකිය හැකි ලක්ෂණ දෙක බැගින් ලියන්න.
      (අ) හඳුන්වාදෙන අදියර
      (ආ) පරිණත අදියර

11. i. සන්නමක් යන්න නිර්වචනය කරන්න.
   ii.සන්නමක්, වෙළෙඳ ලකුණක් බවට පත් වන්නේ කෙසේද?

12. i.හොඳ සන්නමක පැවතිය යුතු ගුණාංග හතරක් නම් කරන්න.
   ii.සන්නමකින් නිෂ්පාදකයාට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.

13. i.ද්විතීක ඇසුරුමක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
   ii.ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු මොනවාද?

14. i.නිෂ්පාදිතයක මිල තීරණය කිරීම සඳහා සලකා බලන සාධක හතරක් නම් කරන්න.
   ii.නිෂ්පාදිත ගුණත්ව නායකත්වය යටතේ මිල තීරණය කරන්නේ කවර ආකාරයෙන්ද යන්න පැහැදිලි කරන්න.

15. i. බෙදාහැරීම වැදගත් වන ආකාර දෙකක් ලියන්න.
   ii.සේවා බෙදාහැරීමේ ශුන්‍ය හා ඒකීය මාර්ග ක්‍රම, උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

16. පහත සඳහන් සිද්ධීන්ට අදාළ ප්‍රවර්ධන ක්‍රමය නම් කරන්න.
   i. නිෂ්පාදකයකු නිවෙස්වලට මී කිරි අලෙවි කිරීම.
   ii. නිෂ්පාදිත ආයතනයක් තම නිෂ්පාදන කර්මාන්තශාලාව අසල තම වෙළෙඳසැලේ අලෙවි කිරීම.
   iii.කොවිඩ් මර්දනයට අදාල එන්නතක් පිළිබඳ විස්තර රූපවාහිනී මාධ්‍යයෙන් හඳුන්වාදීම
   iv. ප්‍රදේශයේ ඇති සමාගමක් පන්සලේ සණ්ඨාර කුළුණ සෑදීම

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා

15

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## මූල්‍ය කළමනාකරණය

**I කොටස**

1සිට 15 දක්වා වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. මූල්‍ය වෙළෙඳපොළේ සංයුතිය පහත දැක්වෙන වෙළෙඳපොළවලින් සමන්විත වේ.
   A. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
   B. සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ
   C. භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
   D. දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ
   E. කොටස් වෙළෙඳපොළ
   F. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

   ඉහත දැ ඇසුරෙන් මුදල් වෙළෙඳපොළට පමණක් අයත් කාණ්ඩය කුමක් ද?
   (1) A D E (2) B C D (3) A E F (4) A D F (5) C E F

2. මුදල් වෙළෙඳපොළේ හුවමාරුවන මූල්‍ය උපකරණ ඇතුලත් කාණ්ඩය තෝරන්න.
   (1) භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා, භාණ්ඩාගාර බැඳුම්කර, සාමාන්‍ය කොටස්
   (2) භාණ්ඩාගාර බැඳුම්කර, වරණීය කොටස්, වාණිජ පත්‍රිකා, ණයවර ලිපි
   (3) ණයවර ලිපි, විදේශ බැංකු අණකර, වාණිජ පත්‍රිකා, භාණ්ඩාගාර බිල්පත්
   (4) සාංගමික බැඳුම්කර, සාමාන්‍ය කොටස්, වරණීය කොටස්, ණයවර ලිපි
   (5) විදේශ බැංකු අණකර, වාණිජ පත්‍රිකා, වරණීය කොටස්, භාණ්ඩාගාර බැඳුම්කර

3. ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍යායතන වර්ග කර ඇති ආකාර හා ඊට අයත් ආයතන පහත වගුවෙන් දැක්වේ.

| මූල්‍ය | ආයතන |
|---|---|
| 1. බැංකු අංශය<br>2. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන<br>3. විශේෂිත මූල්‍ය ආයතන<br>4. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | A. සේවක අර්ථසාධක අරමුදල<br>B. ප්‍රාථමික අලෙවිකරුවෝ<br>C. බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>D. බලපත්‍රලාභී මුදල් සමාගම් |

ඉහත 1 - 4 දක්වා දී ඇති මූල්‍ය අනුව අනුපිළිවෙලින් ගලපා ඇති ආයතන සඳහන් වරණය තෝරන්න.
(1) C D B A (2) A D B C (3) B C DA (4) A C BD (5) B A D C

4. ගිවිසුම් ගත ඉතිරි කිරීමේ ආයතන පමණක් ඇති කාණ්ඩය තෝරන්න.
   (1) රක්ෂණ සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන්, කොටස් තැරැව්කාර ආයතන, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
   (2) සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, රක්ෂණ සමාගම්, අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල
   (3) ප්‍රාථමික අලෙවිකරුවෝ, රක්ෂණ සමාගම්, සේවක අරථසාධක අරමුදල, ණය ශ්‍රේණි ගත කිරීමේ ආයතන
   (4) රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්, ඒකක භාර, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන
   (5) රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කාර ආයතන, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල

5. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් ආයතන පමණක් අයත් නිවැරදි කාණ්ඩය තෝරන්න.
   (1) රක්ෂණ සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන්, කොටස් තැරැව්කාර ආයතන, බලපත්‍රලාභී වාණිජ බැංකු
   (2) බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, කල්බදු සමාගම්, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්,
   (3) බලපත්‍රලාභී වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක භාරකාර අරමුදල, බලපත්‍රලාභී විශේෂිත බැංකු
   (4) බලපත්‍රලාභී වාණිජ බැංකු, කල්බදු සමාගම්, බලපත්‍රලාභී මුදල් සමාගම්, බලත්‍රලාභී විශේෂිත බැංකු
   (5) සේවක අර්ථසාධක අරමුදල, බලපත්‍රලාභී මුදල් සමාගම්, කොටස් තැරැව්කාර සමාගම්, ඒකක භාර

6. පහත දැක්වෙන්නේ මූල්‍ය කළමනාකරණයට අදාළ ආයෝජන තීරණ හා මූල්‍යන තීරණ සමහරකි.
   A. ව්‍යාපාර පුළුල් කිරීමේ තීරණ
   B. ණයගැතියන් පිළිබඳ තීරණ
   C. වෙළෙඳ ණයහිමියන් පිළිබඳ තීරණ
   D. බැංකු අයිරා පිළිබඳ තීරණ
   E. වෙළෙඳ තොග පිළිබඳ තීරණ
   F. ලාභාංශ පිළිබඳ තීරණ

   මේවා අතුරෙන් මූල්‍ය කළමනාකරණට අදාළ මූල්‍යන තීරණ පමණක් දැක්වෙන කාණ්ඩය තෝරන්න.
   (1) A, B, C (2) B, C, D (3) C, D, E (4) C, D, F (5) D, E, F

7. පහත සඳහන් මූල්‍ය කළමනාකරණ තීරණ අතුරෙන් ආයෝජන තීරණ ලෙස සැලකෙනුයේ කුමක්ද ?
   (1) ලාභ රඳවා ගැනීම පිළිබඳ තීරණ
   (2) බැංකු ණය ලබාගැනීම පිළිබඳ තීරණ
   (3) වෙළෙඳ ණයගැතියන් පිළිබඳ තීරණ
   (4) කොටස් නිකුත් කිරීම් පිළිබඳ තීරණ
   (5) වෙළෙඳ ණයහිමියන් පිළිබඳ තීරණ

8. ව්‍යාපාරයකට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය තීරණය කිරීම කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,

(1) ව්‍යාපාරයේ පරිමාවයි
(2) රඳවාගතයුතු තොග මට්ටමයි
(3) ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාවයි
(4) ව්‍යාපාරය යොදා ගන්නා තාක්ෂණයයි
(5) ව්‍යාපාරය විසින් රජයට ගෙවිය යුතු බදු ප්‍රමාණයයි

9. 2022.03.31 දිනට X ව්‍යාපාරයේ ශේෂ පත්‍රයෙන් උපුටාගත් දත්ත සමූහයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| බඩු තොගය | රු. 6 000 | බැංකු අයිරාව | රු. 3 000 |
| ණයගැතියෝ | රු. 8 000 | කලින් ලැබූ ආදායම | රු. 1 000 |
| ගෙවියයුතු බදු | රු. 2 000 | වෙළෙඳ ණය හිමියෝ | රු. 3 000 |

මෙම ව්‍යාපාරයේ ශුද්ධ කාරක ප්‍රාග්ධනය වනුයේ,

(1) රු. 1 500 (2) රු. 9 000 (3) රු. 8 000 (4) රු. 7 000 (5) රු. 5 000

10. පහත වගුවේ X තීරුවේ මූලික මූල්‍ය සම්පාදන මාර්ගද Y තීරුවේ ඒවාට සම්බන්ධ නිදසුන් ද දැක්වේ. X, Y ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වනුයේ,

| X | Y |
|---|---|
| A – ඍජු මාර්ග<br>B – වක්‍ර මාර්ග | 1. බැංකු අයිරාව<br>2. කොටස් නිකුතුව<br>3. රඳවාගත් ලාභ<br>4. කල්බදු |

(1) A – 1 හා 4, B – 2 හා 3
(2) A – 1 හා 2, B – 3 හා 4
(3) A – 2 හා 4, B – 1 හා 3
(4) A – 2 හා 3, B – 1 හා 4
(5) A – 3 හා 4, B – 1 හා 2

11. යම් කාල පරිච්ඡේදයකට අදාළව ව්‍යාපාර ආයතනයක වාර්තාවලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| මුළු විකුණුම් | රු. 72 000 |
| විකුණුම් පිරිවැය | රු. 60 000 |
| ආරම්භක තොගය | රු. 10 000 |
| අවසාන තොගය | රු. 14 000 |

මෙම ආයතනයේ තොග පිරිවැටුම් අනුපාතය වනුයේ,

(1) 6 යි. (2) 5 යි. (3) 4 යි. (4) 3 යි. (5) 1 යි.

12. සීමාසහිත ABC සමාගමේ 2022.03.31 දින ශේෂ පත්‍රයෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2022.03.31 දිනට | තොගය | 30 000 |
| | ණයගැතියෝ | 20 000 |
| | ණයහිමියෝ | 17 000 |
| | බැංකු ණය | 20 000 |
| | ගෙවිය යුතු බිල් | 6 000 |
| | මුදල් ශේෂය | 20 000 |

ඉහත තොරතුරු අනුව ABC සමාගමේ ශුද්ධ කාරක ප්‍රාග්ධනය හා දළ කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) රු. 27 000, 70 000
(2) රු. 27 000, 50 000
(3) රු. 43 000, 70 000
(4) රු. 70 000, 43 000
(5) රු. 70 000, 27 000

13. පහත දැක්වෙන කාණ්ඩ අතුරෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ උප වෙළෙඳපොළවල් පමණක් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) කොටස් වෙළෙඳපොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ, දේශීය හා විදේශීය වෙළෙඳපොළ
(2) භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ, සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ, කොටස් වෙළෙඳපොළ
(3) භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ, වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
(4) භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ, සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ, වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
(5) භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ, භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ, සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ

14. ද්විතියික කොටස් වෙළෙඳපොළට අයත් වන්නේ,

(1) මූලික ප්‍රසිද්ධ කොටස් නිකුතුවට අදාළ කටයුතුය.
(2) පරිණත කොටස් නිකුතුවට අදාළ කටයුතුය.
(3) මූලික ප්‍රසිද්ධ කොටස් නිකුතුවට හා පරිණත කොටස් නිකුතුවට අදාළ කටයුතුය.
(4) ලැයිස්තුගත සමාගමක් මඟින් සිදු කරන ප්‍රසිද්ධ කොටස් නිකුතුවට අදාළ කටයුතුය.
(5) ආයෝජකයන් එකිනෙකා අතර කොටස් ගනුදෙනු කර ගැනීමට අදාළ කටයුතුය.

15. කොළඹ කොටස් හුවමාරුවේ මූලික කාර්යභාරය වන්නේ,

(1) ප්‍රාථමික වෙළෙඳපොළ කටයුතුය.
(2) ද්විතියික වෙළෙඳපොළ කටයුතුය.
(3) ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපොළ කටයුතුය.
(4) මූලික ප්‍රසිද්ධ කොටස් නිකුතුවට අදාළ කටයුතුය.
(5) සියලුම පොදු සමාගම්වල කොටස් නිකුතුවට අදාළ කටයුතුය.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

**ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

16. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළෙඳපොළ අයිතිය ..................... සතුවන අතර, එහි කටයුතු අධීක්ෂණය හා නියාමනය කරනු ලබන්නේ ..................... විසින්ය.

17. කොළඹ කොටස් වෙළෙඳපොළේ සමාගම් ලේඛනගත කිරීම සඳහා ක්‍රියාත්මක වන පුවරු දෙක..................... හා ..................... වේ.

18. ලැයිස්තුගත සමාගමක් විසින් නිකුත් කර ඇති කොටස්වල වෙළෙඳපොළ අගය සමාගමේ ..................... ලෙස හැඳින්වේ.

19. එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන අරමුදල්..................... වන අතර, ව්‍යාපාරය ආරම්භ කිරීමේදී මෙන්ම කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ ස්ථිර වත්කම් අත්පත් කර ගැනීමට අවශ්‍ය වන අරමුදල් ..................... වේ.

20. සමස්තයක් වශයෙන් කොටස් මිල ගණන් ඉහළ යන අවස්ථාවක් ..................... වෙළෙඳපොළ වන අතර, සමස්තයක් වශයෙන් මිල ගණන් පහළ බසින අවස්ථාවක් ..................... වෙළෙඳපොළ වේ.

## II කොටස

1. (අ) "ලාභය" (Profit) සහ "ලාභදායිත්වය" (Profitability) අතර වෙනස පැහැදිලි කරන්න.
   (ආ) සීමාසහිත XY පොදු සමාගමේ මූල්‍ය සම්පාදන මාර්ග ලැයිස්තුවක් පහත දැක්වේ.

| | |
|---|---|
| I. සාමාන්‍ය කොටස් | II. කල්බදු |
| III. රඳවාගත් ලාභ | IV. වාණිජ පත්‍රිකා |
| V. බැංකු ණය | VI. අතිරික්ත වත්කම් විකිණීම |
| VII. සමුච්චිත ක්ෂය වෙන් කිරීම් | VIII. බැංකු අයිරා |
| IX. වරණීය කොටස් | X. සාංගමික ණයකර |

ඉහත මූල්‍ය සම්පාදන මාර්ග පහත ශීර්ෂ යටතේ වෙන් වෙන්ව ලියා දක්වන්න.
(අ) ඍජු මූල්‍ය මාර්ග (ඇ) අභ්‍යන්තර මූල්‍ය මාර්ග
(ආ) වක්‍ර මූල්‍ය මාර්ග (ඉ) බාහිර මූල්‍ය මාර්ග

2. "ද්‍රවශීලතාව (Liquidity) සහ ලාභදායකත්වය(Profitability) එකිනෙකට වෙනස් අරමුණු දෙකකි." පැහැදිලි කරන්න.

3. මූල්‍ය මාර්ගයක් ලෙස ණය සාධ්‍යකරණය (Debit Factoring) යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

4. සීමිත අප්සරා සමාගමේ වාර්ෂික තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | රු. 800 000 |
| 20% ණයකර | රු. 125 000 |
| වරණීය කොටස් ප්‍රාග්ධනය | රු. 75 000 |
| රඳවාගත් ලාභය | රු. 200 000 |

I. ඉහත ආයතනයේ ප්‍රාග්ධන තෝලන අනුපාතය ගණනය කරන්න.
II. එය කුමන තෝලන තත්ත්වයක් පෙන්නුම් කරන්නේද?
III. මෙම අනුපාතය ඇසුරෙන් ඔබට අප්සරා සමාගමේ ප්‍රාග්ධන තෝලන තත්ත්වය පිළිබඳව කුමක් කිව හැකිද?

5. (අ) ආයෝජන කළඹ කළමනාකාරිත්වය යනුවෙන් කුමක් අදහස්වේද?
(ආ) කොටස් වෙළෙඳපොළේ ආයෝජනයේ අවධානම පාලනය කිරීම සඳහා ආයෝජකයෙකුට අනුගමනය කලහැකි ක්‍රියාමාර්ග මොනවාද?
(ඇ) රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කිරීමෙන් ආයෝජකයෙකු හට ඇතිවන වාසි හතරක් දක්වන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන සම්බාව

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

16

## මානව සම්පත් කළමනාකරණය

**I කොටස**

1 සිට 11 දක්වා වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවරක් නොවන්නේ,
   1) මානව සම්පත් සැපයුම තක්සේරු කිරීම.
   2) අනාගත මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීම.
   3) ආයතනයේ පරමාර්ථ තීරණය කිරීම.
   4) මානව සම්පත් ඉල්ලුම හා සැපයුම සංසන්දනය කිරීම.
   5) මානව සම්පත් සැලසුම්කරණ ප්‍රයත්නය ඇගයීම හා වැඩිදියුණු කිරීම.

2. ආයතනයකට සේවකයන් ආකර්ෂණය කර ගන්නා ක්‍රම කිහිපයක් පහත දැක්වේ.
   A. රැකියා දැන්වීම් පළ කිරීම මගින්
   B. අතීත සේවකයන් මගින්
   C. රැකියා පොළ මගින්
   D. කුසලතා ලේඛන මගින්
   E. අභ්‍යන්තර ජාලය මගින්

   ඉහත ආකර්ෂණ ක්‍රම අතුරින් අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම පමණක් ඇතුලත් පිළිතුරු වරණය වන්නේ,
   (1) ABC
   (2) ABD
   (3) ADE
   (4) BCD
   (5) BDE

3. රැකියා විස්තරයක හා පිරිවිතරයක දැකිය හැකි පොදු තොරතුරකි.
   (1) සුදුසුකම
   (2) වගකීම
   (3) කාර්යභාරය
   (4) තනතුරු නාමය
   (5) විශ්‍රාම දිනය

4. විධායක නිලධාරියෙකු වර්තමාන ශ්‍රේණියෙන් ඉහළ ශ්‍රේණියට උසස් කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සඳහා බොහෝවිට සලකා බලන්නේ,
   (1) සේවා කාලය
   (2) තවදුරටත් සේවය කළ හැකි කාලය
   (3) පරිවාසගත සේවා කාලය
   (4) තනතුරු නාමය
   (5) වැටුප් පරිමාණය

5. පහත දැක්වෙන්නේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි. මේවා අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) අනුස්ථාපනය යනු සංකල්පීය කුසලතා ලබාදීමයි.
   (2) සංවර්ධනය යනු සේවක යෝග්‍යතාවය අධ්‍යයනය කිරීමයි.
   (3) රැකියා පිරිවිතරය යනු සේවකයාට වැඩ පරිසරය හඳුන්වා දීමයි.
   (4) අතිකාල සේවය යනු සේවකයෙකු වැඩ කළ යුතු අනිවාර්‍ය සේවා කාලයයි.
   (5) පරිවාස සේවා කාලය යනු සේවකයෙකු රැකියාවේ ස්ථිර කිරීමට පෙර සේවා කාලයයි.

6. මානව සම්පත සඳහා ඉල්ලුම පුරෝකතනය කිරීමේ දී සැලැකිල්ලට ගනු ලබන සාධක පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
   (1) රැකියා පිරිවිතරය/විශ්‍රාම යාම /ඉවත්වීම/නිෂ්පාදන ක්‍රමය
   (2) ආයතනයේ පරමාර්ථ/නිෂ්පාදන සඳහා ඉල්ලුම/විශ්‍රාම යාම/නිෂ්පාදන ක්‍රමය
   (3) ආකර්ෂණය හා තෝරාගැනීම/බඳවාගැනීම/ඉවත්ව යාම/විශ්‍රාම යාම
   (4) රැකියා පිරිවිතරය/රැකියා විස්තරය/තාක්ෂණය තෝරා ගැනීම/බඳවා ගැනීම
   (5) නිෂ්පාදන ක්‍රමය/නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම/බඳවා ගැනීම/පුහුණුව හා සංවර්ධනය

7. වෘත්තීමය තනතුරකට බඳවා ගත් නව සේවකයෙකු තනතුරේ ස්ථිර කිරීමට පෙර සේවා කළ යුතු පරිච්ඡේදය හඳුන්වන්නේ කුමක් ලෙසද?
   (1) ආධුනිකත්ව කාලය
   (2) සමාකරණ කාලය
   (3) පුහුණු කාලය
   (4) කොන්ත්‍රාත් පදනම කාලය
   (5) පරිවාස කාලය

8. පුහුණුව හා සංවර්ධනය මගින් සේවකයාට අත්වන ප්‍රතිලාභ වන්නේ
   (1) සේවක පක්ෂපාතිත්වය ඉහළ යෑම.
   (2) ප්‍රවාසිතාව අඩුවීම.
   (3) උසස් වීම් ලැබීමේ ඉඩකඩ පුළුල් වීම.
   (4) සේවක පිරිවැටුම අඩුවීම.
   (5) නිමවුමේ ගුණත්වය ඉහළයෑම.

9. පත්වීම් ලිපියක වැදගත්කම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය තෝරන්න.
    (1) ආයතනයේ සහ සේවකයා අතර බැඳීම දක්වන ප්‍රකාශයක් වීම.
    (2) ආයතනය හා සේවකයා නෛතිකව බැඳී ඇති ගිවිසුමක් නොවීම.
    (3) දෙපාර්ශවය අතර රැකියාවේ කටයුතු, රාජකාරි, වගකීම් හා කොන්දේසි ඇතුලත් වී තිබීම.
    (4) සිය රැකියාවේ රාජකාරි වගකීම් හා කටයුතු පිළිබඳව රජය දැනුවත් වීම.
    (5) සේවකයාගේ සේවය ස්ථිර බව දැක්වෙන ලියවිල්ලක් වීම.

10. ශ්‍රම පිරිවැටුම යන්න වඩාත් හොඳින් අර්ථ දක්වා ඇත්තේ.
    (1) යම් කාල පරිච්ඡේදයක් තුළ ආයතනයක සේවක යෙදවුම් හා නිමවුම් අතර සම්බන්ධතාවයි.
    (2) යම් කාලයක් තුළ සේවකයන් ආයතනයෙන් ඉවත්වයාමේ ශීඝ්‍රතාවයයි.
    (3) සේවකයන් ආයතනයට නොපැමිණීම සහ සේවයට පැමිණ සේවයක් නොසැපයීම නිසා ආයතනයකට සේවය අහිමිව යාමයි.
    (4) වැඩවර්ජන සේවකයන්ගේ රාජකාරි වෘත්තීය සමිති සඳහා දායක නොවන සේවකයින් යොදාගෙන ආවරණය කිරීමයි.
    (5) සේවක ඉපයීම් පහළ යාම හෝ වැටුප්,වෙනත් දීමනා නොලැබී යාමයි.

11. මානව සම්පත් කළමනාකරුවෙකු නාම සැලසුම්කරණ කාර්යයයේ දී අනුගමනය කළ යුතු ප්‍රථම පියවර කුමක් ද?
    (1) අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීමක් පලකිරීම
    (2) රැකියා විස්තරය රැකියා පිළිවිතරය සකස් කිරීම.
    (3) සේවක සැපයුම සේවක ඉල්ලුම ඇස්තමේන්තු කිරීම.
    (4) අයදුම්කරුවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම.
    (5) වඩාත් සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීම.

ප්‍රශ්න අංක 12 සිට 20 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.

12. අදාළ රැකියාවේ කාර්යභාරය වගකීම් සහ සේවා කොන්දේසි..........................අදාළ වේ. රැකියාව කරනු ලබන සේවකයා සතු විය යුතු මූලික සුදුසුකම්.................................. දැක්වේ.

13. රැකියාවේ අරමුණු ..................................දැක්වෙන අතර සේවකයා සතුවිය යුතු කායික සුදුසුකම්, පළපුරුද්ද හා අධ්‍යාපන සුදුසුකම් ..........................................දැක්වේ.

14. රැකියාවේ................................යනු සේවකයෙකු කළමනාකරුවෙකු බවට උසස් කිරීමට අවස්ථාව උදා කිරීම හෙවත් ...................................අනාගත තත්ත්වය දියුණු කිරීමයි.

15. කිසියම් ශිල්පීය වෘත්තියක් සඳහා බඳවාගත් සේවකයෙකු ගතකළ යුතු පුහුණු කාලය .......................... වන අතර අලුතින් බඳවාගත් සේවකයෙකුට තමා කායීක්ෂම සඵලදායක සේවකයෙක් බව ආයතනයට ඔප්පු කිරීමට ගත වන කාලය .................වේ.

16. සේවකයෙකු උසස් කිරීමේ දී ..............................වෘත්තිය සුදුසුකම් හා ..............................යන සාධක සලකා බලයි.

17. මානව සම්පත් කළමනාකරණය සාර්ථකත්වය ඇගයීමට ..........................................සේවක ප්‍රවාසිතාව..........................යන නිර්ණායක අදාල වේ.

18. ව්‍යාපාර ආයතනයක ........................................................................ ගණනය කිරීම සඳහා ......................................... හා සේවකයින් වැඩ කිරීමට නියමිතව තිබූ දින ගණන යොදා ගැනේ.

19. සේවකයන්ගේ ආරවුලක් ඇති වූ විට ඒ සඳහා .................... ගන්නා විවිධ ක්‍රියාමාර්ග .................................... ලෙස හැඳින්වේ.

20. සංවිධිත ආයතනයක්.......................................................නීතිරීති පද්ධතියක් පිළිබඳව සැලකිල්ලක් දක්වන අතර එය ...........................................ලෙස හඳුන්වයි.

## II කොටස

01. මානව සම්පත තුළ අන්තර්ගත අද්විතීය ලක්ෂණ මොනවා ද?
02. මානව සම්පත මනා ලෙස හැසිරවීමේ අරමුණු මොනවාද?
03. මානව සම්පත කළමනාකරණයේ වැදගත්කම පෙන්වා දෙන්න.
04. මානව සම්පත් කළමනාකරණයට අයත් කාර්යයන් නම් කරන්න.
05. රැකියා නිර්මාණය හඳුන්වා රැකියා නිර්මාණයේ මූලිකාංග සඳහන් කරන්න.
06. රැකියා පිරිවිතරය හා රැකියා විස්තරය හඳුන්වා එහි ඇතුලත් කරුණු දෙක බැගින් දක්වන්න.
07. මානව සම්පත සැලසුම්කරණයේ පියවරයන් අනුපිළිවෙලින් ලියා දක්වන්න.
08. මානව සම්පත ඉල්ලුමට බලපාන සාධක මොනවාද ? මානව සම්පත සැපයුම තක්සේරු කරන සාධක මොනවාද?
09. සේවකයන් අතිරික්තයක් පවතින විට හා හිඟයක් පවතින විට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?
10. සේවකයන් ආකර්ෂණය යන්න හඳුන්වා ආකර්ෂණ ක්‍රියාවලියේ පියවර දක්වන්න.
11. ආයතනයකට සේවකයන් ආකර්ෂණය කළ හැකි ප්‍රධාන ක්‍රම මොනවාද?
12. ව්‍යාපාර විසින් සේවකයන් ආකර්ෂණයේ දී බාහිර ආකර්ෂණ මාර්ග ලෙස යොදා ගන්නා දෑ මොනවාද?
13. ආයතනයක් තුළ අභ්‍යන්තර ආකර්ෂණ මාර්ග හඳුන්වන්න.
    කුසලතා ඉන්වෙන්ට්‍රිය හා අනුප්‍රාප්තික සටහන අතර වෙනස ලියා දක්වන්න.
14. ආයතනයක් සේවක පුරප්පාඩු සඳහා අභ්‍යන්තරයෙන් බඳවා ගැනීමක් හෝ බාහිරින් බඳවා ගැනීමක් සිදු කරන විට සැලසෙන වාසි අවාසි දෙක බැගින් ලියා දක්වන්න.
15. සංවිධානයක නිවැරදි සේවකයන් තෝරාගැනීමට නොහැකි වුවහොත් මතුවන අහිතකර ප්‍රතිවිපාක සඳහන් කරන්න.
16. ජීව දත්ත විස්තරයක(CV) අනිවාර්යෙන් ම ඇතුලත් විය යුතු ශීර්ෂ මොනවාද?

17. සම්මුඛ පරීක්ෂණයක් සඵලදායි ලෙස පැවැත්වීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අවධාරණය කල යුතු වැදගත් උපදෙස් මොනවාද?
18. ඔබ සම්මුඛ පරීක්ෂණයකට සහභාගිවන්නේ යැයි සිතන්න.ඔබ අනුගමනය කළයුතු කරුණු මොනවාද?
19. සේවකයින් තෝරාගැනීමේ ක්‍රමයක් ලෙස සම්මුඛ පරීක්ෂණ ක්‍රමයේ වාසි අවාසි මොනවාද?
20. රැකියාවකට සේවකයන් බඳවා ගන්නා පදනම් දෙක දක්වන්න.
21. පත්වීම් ලිපියක අඩංගු වියයුතු කරුණු හතරක් දක්වන්න.
22. රැකියාලාභියෙකුට පත්වීම් ලිපියක ඇති වැදගත්කම කුමක්ද?
23. පරිවාස කාලය,අනුස්ථාපනය කෙටියෙන් හඳුන්වන්න.
24. අනුස්ථාපනය මගින් සේවකයෙකුට ලබාදීමට බලාපොරොත්තු වන දෑ මොනවාද?
25. කාර්යඵල ඇගයීමේ ප්‍රයෝජන / අරමුණු මොනවාද?
26. කාර්යඵල ඇගයීම අසාර්ථක වීමට හේතු විය හැකි කරුණු මොනවාද?

"සේවකයන් සේවා ව්‍යුක්ත කිරීමේ දී පුහුණුව හා සංවර්ධනය වැදගත් කටයුත්තකි."

27. පුහුණුව හා සංවර්ධනය අර්ථ දක්වන්න. එහි අවශ්‍යතාවය පෙන්වන්න.
28. රැකියාව තුළින් පුහුණුවේ වාසි සහ රැකියාවෙන් බැහැරව පුහුණුවේ වාසි වෙන වෙනම දක්වන්න.

"පුද්ගලයෙකු සිය වෘත්තීය ජීවිතය කළමනාකරණය සේවකයාට පමණක් නොවේ ඔහු සේවා සපයන ආයතනයටද එකසේ ප්‍රයෝජනවත් වේ. "

29. වෘත්තීය ජීවිතය සේවකයාට හා ආයතනයට ඇති වැදගත්කම වෙන වෙන ම ලියා දක්වන්න.
30. සේවක චලන හෙවත් වෙනස් කිරීම් වලට උදාහරණ සපයන්න.
31. සේවකයෙකු උසස් කිරීමේ දී සලකා බැලිය යුතු නිර්ණයන් මොනවාද?
32. සේවකයෙකු ඉවත් කිරීමට ආයතනයකට සිදුවිය හැකි අවස්ථා මොනවාද?
33. සංවේතන කළමනාකරණය යන්න හඳුන්වා සංවේතන කළමනාකරණයේ වැදගත්කම පහදන්න.
34. සේවක වැටුප තීරණය කිරීමේදී සලකා බලන සාධක මොනවාද?
35. සංවිධානයක් සාධාරණ වැටුපක් නොගෙවන විටක මුහුණු පාන ගැටළු මොනවාද?
36. පුහුණුව හා සංවර්ධනය අතර වෙනස්කම් දක්වන්න.

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

17

## තොරතුරු පද්ධති

**I කොටස**

1 සිට 16 දක්වා වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

1. දත්ත සැකසීමේ තාක්ෂණයට අදාළ නොවන පිළිතුර කුමක්ද?
   (1) හස්ත ක්‍රමය
   (2) අර්ධ හස්ත ක්‍රමය
   (3) අන්තර්ජාල ක්‍රමය
   (4) විද්‍යුත් යාන්ත්‍රික ක්‍රමය
   (5) විද්‍යුත් දත්ත සැකසීම

2. මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්ට සැලසුම් තීරණ ගැනීම, නියාමනය හා පාලනය සඳහා සහාය වන තොරතුරු පද්ධතිය තෝරන්න.
   (1) තීරණ උපකාරක පද්ධති DSS
   (2) විධායක උපකාරක පද්ධති ESS
   (3) දැනුම් කාර්ය පද්ධති KWS
   (4) කළමනාකරණ තොරුතුරු පද්ධති MIS
   (5) ගනුදෙනු සැකසුම් පද්ධති BIS

3. පහත දැක්වෙන්නේ තොරතුරු වර්ගීකරණය සිදු කරන ආකාර කිහිපයකි. X තීරුවෙන් තොරතුරු වර්ග කිරීමේ නිර්ණායකයද Y තීරුවෙන් තොරතුරු වර්ගද දක්වා ඇත.

| X | Y |
|---|---|
| A ස්වාභාවය අනුව | 1. උපක්‍රමික, උපායමාර්ගිත, මෙහෙයුම් |
| B මූලාශ්‍රය අනුව | 2. බාහිර, අභ්‍යන්තර, මූලික, ද්විතියික |
| C කළමනාකරණ මට්ටම අනුව | 3. මූල්‍ය, මෙහෙයුම්, අලෙවිකරණ, මානව සම්පත් |
| D කළමනාකරණ ශ්‍රිත අනුව | 4. ප්‍රමාණාත්මක, ගුණාත්මක |

ඉහත X හා Y තීරුව නිවැරදි ගලපා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) A 2, B 3, C 1, D4
(2) A 4, B 3, C 2, D 1
(3) A 2, B 1, C 4, D 4
(4) A 3, B 2, C 1, D 2
(5) A 4, B 2, C 1, D 3

4. පරිගණක ආධාරක නිර්මාණකරණය (මෝස්තරකරණය) CAD සඳහා උපකාරවන තොරතුරු පද්ධති වර්ගය තෝරන්න.
   (1) දැනුම් කාර්ය පද්ධති
   (2) ගනුදෙනු සැකසුම් පද්ධති
   (3) කාර්ය ස්වයංකරණ පද්ධති
   (4) තීරණ උපකරණ පද්ධති
   (5) විධායක උපකාරක පද්ධති

5. ජාලමය පරිගණක තොරතුරු වර්ග කිරීම, නැවත ලබාගැනීම, පිළියෙල කිරීම සඳහා වූ ලෝක සම්මත ප්‍රමිතිය යටතේ වූ පද්ධතිය වනුයේ,

   (1) විද්‍යුත් තැපැල
   (2) ලෝක ව්‍යාප්ත ජාල පහසුකම්
   (3) ගොනු හුවමාරු නියමාවලිය
   (4) කථන පහසුකම්
   (5) අන්තර්ජාලය

6. ලෝක ව්‍යාප්ති ජාල පහසුකම් මඟින් වෙබ් අඩවි සොයාගැනීම පිණිස උපකාරී වන සෙවුම් යන්ත්‍රවලට උදාහරණ ලෙස,
   (1) Yahoo, Google's, MSN - Bing
   (2) MSN, yahoo, Netscape
   (3) Yahoo, Netscape, InDesign
   (4) InDesign, Internet explorer, Netscape
   (5) MSN – Bing, illustrator, yahoo

7. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) මොනිටරය දෘඪාංගයකි.
   (2) පරිගණක ඉන්ජිනේරුවරයා ස්ථිරාංගයකි.
   (3) වෙබ් අඩවි ජීවාංගයකි.
   (4) මධ්‍ය සැකසුම් පද්ධතිය දත්තයකි.
   (5) දත්ත පුවරුව මෘදුකාංගයකි.

8. වගුවේ තොරතුරු පද්ධති වර්ගය හා ඒවාට අදාළ උදාහරණ දක්වා ඇත.

| තොරතුරු පද්ධති වර්ග | උදාහරණ |
|---|---|
| 1. විධායක උපකාරක පද්ධති | A. පුරෝකථන වාර්තා ලබාදීම |
| 2. තීරණ උපකාරක පද්ධති | B. දෛනික තොග වාර්තා ලබාදීම |
| 3. කළමනාකරණ තොරතුරු පද්ධති | C. විද්‍යුත් තැපැල් පහසුකම් ලබාදීම |
| 4. කාර්යාල ස්වයංකරණ පද්ධති | D. වැටුප් වාර්තා සැකසීම |
| 5. ගනුදෙනු සැකසුම් පද්ධති | E. ආයෝජන ඇගයීම් සඳහා තොරතුරු ලබාදීම |

ඉහත දී ඇති තොරතුරු පද්ධති වර්ග අනු පිළිවෙල අනුව උදාහරණ නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

(1) 1E ,2D,3C,4B,5A
(2) 1A,2B,3C,4D,5E
(3) 1B,2A,3C,4E,5D
(4) 1A,2E,3B,4C,5D
(5) 1A,2C,3B,4D,5E

9. විධායක උපකාරක පද්ධතිය ශක්තිමත් කරන පද්ධතියකි.
(1) ව්‍යාපාර බුද්ධි තොරතුරු පද්ධති
(2) තීරණ උපකරණ පද්ධති
(3) ගනුදෙනු සැකසුම් පද්ධති
(4) දැනුම් කාර්ය පද්ධති
(5) කළමනාකරණ තොරතුරු පද්ධති

10. එක් ස්ථානයක ඇති පරිගණකයක් මඟින් අන්තර්ජාලයට සම්බන්ධ වී තවත් ස්ථානයක ඇති පරිගණකයක් භාවිත කිරීමට පහසුකම් සැලසීම හඳුන්වන්නේ කුමක් ලෙසද ?
(1) ලෝක ව්‍යාප්ත ජාල පහසුකම්
(2) ටෙලි පරිගණක සේවාව
(3) ගොනු හුවමාරු නියමාවලිය
(4) කථන පහසුකම්
(5) විද්‍යුත් තැපැල් සේවාව

11. පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක අඩංගු ප්‍රධාන උපාංග ඇතුළත් වරණය වන්නේ,
(1) දෘඪාංග, මෘදුකාංග, තොරතුරු
(2) ස්ථිරාංග, ක්‍රියාපටිපාටි, නීතිරීති
(3) දත්ත, තොරතුරු, විද්‍යුත්
(4) ස්ථිරාංග, ජීවාංග, දෘඪාංග
(5) ක්‍රියාපටිපාටි, දෘඪාංග, සම්මුති

ප්‍රශ්න අංක 12 සිට 16 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

12. (අ) සන්නිවේදන සම්බන්ධකයක් (Link) හරහා පරිගණකයකින් ...................පණිවිඩ හුවමාරු කරගැනීම…....................වේ
(ආ) අදහස් ටයිප් කර අනෙක් පාර්ශ්වයට යැවීම ...................නම් වන අතර, වාචිකව අදහස් හුවමාරු කර ගැනීම .................. නම් වේ.

13. (අ) තොරතුරු පිටපත් කිරීම, බෙදා හැරීම සිදුකරන්නන් ...................සේවකයෝ වන අතර, නීතිඥවරුන්, ඉංජිනේරුවන්, විගණකවරුන්................... සේවකයින් වේ.
(ආ) ආයෝජන ඇගයීම් තීරණ ................... තීරණ වන අතර, ආර්ථික ඇණවුම් ප්‍රමාණය සමීකරණය අනුව ගණනය කිරීම ................... තීරණ නම් වේ.

14. (අ) ආයතනයක ලිපි සකස් කිරීම සඳහා .................. පද්ධති අවශ්‍ය වේ.
(ආ) ගනුදෙනු සැකසුම් පද්ධතියක ද්‍රව්‍ය මිලට ගැනීම .................. අංශයෙන් හා සේවක පැමිණීමේ වාර්තා සැකසීම.................. අංශයෙන් සිදුකරයි.

15. (අ) දත්ත ක්‍රම ලෙස සැලකෙන භාණ්ඩවල ඡායාරූප ............................දත්ත වන අතර පටිගත කරන ලද පාරිභෝගික අදහස් .................. දත්ත නම් වේ.
(ආ) තොරතුරු පද්ධතියේ කාර්ය හා උපාංග පාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති ...................නීතිරීති හා ....................ක්‍රියාපටිපාටි නමින් හැඳින්වේ.

16. (අ) තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම ..................නම් වන අතර, සකසන ලද දත්ත අදාළ පාර්ශ්වයන්ට ලබාදීම..................නම් වේ.
(ආ) වාචිකව අදහස් හුවමාරු කර ගැනීම.........................කථන නම් වන අතර අදහස් ටයිප් කර අනෙක් පාර්ශ්වයකට යැවීම ...................කථන නම් වේ.

ප්‍රශ්න 17 සිට 21 දක්වා ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

17. තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ 4 ක් දක්වන්න.
18. ආයතනයක කාර්ය පහසු කරලීමට අන්තර්ජාලය යොදාගත හැකි අවස්ථා 4 ක් දක්වන්න.
19. දෛනික කටයුතු සඳහා පුද්ගලයෙකුට අන්තර්ජාලය භාවිතයේ වාසි 4ක් නම් කරන්න.
20. Social Media (සමාජ ජාල) නම් කරන්න.
21. ගනුදෙනු සැකසීමේ පද්ධති වලට අදාළ පහත අංශ වලට උදාහරණය බැගින් නම් කරන්න.

| අංශය | උදා:- |
|---|---|
| 1. නිෂ්පාදන අංශය | 1.................................... |
| 2. අලෙවිකරණ අංශය | 2.................................... |
| 3. මූල්‍ය අංශය | 3.................................... |
| 4. මානව සම්පත් අංශය | 4.................................... |

## II කොටස

1. පසුගිය වාර විභාගයේදී ව්‍යාපාර අධ්‍යයන විෂය සඳහා සිසුන් ලබාගත් ලකුණු පදනම් කරගෙන පන්තිභාර ගුරුභවතා විසින් ලකුණු විශ්ලේෂණය කරන ලදී.
I. ඉහත සිද්ධියට අනුව දත්ත හා තොරතුරු අතර වෙනස ලියා දක්වන්න.
II. මෙහි සඳහන් දත්ත ක්‍රමය උදාහරණ සහිතව ලියන්න.

2. පහත තොරතුරුවලට අදාළ දත්ත ක්‍රම ලියා දක්වන්න.
I. මිල ගණන් දැක්වෙන නාම පුවරු
II. පටිගත කළ කොරෝනා රෝගය සම්බන්ධ වෛද්‍යවරුන්ගේ අදහස්
III. වර්තමාන මැනිං වෙළෙඳපොළේ එළවළු මිල ගණන්
IV. භාණ්ඩවල ඡායාරූප

3. I. දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් 4 ක් පිළිවෙළින් නම් කර කෙටියෙන් විස්තර කරන්න.
II. සන්නිවේදන තාක්ෂණය ගත්විට දත්ත සැකසීමේ තාක්ෂණයේ විකාශන අවස්ථා 4 නම් කර කෙටියෙන් හඳුන්වන්න.

4. පහත දත්ත සැකසීමේ උපකරණ අයත් වන දත්ත සැකසීමේ තාක්ෂණය නම් කරන්න.
   I. පරිගණකය
   II. විද්‍යුත් යතුරු ලියනය
   III. පෑන්, පැන්සල්, කඩදාසි, ලිපි ද්‍රව්‍ය
   IV. යතුරු ලියනය

5. Covid 19 වසංගතයට අදාළව රජය විසින් මහජනතාව වෙත පිළිපැදිය යුතු නීති රීති මාලාවක් ගැසට් පත්‍රිකාවක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. එම ගැසට් පත්‍රිකාවේ ඇතුළත් විය යුතු හොඳ තොරතුරක ලක්ෂණ 6 ක් නම් කරන්න.

6. MAL ඇඟළුම් කර්මාන්ත ශාලාවේ සේවක වැටුප් සඳහා පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යයි.
   I. ඉහත සිද්ධිය තුළින් එම ආයතනයට තොරතුරු පද්ධතිය ඇසුරෙන් ලබාගතහැකි තොරතුරු ලැයිස්තුවක් ලියන්න.
   II. දත්ත සැකසුම් ක්‍රියාවලිය මගින් ලැබෙන ප්‍රතිදාන ( Out put) ගබඩා කළ හැකි ක්‍රම 3 ක් ලියන්න.
   III. අදාළ ආයතනයේ තොරතුරු පද්ධතියෙන් කුමන කාර්යභාරයක් ඉටුකර ගනු ලබන්නේදැයි පැහැදිලි කරන්න.
   IV. සේවක වැටුප් සඳහා තොරතුරු පද්ධතියේ අවශ්‍යතාව හා වැදගත්කම කරුණු 2 ක් තුළින් ලියා දක්වන්න.

7. දත්ත තොරතුරු බවට පත් කිරීමේ මූලිකාංග නම් කර කෙටියෙන් විස්තර කරන්න.

8. පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක පහත උපාංගවලට අදාළව උදාහරණ ලියා දක්වන්න.
   I. Hard ware
   II. Soft ware
   III. Live ware
   IV. Firm ware

9. පහත සඳහන් ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.

තොරතුරු පද්ධති වර්ග

- භාවිතා කරන මට්ටම අනුව
  1. උපක්‍රමික මට්ටම
  2. 
  3. 
- භාවිතයට අනුව
  1. 
  2. තීරණ උපකාරක පද්ධති
  3. 
  4. 
  5. 
  6. ගනුදෙනු සැකසුම් පද්ධති
- කළමනාකරණ ශ්‍රිත අනුව
  1. මෙහෙයුම්
  2. අලෙවි
  3. මූල්‍ය
  4. 
  5. 

10. I. උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති භාවිතා කරන පුද්ගලයින් නම් කර එම පද්ධති භාවිත කරනුයේ කුමක් සඳහා ද යන්න ලියා දක්වන්න.
 II. දැනුම් සේවකයින් හා දත්ත සේවකයින් වර්ග දෙකට අදාළ උදාහරණ ලියා ඔවුන් තොරතුරු පද්ධති යොදාගනු ලබන්නේ කවර කාර්යයන් සඳහාදැයි ලියා දක්වන්න.
 III. විකුණුම්, මුදල් ලැබීම්, වැටුප් ලේඛන, ද්‍රව්‍ය මිලදී ගැනීම වැනි ගනුදෙනු සඳහා භාවිතා වන තොරතුරු පද්ධති කුමක්ද ?


11. පහත සඳහන් උපකාරක පද්ධති හඳුන්වන්න.
 I. විධායක උපකාරක පද්ධති ESS
 II. තීරණ උපකාරක පද්ධති DSS
 III. කළමනාකරණ උපකාරක පද්ධති MIS
 IV. කාර්යාල ස්වයංකරණ පද්ධති OAS

12. පරිගණක ආධාරක නිර්මාණකරණය CAD භාවිතා කරනුයේ කුමන පද්ධතියේද?

13. නිෂ්පාදන අංශය, අලෙවිකරණ අංශය, මානව සම්පත් අංශය, මූල්‍ය අංශය යන ආයතනයක එක් එක් අංශ වෙනුවෙන් සැකසූ තොරතුරු පද්ධතිය කුමක්ද?

14. ව්‍යාපාර බුද්ධි තොරතුරු පද්ධති BIS කුමන අංශවලින් සමන්විත වේද?

15. කළමනාකරණ මට්ටම අනුව වර්ග කළ තොරතුරු හා භාවිතය අනුව වර්ග කළ තොරතුරු පද්ධතිවල අන්තර් සබඳතාව පහත ගැලීම් සටහන තුළින් පෙන්වා දිය හැක. එහි ඉංග්‍රීසි අක්ෂර තුළින් කියවෙන තොරතුරු පද්ධතිය ලියා දක්වන්න.




16. කළමනාකරණ ශ්‍රිත අනුව තොරතුරු පද්ධති වර්ග කර දක්වන්න. ඒවාට අදාළ නිදසුන්ද ගැලීම් සටහන් මඟින් දක්වන්න.

17. I. තොරතුරු තාක්ෂණය යනු කුමක්ද?
 II. තොරතුරු තාක්ෂණයට අදාළ ක්ෂේත්‍ර 3 නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.
 III. වර්තමාන ලෝකයේ තොරතුරු තාක්ෂණයේ අවශ්‍යතාව වැඩිවෙමින් පවතී. ආයතනයකට තොරතුරු තාක්ෂණයෙන් ලබාගත හැකි වාසි 4 ක් විස්තර කරන්න.
 IV. Online Bank භාවිතය මගින් ගිණුම් හිමියෙකුට ඉටුකරගත හැකි සේවා 3ක් ලියා දක්වන්න


18. ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාර කටයුතු අන්තර්ජාලය භාවිත කරමින් සිදු කරයි. මෙතුලින් ඔහුගේ ආයතන කටයුතු පහසු කරගත හැකි ආකාර 4 ක් විස්තර කරන්න.

19. GPS තාක්ෂණයෙන් ආරක්ෂක අංශවලට ලබාගත හැකි වාසි මොනවාද?


20. යෝගට් නිෂ්පාදන ආයතනයකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ICT භාවිතයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ 4 ක් දක්වන්න.

21. පහත රූප සටහන් මඟින් නිරූපණය කෙරෙන පරිගණක ජාල නම් කරන්න.


I.




II.



III.



IV.



22. රාජ්‍ය ආරක්ෂක අංශයට තොරතුරු පද්ධති ආරක්ෂා කර ගැනීමට භාවිත කළ හැකි ආරක්ෂිත ක්‍රම 4 ක් නම් කරන්න.

23. අන්තර්ජාලය මඟින් සැපයෙන සේවා නම් කරන්න.

24. විද්‍යුත් තැපැල භාවිතය සාමාන්‍ය තැපැල අතර ඇති වෙනස්කම් ලියන්න.

25. පහත කරුණු කෙටියෙන් විස්තර කරන්න.

Voice chatting
Text chatting
Video chatting

26. ගොනු හුවමාරු නියමාවලිය තුළින් සිදු කරගත හැකි සේවා මොනවාද?

27. පරිගණක ජාලයක් යන්න නම් කර LAN හා WAN යන්න කෙටියෙන් හඳුන්වන්න.

28. ගෝලීයකරණයත් සමඟ ලොව මුහුණ දී ඇති වසංගත තත්ත්වය තුළ මංගත online අධ්‍යාපනය සඳහා අන්තර්ජාලය යොදා ගැනීම තුළ ලබාගත හැකි ප්‍රයෝජන මොනවාද?

29. ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉදිරි පිම්මක් තැබීමට අන්තර්ජාලයට යොදා ගැනීම තුළ ලබාගත හැකි ප්‍රයෝජන මොනවාද?

30. සමාජ ජාල (Social Network) ව්‍යාපාර වර්ධනය සඳහා යොදාගත හැකි අකාර කෙටියෙන් නම් කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ව්‍යාපාර අධ්‍යයනය

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

18

## ව්‍යාපාර සැලසුම්

1 සිට 10 දක්වා වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න

01. ව්‍යාපාරයක පරමාර්ථ හා අරමුණු ද ඒවා ළගාකර ගන්නා ආකාරයද ඇතුළත්ව සකස් කරන ලියවිල්ල වන්නේ,
   (1) ව්‍යාපාර විධායක සාරාංශයයි.
   (2) ව්‍යාපාර විස්තරයයි.
   (3) වාර්ෂික සැලැස්මයි.
   (4) ව්‍යාපාර සැලැස්මයි.
   (5) අළෙවිකරණ සැලැස්මයි.

02. ව්‍යාපාර සැලැස්මක සූක්ෂම සාධක ඇගයීමේ දී,
   (1) අභ්‍යන්තර පරිසර සාධක විශ්ලේෂණය කරයි.
   (2) බාහිර පරිසර සාධක විශ්ලේෂණය කරයි.
   (3) අභ්‍යන්තර හා ආසන්න පරිසර සාධක විශ්ලේෂණය කරයි.
   (4) ආසන්න පරිසර සාධක විශ්ලේෂණය කරයි.
   (5) අභ්‍යන්තර බාහිර සහ ආසන්න පරිසර සාධක විශ්ලේෂණය කරයි.

03. ව්‍යාපාරය කුමක් ද යන්න සහ එයින් සපයන භාණ්ඩ හෝ සේවාව පිළිබඳව විස්තර කරන්නේ,
   (1) ව්‍යාපාර විස්තරය මගිනි.
   (2) අලෙවි සැලැස්ම මගිනි.
   (3) මෙහෙයුම් සැලැස්ම මගිනි.
   (4) විධායක සාරාංශ මගිනි.
   (5) ව්‍යාපාර සැලැස්ම මගිනි.

04. යෝජිත අලෙවි උපාය මාර්ගයක ඇතුලත් විය යුතු තොරතුරක් නොවන්නේ,
   (1) නිෂ්පාදිත උපාය මාර්ග
   (2) මිල උපාය මාර්ග
   (3) බෙදාහැරීමේ උපාය මාර්ග
   (4) ප්‍රවර්ධන උපාය මාර්ග
   (5) සේවක ආකර්ෂණ උපාය මාර්ග

05. ව්‍යාපාර සැලැස්මක මූලිකාංග අතරට අයත් නොවන අංගයක් වන්නේ,
   (1) ව්‍යාපාර විස්තරයයි
   (2) අලෙවි සැලැස්මයි.
   (3) වෙළෙඳපොළ විශ්ලේශනයයි.
   (4) විධායක සාරාංශයයි.
   (5) මූල්‍ය සැලැස්මයි.

06. ව්‍යාපාර සැලැස්මක් පිළියෙළ කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු පමණක් ඇතුලත් වන්නේ,
   (1) පැහැදිලි වීම,මූල්‍ය සම්පත්,ගනුදෙනුකරුවන්, ඉලක්ක
   (2) පැහැදිලි වීම,තාත්වික වීම,ඉලක්කගත වීම,ගනුදෙනුකරුවන්
   (3) සම්පූර්ණත්වය,අවශ්‍ය මූල්‍ය සම්පත්,ඉලක්ක, සරළ වීම.
   (4) අවශ්‍ය මූල්‍ය සම්පත්,ඉලක්ක,සරළ බව,ගනුදෙනුකරුවන්
   (5) ගනුදෙනුකරුවන්,තරඟකරුවන්,සැපයුම්කරුවන්, සේවකයන්.

07. ව්‍යාපාරයක ඉලක්ක වෙළෙඳපොළ පිළිබඳව ඉදිරිපත් කළ යුතු තොරතුරක් නොවන්නේ,
   (1) ඉලක්ක වෙළෙඳපොළ කවරේද?
   (2) ඉලක්ක වෙළෙඳපොළේ මූලික ප්‍රවණතා හා අපේක්ෂිත වෙනස්කම්.
   (3) ඉලක්ක වෙළෙඳපොළකට ලඟාවීමේ උපාය මාර්ග.
   (4) ඉලක්ක වෙළෙඳපොළ භාණ්ඩවල සුවිශේෂ ලක්ෂණ
   (5) පවත්නා තරඟකාරිත්වය

08. වාර්ෂික විකුණුම් පුරෝකථනයේ දී ඇතුලත් කළ යුතු තොරතුරක් නොවන්නේ,
   (1) පවත්නා තරඟකාරිත්වය
   (2) නිෂ්පාදිත වර්ගය
   (3) විකුණුම් ප්‍රමාණය
   (4) ඒකකයක මිල
   (5) වාර්ෂික ආදායම

09. මානව සම්පත් සැලැස්මක ඇතුලත් විය යුතු කරුණක් වන්නේ,
   (1) තරඟකරුවන්ගේ ශක්තීන්
   (2) සැපයුම්කරුවන් සමඟ කේවල කිරීමේ හැකියාව
   (3) රැකියා වෙළෙඳපොළ සැපයුම
   (4) සංවිධාන සටහන
   (5) ගනුදෙනුකරුවන් පිළිබඳ විස්තර

10. මූල්‍ය සැලැස්මක ඇතුලත් කරුණක් නොවන්නේ,
   (1) ප්‍රාග්ධන අවශ්‍යතාවය
   (2) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය
   (3) ඒකකයක විකුණුම් මිල
   (4) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
   (5) ණය ආපසු ගෙවීමේ සටහන

සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

11. පුද්ගලයෙක් හෝ සංවිධානයක හෝ අවශ්‍යතාවයක් හෝ වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳව ව්‍යවසායකයෙකු තුළ ඇතිවන සිතිවිල්ල ..................................ලෙස හැඳින්වෙන අතර එය............................හා.......................විශ්ලේෂණය මගින් ව්‍යාපාර.......................බවට පත් කළ හැකිය.

12. .................................................. යනු ව්‍යාපාරයක බාහිර පරිසර සාධක ඇගයීමට ලක් කිරීමයි. එයින් වඩාත් හොඳ ව්‍යාපාර අදහස තෝරාගැනීමට.......................................කට භාජනය කළ යුතුය.

13. a. ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරන්නේ, ව්‍යාපාරයක්........................ , ............................ දී හා ව්‍යාපාරයක් ...............................දීය.
 b. ව්‍යාපාර සැලැස්මක් යනු ව්‍යාපාරයක.........................හා .......................... දී ඒවා ළඟා කර ගන්නා ක්‍රමෝපායන්ද විස්තර කරන ලේඛනයකි.

14. a. වෙළෙඳපොළ............................,අලෙවි උපායමාර්ග ..................................ආදී තොරතුරු ඉදිරිපත් කරන්නේ අලෙවිකරණ සැලැස්ම මගිනි.
 b. ව්‍යාපාරයක...............................ගත ..................................ඇතුලත් වන කොටස මූල්‍ය සැලැස්මයි.

15. ව්‍යාපාර සැලැස්මක ඇතුලත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස................................වේ.

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

16. ව්‍යාපාර සැලැස්ම අවසානයේ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කල යුතු තොරතුරු හතරක් සඳහන් කරන්න.
17. ව්‍යාපාරයක් අලෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදනය පිළිබඳව තොරතුරු හතරක් සඳහන් කරන්න.
18. මෙහෙයුම් සැලැස්ම ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.
19. මානව සම්පත් සැලැස්මක් ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.
20. ව්‍යාපාර සැලැස්මක් ව්‍යාපාරයකට වැදගත්වීමට හේතු හතරක් සඳහන් කරන්න.

21. ඇඹිලිපිටිය නගරය යාබදව පිහිටි විජේසූරිය වත්ත නමින් හැඳින් වූ අක්කර 10 ක ඉඩම විජේසූරිය මහතාගේ පුත් සංජය විසින් දේපළ වෙළෙඳාම් සමාගමකට ඉහළ මිලකට අලෙවි කළේ මීට මාස 03 කට පමණ පෙරය. දේපළ වෙළෙඳ සමාගම එම දේපළ කොටස් කර ගැණුම්කරුවන්ට අලෙවි කළ අතර දැන් එහි නිවාස කිහිපයක් ඉදිකිරීමට සූදානම් වෙති. ඉඩම අසල කුඩා හාඩ්වෙයාර් ආයතනයක් පවත්වාගෙන ගිය සාගර මහතා මෙම නිවාස ව්‍යාපෘතියට අලෙවි කිරීමට ගඩොල් සෑදීමේ ව්‍යාපෘතියක් ආරම්භකිරීමට අදහස් කරයි. මෙහිදී ඔහුගේ ආයතනයේ දැනට සේවය කරන රාජාට ගඩොල් සෑදීමේ හැකියාවක් පවතින බව සාගර මහතා දනී. එසේම දැනට තමා සතු ඉතුරුම් මේ සඳහා ආයෝජනය කිරීමට ඔහු අදහස් කරයි.

I. ඉහත සිද්ධිය ඇසුරින් පිළිතුරු සොයන්න.
 අ. මෙහි සඳහන් ව්‍යාපාර අදහස පැහැදිලි කරන්න.
 ආ. ප්‍රධාන නිෂ්පාදන සාධක එම ව්‍යාපාර අදහසට අනුව හඳුනාගන්න.
II. ව්‍යාපාර සැලැස්ම යනු කුමක් ද? එය පිළියෙළ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?
III. අ. ඉහත සිද්ධිය ආශ්‍රයන් එම ව්‍යාපාරයේ සූක්ෂම පරිසර සාධක හඳුනාගන්න.
 ආ. එම සාධක වල ශක්තීන් එක බැගින් සඳහන් කරන්න.
IV. සූක්ෂම පරිසර අධ්‍යයනය හා සාර්ව පරිසර අධ්‍යයනය අතර වෙනස්කම් ඉහත සිද්ධිය ඇසුරින් පැහැදිලි කරන්න.
V. සාගරට ඔහුගේ ව්‍යාපාර සඳහා, ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව